

# සන්නිවේදකයා

THE COMMUNICATOR

විශ්ව මානව හිමිකම් දිනය

විශේෂ කලාපය

2000 දෙසැම්බර් 10

## අදට පමණක් නොවෙයි


## හැමදාටම - මානව හිමිකම්

Scanned with CamScanner

සන්නිවේදකයා

THE COMMUNICATOR

විශ්ව මානව හිමිකම් දිනය
විශේෂ කලාපය
2000 දෙසැම්බර් 10




3 මානව අයිතිවාසිකම් පිළිබඳ සටහනක්

8 බුද්ධිමය දේපල පනත හා නිර්මාණකරුවාගේ අයිතිය






12 ජනමාධ්‍ය නිදහස හා වගකීම

16 කාන්තා අයිතිවාසිකම්, සමානාත්මතාවය හා ජනමාධ්‍ය

22 සාපරාධී ක්‍රියා, අපහාස නීතිය හා අධිකරණ අපහසුකීම්

24 ජනමාධ්‍ය නිදහස පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

27 මානව හිමිකම් රාමුව තුළ ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හා ජනවාර්ගික ගැටළුව



29 ඇගේ ඡන්දයෙන් අපේ ජීවිත වෙනස් වුනා

33 සක්‍රිය සිවිල් සමාජයක් සඳහා ජනමාධ්‍යයේ කාර්යභාරය





36 මානව හිමිකම් හා එහි නෛතික ව්‍යුහය

39 අවදානම සුළු නැත ජීවිතයට වඩා




මානව හිමිකම් පිළිබඳ මූලික අවබෝධයවත් අපගේ සමාජය තුළ පැතිර ඇතිදැයි සැක සහිතය. මෙරට ජීවත්වන සාම්ප්‍රදායික ජනයා, සදාචාරයක, සංස්කෘතියක, ධර්මතා සමූහයක පාවල් ස්වකීය මානව හිමිකම් අහිමි කරගෙන සිටී. එබැවින් එකී අවබෝධය පුළුල් කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් පවතී. එබැවින් මෙවර සන්නිවේදකයා ඒ වෙනුවෙන් වෙන්කිරීමට අපි අදහස් කළෙමු.

මෙහි එන ලිපිවලින් බොහොමයක් දේශන ඇසුරෙන් සකස් කරගන්නා ලද ඒවාය.

තවමත් වැඩවසම් වහල් චින්තනයක ගෙවෙන ජනමනස, මානව හිමිකම් හඳුනාගන්නේ නම් අප දැනට විශ්වාස කරන ප්‍රජාතන්ත්‍රවාදය ද හඳුනාගන්නා වන්නේය.

සංස්කාරක


සන්නිවේදකයා
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
දුරකථනය: 917713


ISSN - 1391 - 314 x

ප්‍රධාන සංස්කාරක
ආරියරත්න ඇතුගල

සහාය සංස්කරණය
ජානක හොලෙවිරත්න
සුගත් මහින්ද
අරුණ ලොකුලියන
විජයානන්ද රූපසිංහ

පරිගණක පිටු සැකසුම හා මුද්‍රණය
ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්
ප්‍රයිවට් ලිමිටඩ්. (687870)

අනුග්‍රහය
ජාතික ඒකාබද්ධතා
වැඩසටහන් ඒකකය (NIPU)



Scanned with CamScanner

# මානව අයිතිවාසිකම් පිළිබඳ සටහනක්



"මානව හිමිකම් ලංකාවේ සහ ලෝකයේ අනෙක් රටවල විශේෂ අවශ්‍යතාවක් ඇතිව ඉදිරියට යන ප්‍රශ්නයකි. මෙයට හේතුව දැනට දශක දෙකක්, දෙක හමාරක් පමණ කාලයක සිට මිනිසුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වීමේ ප්‍රවණතාව දිනෙන් දින වැඩි වී තිබීමයි. මානව හිමිකම් පිළිබඳ නීතිමය මෙන් ම විශාල සමාජමය පාර්ශවයක් ද ඇත.

අද මෙම මානව හිමිකම් උල්ලංඝනය වීම මේ රටේ සිටින ඕනෑම පුද්ගලයකුට ඕනෑම අවස්ථාවක සිදු විය හැකි ය. මීට දශකයකට හෝ දශක එක හමාරකට හෝ පෙර, යාපනයේ හෝ මඩකලපුවේ හෝ වෙනත් යම් කිසි ප්‍රදේශයක හෝ මානව හිමිකම් උල්ලංඝනය වෙන අවස්ථාවක, 'ඒක වෙන පැත්තක වෙන්නේ, ඒ පැත්තේ තිබුණට අපිට ප්‍රශ්නයක් නැයි අපි සිතුවෙමු. එහෙත් අද මෙය උග්‍ර ප්‍රශ්නයක් වී ඇත. මෙය මගහැරිය හැකි ප්‍රශ්නයක් නොවේ. ඕනෑ ම තැනක, ඕනෑ ම වෙලාවක, ඕනෑ ම කෙනෙකුට මේ මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවිය හැකි ය යන්න අද හැම දෙනෙකු ම පිළිගෙන තිබේ.

මානව අයිතිවාසිකම් හා ජනමාධ්‍ය නීතිය පිළිබඳ සංකල්පය පැන නැඟුණේ පුද්ගලයාගේ ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ නීතියෙහි දැක්වෙන කරුණු පදනම් කොට ගෙනයි. මෙම සංකල්පය විධිමත් ව ඇතුළත් කරුණු ලැබුවේ 1976 දී අමෙරිකා එක්සත් ජනපදයේ නිදහස පිළිබඳ ප්‍රකාශනයෙනි. මෙහි කතුවරයා වූයේ 'තෝමස් ජෙපර්සන් ය. ඔහු අමෙරිකාවේ ප්‍රථම රාජ්‍ය ලේකම් මෙන් ම තුන් වැනි ජනාධිපති ලෙසට ද කටයුතු කර ඇත. 1789 දී ප්‍රංශ ජාතික සංගමය මගින් නිදහස් ප්‍රකාශනයේ එන කරුණු පුරවැසියා පිළිබඳ අවධානයෙන් යොද ගනු ලැබ තිබේ. 1789 වර්ෂය ලෝක ඉතිහාසට ඉතා වැදගත් වර්ෂයකි. ප්‍රංශ විප්ලවය සිදුවූයේ එම වර්ෂයේ දී ය. ලිඛිත ව්‍යාවස්ථාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණු අඩංගුව තිබුණත් ඒවායෙහි නීතිමය පදනමක් දක්නට නොලැබුණි. එබැවින් 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විශ්ව මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයේ දී එය විධිමත් ව යොද ගත් අතර, 1953 දී 'යුරෝපීය ගිවිසුම මගින් මෙය පිළිගනු ලැබී ය. යුරෝපීය අධිකරණය පිහිටුවන ලද්දේ මෙම සංකල්පීය රාමුව තුළයි.

මෙම මාතෘකාවට කොටස් දෙකක් ඇතුළත් වේ. එනම් මානව හිමිකම් සහ ජන මාධ්‍ය නීතිය යනුවෙනි. ජනමාධ්‍ය නීතිය නිශ්චිත වශයෙන් සඳහන් කළ නොහැකි අංශයකි. මෙය ක්‍රමයෙන් විවිධ අංශවලින් සංවර්ධනය වූ සංකල්ප මාලාවක් පමණි. ජනමාධ්‍ය නීතිය කුමක් ද කිය යමකු ප්‍රශ්න කළ හොත් ඊට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කළ හැකි, ඊටම වෙන් වූ නීතියක් නොමැත. නොයෙක් නොයෙක් අංශවලින් ජනමාධ්‍ය පාලනය වන සහ ඊට රුකුල් දෙන නීති තිබේ. ඒවා අපි ජනමාධ්‍ය නීතිය වශයෙන් හඳුන්වන්නෙමු. ජනමාධ්‍ය සංවිධානය කිරීමට, පාලනය කිරීමට, ඊට ආධාර කිරීමට සහ ඊට රුකුල් දීමට නීති තිබේ. ඒවා සියල්ල එකතු කර ගත්විට සාමාන්‍යයෙන් මාධ්‍ය නීතිය කියා හැඳින්විය හැකිය.

මානව හිමිකම් පිළිබඳ එක්සත් නැති නම් මූලික අයිතිවාසිකම් පිළිබඳ කවුරුත් කතා කරති. මෙහි සංවර්ධනය

ගැන අවබෝධයක් ඇත්නම් අපිට මේ නීතියේ ඇති සීමාවන් පිළිබඳ ව වැඩිදුරට අවබෝධ කර ගැනීමට හැකි ය. හිමිකම් කියන අදහස් ගොඩනැගුණේ බටහිර සමාජයේ ය. අපේ සමාජයේ එවැනි දෙයක් නොතිබුණි. අපේ සමාජයේ පාලන ක්‍රමය බටහිර සමාජයේ බිහි වූ පාලන ක්‍රමයට වඩා සම්පූර්ණ වෙනස් දෙයකි. අපේ රජවරු පූර්ව බලැති රජවරු නොවේ. සමකය ආශ්‍රිත සමාජ දියුණු වූයේ ග්‍රාමීය මට්ටමෙනි. රජවරු ග්‍රාමීය ජීවිතයට සහභාගී නොවූහ. සමකයට ආසන්න රටවල එනම් ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි රටවල මෙන් රජුගෙන් පටන් ගෙන පහළට එන සමාජයක් අපට නොතිබුණි. අපට තිබුණේ ගමෙන් පටන් ගෙන ඉහළට යන සමාජයකි. ඒ නිසා මානව හිමිකම් කියන එක මේ රටවල සංවර්ධනය වූ සංකල්පයක් නොවේ. මෙය බටහිර රටවල සංවර්ධනය වූ සංකල්පයකි.

බටහිර ලෝකයේ මානව හිමිකම් පිළිබඳ සංකල්පය සංවර්ධනය වූයේ ඇයි? බටහිර ලෝකයේ තිබූ ග්‍රීක, රෝම ශිෂ්ටාචාර අධිරාජ්‍යවාදය මහ රාජ්‍යයන් බිඳ හෙළී ය. ඉන් පසු ඇති වූයේ යුරෝපයේ අඳුරු යුගයයි. ඉන් අනතුරුව නූතන යුගයයි. පහළොස් වැනි ශත වර්ෂය වන විට අධිරාජ්‍ය නොව 'රාජ්‍යයන්' බිහි විය. රජු යටතේ සංවිධානය වූ රටවල් (National States) ය. මේවා අපේ සමකයට ආශ්‍රිත රටවල සංවර්ධනයට වඩා සම්පූර්ණයෙන් වෙනස් වේ. ආර්ය සමාජය බිහි වුණේ ග්‍රාමීය මට්ටමිනි. අවුරුදු 2000, 3000 ට එහා ආවේණික ගති ගුණ ඒවායෙහි තිබේ.

නූතන යුගයට එන විට මේ 'රාජ්‍ය' බටහිර ලෝකයේ තිබුණි. සංවිධානය වූයේ රජ කෙනෙකු යටතේය. රජතුමාට බලය ලැබී ඇත්තේ කෙසේද ? රජතුමාට ලැබී ඇත්තේ දිව්‍යමය බලයක් ය යනුවෙන් සියල්ලෝ ම සිතූහ. රජතුමා ක්‍රියාකරන්නේ දෙවියන් වහන්සේගෙන් ලැබුණු බලයකින් බව සඳහන් කරමින් 'ජෝන් කොඩැක්' නැමැති චින්තකයා 1576 දී පොතක් ප්‍රසිද්ධ කළේය. රජුට තිබෙන බලය දෙවියන්ගෙන් ලැබුණු පූර්ණ බලයක් ලෙස ඔහු විසින් හඳුන්වන ලදී. එනම් පූර්ණ බලය රජුගේ බලයයි. රජුගේ බලය මානව අයිතියයි. එයට හේතුව, දෙවියන්ගෙන් වරමක් අනුව රජු රට පාලනය කිරීමයි.

එසේ ම 1651 පළ කරන ලද Popsගේ ග්‍රන්ථයේ රජුගේ පූර්ණ බලය "Majestats" කියන ශීර්ෂය යටතේ සඳහන් කරන ලදී. එසේම රජයේ බලය දිව්‍යමය වරයක් ලෙස ද සලකන ලදී. එකල චින්තකයෝ ද මෙය සනාථ කළහ. මෙම මතය බොහෝ දුරට සාවද්‍ය බව වැඩි දුරට කල්පනා කිරීමේ දී චින්තකයෝ වටහා ගත්හ.

දෙවියන්ගේ වරමක් එක්කෙනෙකුට පමණක් ලැබෙන්නේ කෙසේද ? ජෝන් ලොක් 1690 දී 'සිවිල් ආණ්ඩුව' (Civil Government) නමැති ඔහුගේ ග්‍රන්ථයෙන් ඉදිරිපත් කළ අදහස නම්, රජකු පාලන බලය ගෙන යන්නේ ජනතාවත් රාජ්‍යයත් අතර ඇති ගිවිසුමක් මත බවයි. රූසෝ වැනි චින්තකයෝ ඒ අදහස කෙළින්ම ඉදිරිපත් කළහ. සමාජ ගිවිසුම Social Contract යන අදහස යටතේ රජුට තියෙන්නේ දෙවියන්ගෙන් ලැබුණු බලයක් නොව ජනතාවගෙන් ම ලැබුණු බලයක් බව ඔහු



විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ක්‍රමයෙන් රජුගේ බලය සීමා වීමට පටන් ගැනිණ. ජනතාවගේ බලය තහවුරු වීමටද පටන් ගැනිණ. මානව අයිතිවාසිකම් වර්ධනය වුණේ එතැන් සිටය. රජුට පාලනය කිරීම සඳහා ජනතාව අවශ්‍ය බලය පවරා දී ඇති තමුත් ඒ ජනතාවගේ එසේත් නැතිනම් මිනිසාගේ මූලික අයිතිවාසිකම් රජුට පැවරෙන්නේ නැති බවටත් ඒවා වෙනම පදනමක් මත අහිමි වන බවටත් ඔවුහු තර්ක කළහ.

එම පදනම නම් ස්වභාව ධර්මයේ නීතිය (Natural Law) යන පදනමයි. මිනිසත් භාවයට නීතියක් ලැබුණි. අයිතිවාසිකම් මාලාවක් ද ලැබිණි. එය ලැබෙන්නේ ස්වභාවයෙන්මයි. ඒ අයිතිවාසිකම් නම්, මානව අයිතිවාසිකම්ය. මිනිස් අයිතිවාසිකම් ලබා ගන්නට අධ්‍යාපනය, ධනය, සමාජ තත්වය යනාදී කිසි දෙයක් අවශ්‍ය වන්නේ නැත. මිනිසත් භාවය නිසාම මේ අයිතිවාසිකම් ලැබේ. මෙහි වැදගත්කම වන්නේ එයයි.

මිනිස් අයිතිවාසිකම් යනු වෙනත් කෙනෙකුගෙන් ලැබුණු දෙයක් නොවෙයි. එය, තමන්ගේ මිනිසත් භාවය නිසාම ස්වභාවධර්මය නීතිය යටතේ ලැබෙන්නෙකි. එම 'ස්වභාව ධර්මයේ නීතිය' යන අදහස විශේෂයෙන් ම ප්‍රචලිත කළේ 'විලියම් බ්ලැක්ස්ටන්' නමැති ඉංග්‍රීසි ජාතිකයාය. ඔහු අටවන සියවසේ මේ අදහස ප්‍රචලිත කළේය. අටවන සියවසේ ඇති වූ එම අදහස් දෙවන ලෝක සංග්‍රාමයේ අවසන් භාගයේදී ක්‍රියාවට නැගිණි. 1948 මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශය විලියම් බ්ලැක්ස්ටන්ගේ අදහසක් අනුව ඇතිවූවකි. මේ අදහස් මාලාව අනුක්‍රමයෙන් ප්‍රවර්ධනය වූණි. එනම් රජුගේ බලය සීමා වන්නේ ජනතාවගේ මිනිසත්භාවය මත ය. මිනිස් භාවය මත ලැබෙන අයිතිවාසිකම් ප්‍රවර්ධනය සිදු වේ.


රජු සහ ජනතාවගේ අයිතිවාසිකම් අතර ගැටුම මේ අනුව ඇති විය. මෙය බ්‍රිතාන්‍ය ඉතිහාසයේ කැපී පෙනෙන දෙයකි. රජු සහ පාර්ලිමේන්තුව අතර ගැටුම යනු එයයි. 1215 එහි ආරම්භයයි. ඒ අවුරුද්දේ ජෝන් රජතුමා බ්‍රිතාන්‍යයේ රජ කරන අවධියේ මැග්නාකාර්ටා යනුවෙන් ලියවිල්ලක් ඇති විය. කිසි යම් මිනිසෙකු නීතියේ ක්‍රියා දාමයට පරිබාහිරව දඬුවමක් නොලැබිය යුතු ය යන අදහස ඉන් තිබුණි. එවිට රජුට ඉහළින් නීතිය පැමිණේ. රජුට ඉහළින් නීතිය පැමිණි පසු මිනිසාගේ ජීවිතය ආරක්ෂා කරන්නේ කුමන ආකාරයෙන්ද යන ප්‍රශ්නය මතුවිය. ඒ නිසා එංගලන්තයේ 1940 සහ 179 'හබියස් කෝපස් පනත' සම්මත විය.

දැන් රජුට ඉහළින් නීතිය තිබේ. නීතිය මිනිසා ආරක්ෂා කිරීමට තිබේ. මිනිසාගේ අයිතිවාසිකම් අහිමි වූ විට යම් කිසි ප්‍රතිකර්මයක් තිබිය යුතුය. ඒ සඳහා පිළියම් නම් 'හබියස් කෝපස් පනත' යි. ඊට පසු Billup Rights බිහි විය. (1689)

ජෝන්ලොක් වැනි චින්තකයන්ගේ අදහස අනුව නීතිමය අංශයෙන් මෙවැනි ප්‍රවර්ධනයක් සිදු විය. මේ එංගලන්තයේ සිදු වූවකි. එංගලන්තයේ සිදු වූ මේ ප්‍රවර්ධනය ඇත්ත වශයෙන් ම මුදුන් පැමිණියේ එංගලන්තයේ නොවේ. ඒ සමය වන විට, අත්ලන්තික් සාගරය දෙපැත්තේ ම වෙනම සමාජ ක්‍රියාදාම දෙකක් තිබිණ. බටහිරින් අමෙරිකා එක්සත් ජනපදයයි. අනෙක් පැත්තෙන්, නැගෙනහිරට ප්‍රංශ විප්ලවය යි.

රාජ්‍ය ක්‍රමයන්ට එරෙහි ව මේ සමාජ විප්ලව දෙක ම සිදුවූයේ එක ම අවධියකය. 1789 අමෙරිකා එක්සත් ජනපදයේය. අනෙක ප්‍රංශයේය. ඒ නිසා රජුගේ බලයට එරෙහිව මිනිස් අයිතිවාසිකම් බිහි කිරීමට මේ ව්‍යාපාර දෙකට සිදු විය. මෙහි මූලික අදහස නම් රජුගේ පූර්ණ බලය බිඳ හෙලා මිනිසාගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමයි. අමෙරිකා එක්සත් ජනපදයේ බිහි වීමට පෙර 1789 දී ප්‍රංශයේ 'මිනිසාගේ අයිතිවාසිකම් ප්‍රකාශන ලියවිල්ල' බිහි විය. (Decleration on the Rights of man) මෙය මානව අයිතිවාසිකම් පිළිබඳ මුලින් ම මනාසේ ලියා සකස් කළ ලියවිල්ලයි. ඒ වන විට අමෙරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව ද ලියැවී අවසානය. 1791 දී අමෙරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාවට සංශෝධන වශයෙන් 1-10 තෙක් නීති සම්පාදනය විය. අමෙරිකා එක්සත් ජනපදයේ (Billup Rights) 'මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය' යනුවෙන් හඳුන්වන්නේ එම සංශෝධන මාලාවයි. 1791 දී ප්‍රංශ ලියවිල්ලේ ආභාසයෙන් සංශෝධන මාලා දහයක් බිහි විය.

මූලික අයිතිවාසිකම් යන්නෙන් පළමුව වැදගත් වන්නේ පුද්ගලික නිදහසයි. එය ප්‍රධාන ම අයිතියකි. නිදහස සීමා වෙනවා නම් එය නීත්‍යානුකූල ව සීමා විය යුතුය. දෙවනුව වැදගත් වන්නේ මානව අයිතිවාසිකම් ය. විෂමතාවකින් තොර ව නීතිය එක හා සමාන ව සැමට ම ක්‍රියාත්මක විය යුතුයි යන අදහස. නීතිය කුමක් හෝ වේවා එක හා සමානව ක්‍රියාත්මක වීම. මෙයට සීමා කිරීමක් ඇත. නීතිය සැමට ම එක හා සමාන ව ක්‍රියාත්මක විය නොහැකිය. ජනතාව අතර විෂමතාවක් තිබේ. එහෙත් විෂමතාව අනුව සකස් වන්නේ නම් එය සාධාරණ හේතුවක් මත සකස් වූ විෂමතාවක් විය යුතුය. ඒ සඳහා නිදසුනක් මෙසේ දැක්විය හැකි ය. රජය විසින් සමාජ ආධාර සමෘද්ධිය දෙනු ලබයි. එය දෙනු ලබන්නේ කොටස් වශයෙනි. එනම්, රු. 2500 ට අඩු ආදායමක්, නැත්නම් රු. 1000 ට අඩු ආදායමක් ලබන අයට වශයෙනි. සැමට ඒකාකාරීව එය නොලැබෙන බව ඉන් අවබෝධ වේ. ඒකාකාරීව ලැබෙනවා නම් මට ද ඒ සමෘද්ධිය ලැබිය යුතුය.




ඇයි, සමානතාව තිබේ නම්, නීතිය අනුව සියල්ලන් එක සමාන නම් ඇයි මට ලැබෙන්නේ නැත්තේ ? නීතිය යටතේ, සමානතාව වර්ග කිරීමක් කළ හැකිද ? එසේ නම් එය සාධාරණ හේතුන් මත විය යුතුය.

රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් නීතිය අනෙක් අයට වඩා දැඩි වේ. ඒකත් වර්ග කිරීමකි. යුධ හමුදාවේ නිලධාරීන් සම්බන්ධයෙන් නීතිය ඊටත් වඩා දැඩි ය. ඒ අයට දැඩි යුධ පාලනයක් තියෙන්නේ. ඒකත් වර්ග කිරීමක්. එසේ නම් සමානතාව කියන්නේ නීතිය සියල්ලන්ට ම එක සමානයි කියන එක නොවේ. සාධාරණ වර්ග කිරීමක් තිබිය යුතුය. එහෙත් ඒ වර්ගීකරණය සහේතුක වර්ගීකරණයක් විය යුතුය.

නීතිය අනුව පොදු විභාගයක් අනුව ගුරු වෘත්තියට හෝ පරිපාලන සේවයට හෝ බඳවා ගැනේ. එවිට කෙලින්ම පෙනී යන කරුණක් නම් ඒ විභාගයේ ප්‍රතිඵල අනුව ගත්තොත් සාධාරණ වර්ග කිරීමක් තිබෙන බවයි. ඒ විභාගයෙන් අපේක්ෂිත ලකුණු මට්ටමට ඉහළින් ආවොත් බඳවා ගැනේ. පහළින් ආවොත් බඳවා නොගැනේ. ඒ වැනි සාධාරණ හේතු අනුව වැඩි ලකුණු තියෙන කෙනෙකු තෝරා නොගෙන ප්‍රසාදය මත අඩු ලකුණු ලැබූ කෙනෙකු තෝරා ගත්තොත් කෙලින් ම සර්ව සාධාරණ වර්ග කිරීමක් සිදුවී නොමැති බව පෙනී යනු ඇත. නීතියේ සර්ව සාධාරණත්වයට ඇති ව්‍යතිරේකය නම් යථෝක්ත සාධාරණ වර්ගීකරණයයි.

නිදහස පිළිබඳ අයිතිවාසිකම් තියෙන්නේ 13 වැනි වගන්තියේ ය. ඊට අමතරව 10 වැනි වගන්තිය යටතේ ආගමක් ඇදහීමේ නිදහස තිබේ. ඒවා හිතේ පවතින ඒවාය. හිතේ පවතින ඒවට අසීමිත නිදහසක් තිබේ.එහි වැදගත් කමක් ඇත. 11 වැනි වගන්තිය යටතේ විවිධ වධ හිංසාවලට, කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට හෝ භාජනය නොවිය යුතුය යනුවෙන් සඳහන් වේ. එනම් ආගමක් හැදින්වීමේ නිදහස, සිතීමේ නිදහස, කෲර සහ වධ හිංසා කිරීම යනාදිය තියෙන්නේ 10, 11 වගන්ති යටතේ. වැදගත්ම නිදහස් දෙක එන්නේ 12, 13 යන වගන්ති දෙක යටතේය.

මාධ්‍ය නීති මාලාවට අයිති වන වැදගත්ම එක නිදහස හා ප්‍රකාශන ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ය. මෙය මුළු ජනමාධ්‍ය නීතියටම අදාලය. සාමකාමීව රැස්වීමේ නිදහස, වෘත්තියක නියැලීමේ නිදහස, පෞද්ගලික විශ්වාස ඇදහීමේ නිදහස, යනාදිය මෙයට ඇතුලත්ය. මේ නිදහස් මාලාව වැදගත් වන්නේ භාෂණය සහ අදහස් ප්‍රකාශ කිරීමේ හා ප්‍රසිද්ධ කිරීමේ නිදහසයි. එය සමාන්‍යයෙන් මාධ්‍ය පිළිබඳ ඇති මූලික අයිතිවාසිකමයි. මේ 14.1 (ආ) වගන්තිය යටතේ සඳහන් වී ඇත.

මේ සියල්ල ම ප්‍රංශ විප්ලවයත්, ඇමෙරිකන් යුද්ධයත් ආශ්‍රිතව ගොඩ නැඟුණ නිදහස් මාලාවයි. මේ අවධියේ යුරෝපයේ මේවා එන්න එන්නම කඩා වැටිණි. ජර්මනියේ ඉතා දියුණු ව්‍යවස්ථාවක් තිබිය දීත් හිට්ලර්ට මතු වෙන්නට අවකාශ ලැබිණි. ව්‍යවස්ථාවක් තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ව්‍යවස්ථා ඉතා ලස්සනට තිබෙන්නට පුළුවන. වයිමාර් ව්‍යවස්ථාවට වැඩිය මානව සකස් වූ ව්‍යවස්ථාවක් තවත් නැතැයි යනුවෙනුයි අපි විශ්වාස කරන්නේ. 1919 දී තිබුණු ව්‍යවස්ථාව, එනම් මානව අයිතිවාසිකම් ව්‍යවස්ථාව

සිහියදීත් හිට්ලර් ඊට සම්පූර්ණයෙන්ම පිටුපා ක්‍රියා කර ඇත. ඒ සමගම II වැනි ලෝක යුද්ධ සමය හිමි විය. හිට්ලර් ව්‍යවස්ථාව යටපත් කර, රයිස්ටා නියත පාර්ලිමේන්තුවට ගිනි තබා, එතැන් සිට ඔහුගේ මර්දනකාරී පාලන ක්‍රමය වර්ධනය කළේය. II වැනි ලෝක යුද්ධය අවසන් වන විට යුරෝපයේ බටහිර මතවාදීන්ගේ අදහස වූයේ මානව අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය තිබුණාට වඩා හොඳට සේවිමත් කළ යුතුය යනුවෙනි. මේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත වීම කඩා වැටුණු විට බොහෝ ආඥාදායකයෝ බිහි වෙන්නට පටන් ගනිති. ආඥාදායකත්වය තුරන් කරන්නටත් ඇති එකම ප්‍රතිකර්මය මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමයි යන අදහස ප්‍රකාශ විය. ඒ අදහස මත 2 වැනි ලෝක සංග්‍රාමය අවසන් වූවාට පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය කළ මුල්ම ක්‍රියාව නම් මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශය 1948 දෙසැම්බර් දහ වැනි දින ප්‍රකාශයට ඇතුළත් කිරීමයි. අමෙරිකාවේ 1 සහ 10 තෙක් ව්‍යවස්ථාවේ ඇති සංශෝධනයන් සහ ප්‍රංශයේ මිනිසාගේ අයිතිවාසිකම් යන ප්‍රකාශයේ ඇතුළත් අයිතිවාසිකම්, මේ විශ්ව ප්‍රකාශයට ඇතුළත් විය. අද දක්වාම පවතින්නේ II වැනි ලෝක යුද්ධයෙන් පසු පැවති ඒ චින්තනයයි. මානව අයිතිවාසිකම් කෙසේ හෝ සුරක්ෂිත කළ යුතුය යන අදහසත් ඊට බිඳ හෙළුණොත් ලෝක සාමයට අවහිරයක් වන්නේය යන සංකල්පය අද පවතී. දැන් එය අමෙරිකන් චින්තනයට ලක්ව තිබූ සංකල්පයකි. ආඥාදායකයන් බිහි වෙන විට අමෙරිකාවේ එක්සත් ජන මතයන් බිහි වෙයි. කෙසේ හෝ යුද්ධයක් දියත් කර හෝ තත්ත්වය මැඩ පවත්වයි. දැන් සදාම් හුසේන් ට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයේ චින්තනය එකයි. මේ චින්තන් හිමිවීම ඇතිවූවකි. බිහි වූ පසු එය පැතිරෙයි. 2 වැනි ලෝක සංග්‍රාමය පැතිරුණේ එලෙසටය. හට්ලර් බිහිවෙයි. පසුව මුසොලිනී බිහි වෙයි. අනතුරුව ස්ටාලින් බිහි වෙයි. ඉන් පසුව සදාම් හුසේන්ය. ඉන් පසුවත් කවුරු කවුරු හෝ බිහි වෙති. අමෙරිකන් චින්තනයේ මානව අයිතිවාසිකම් කෙසේ හෝ සුරක්ෂිත කළ යුතුයි යන අදහස ගැබ් වී ඇත.

2 වැනි ලෝක සංග්‍රාමයෙන් පසු බොහොමයක් යටත් විජිත රාජ්‍යයන් නිදහස් විය. එය සිදු වූයේ අප්‍රිකානු සහ ආසියාතික කලාපවලය. එයට හේතුව නම් ලෝක යුද්ධයට පෙර යටත් විජිත වාදය ව්‍යාප්තව තිබුණේ එම කලාපවල වීමයි. යුරෝපා ජාතිකයන් මෙසේ පැමිණ හැම රටක් ම අල්ලා ගත්හ. එවැනි රටවල් නිදහස් වීමත් සමගම මානව අයිතිවාසිකම් යන්න ඔවුනු ස්වකීය ව්‍යවස්ථාවන්ට ඇතුළත් කළහ. මානව අයිතිවාසිකම් සුරක්ෂිත කළොත් ආඥාදායකත්වය දුරු වෙනවා ය කියන ඉතාමත් පැහැදිලි ප්‍රත්‍යක්ෂ අදහස නිසා ඉන්දියාවේ ව්‍යවස්ථාව සකස් කිරීමේදී මානව අයිතිවාසිකම් ඇතුළත් කර ඇත.

මානව අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත් වූ විට, මූලික අයිතිවාසිකම් යනුවෙන් එය හඳුන්වයි. එය ජගත් මට්ටමින් ගත් කළ මානව අයිතිවාසිකම් යනුවෙන් හැඳින්වේ.

අයිතිවාසිකම් වල සාමාන්‍යයෙන් මූලික වෙනසක් නොමැත.

භාෂණයේ නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනු ප්‍රධාන නිදහස් දෙකකි. භාෂණය යනු කතා කිරීමේ නිදහස හා අදහස් ප්‍රසිද්ධ කිරීමේ නිදහසයි. මාධ්‍ය නිදහස යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වන්නේ එයයි. මානව අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස අපි පිළිගනිමු. සිතීමේ නිදහස යනු සිය මනස දියුණු කර සිතීමේ නිදහස ය. සිතීමේ නිදහස දැන් සම්පූර්ණයෙන් ම ආරක්ෂා වී ඇත. මීට පෙර එය ආරක්ෂා නොවීමට හේතුවක් ඇත. යුරෝපයේ අදහස වූයේ රජු දිව්‍යමය වරප්‍රසාදයක් අනුව රට පාලනය කළේය යනුවෙනි. එම මතයට පටහැනිව සිතූ අය පවා එකල මරණීය දණ්ඩනයට ලක් වූහ. සිතීමේ නිදහස ඒ මට්ටමින් පාලනය විය. චින්තනය ඉවත් වුවහොත් රජුගේ බලය බිඳේ. ඒ නිසා සිතීමේ නිදහස ආරක්ෂිත කළහ. දැන් සිතන්නට නිදහස තියෙනවා නම් ඒ සිතපු අදහස් ප්‍රකාශ කරන්නට අනිවාර්යයෙන්ම නිදහසක් තිබිය යුතුය. එවැනි නිදහසක් තිබේ නම් එය ප්‍රසිද්ධ කරන්නටත් නිදහස තිබිය යුතුය. එවන් අවධියකට නිදහස සංක්‍රමණය වන්නේ, පළමු වර හිතනවා, පසුව කතා කරනවා, ඊට පසුව ඒවා ප්‍රසිද්ධ කරනවා. මෙය ආරක්ෂා කිරීම ඉතාමත් වැදගත් ය. මෙය දෙපැත්තට කැපෙන කඩුවක් මෙන් විශ්වාසයක් නොමැත. එතැනදී මෙය තුලනය කිරීමේ අවශ්‍යතාව ඇතිවේ.

එක් තැනැත්තෙකුට ලැබෙන නිදහසින් අනෙක් තැනැත්තෙකුට අපරාධයක් අලාභයක් සිදු නොවිය යුතුය යන සංකල්පයන්ගෙන් අපේ සමාජය ගොඩ නැඟී ඇත. එක් තැනැත්තෙකුට ලැබෙන නිදහසින් අනෙක් තැනැත්තෙකුට අහේතියක් සිදු නොවිය යුතුය. අපේ තියන පොදු නීතිය යටතේ එනම් රෝම ලන්දේසි නීතිය යටතේ තිබෙන පොදු සංකල්පය නම් කිසියම් තැනැත්තෙකුගේ ක්‍රියාවකින් වෙනත් තැනැත්තෙකුට අලාභයක් සිදු වේ නම් එම අලාභය, අලාභයට හේතු කළ තැනැත්තාගෙන් අය කරගත හැකියි. අපේ පොදු නීතියේ ඉතාමත්ම සරල සංකල්පය මෙය වේ. කෙනෙකු බස් එකකට හැප්පුණා යයි සිතමු. එවිට ඒ අලාභය අය කරගන්නේ කවරෙකුගෙන් දැයි මේ



මූලික සිද්ධාන්ත අනුව බලමු. බස් රියැදුරාගේ නොසැලකිලිමත්කම නිසා මේ තැනැත්තාට අලාභයක් සිදු විය. ඔහුට ඒ අලාභය උසාවිය මඟින් ලබා ගැනීමේ අයිතිවාසිකමක් තිබේ. සිය අයිතිවාසිකම් අනෙක් තැනැත්තා විසින් බිඳ හෙළ කිරීම එයට හේතුවයි. ඒ නිසා අනෙක් තැනැත්තා ඊට වගකිව යුතුයි. නීතිය තව දුරටත් ගමන් කරයි. එම රියැදුරා යම්කිසි තැනැත්තෙකුගේ සේවකයකු නම් ඒ සේවාදායකයාටත් එහි වරද පැවරේ. ඩ්‍රයිවර් විතරක් නොවෙයි, බස් එකේ හිමිකරුත් වගකියයි.

පොදු නීතිය යටතේ ... නොව කමක්ගේ කීර්ති නාමයන් ... කරයි. කෙනෙක් ... මට්ටමකට පියවර ගන්න ...

පාසා එක්තරා කීර්ති නාමයක් අත්පත් කර ගනිති. තමන්ගේ නම්බුව ඉන් එකකි. එය තමන් සමග ම ප්‍රවර්ධනය වූ දෙයකි. හේතුවක් නොමැතිව එය අඩු කරන්නට හදනවා නම් කිසි ප්‍රශ්නයක් ඇති නොවේ. එවිට පොදු රෝම ලන්දේසි නීතිය යටතේ සැම විටම අයිතිවාසිකම් තිබුණත්, එවැනි අවස්ථාවක උසාවියට ගොස් අලාභයක් ලබා ගැනීමට හැකි වේ.

රෝම ලන්දේසි නීතිය යටතේ ඉන්ඩ්‍යුරියා (Induria) යනුවෙන් අදහස් කරන්නේ හානිය යන්නයි. හානිය සියලු ආකාරයෙන් සිදුවිය හැකියි. තමන්ගේ දේපලට, තමන්ගේ ඇඟ පතට හානි සිදුවිය හැකියි. තමන්ගේ කීර්ති නාමයට, නම්බුවට හානි සිදුවිය හැකියි. ඉන්ඩ්‍යුරියා යන්න තුන් ආකාරයකින් ක්‍රියාත්මක විය හැකියි. ඒක පොදු නීතිය යටතේ ආරක්ෂාවෙන දෙයක්. මේ පොදු නීතිය යටතේ තියන ආරක්ෂාව මේ මූලික අයිතිවාසිකම්, එනම් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් සීමා කිරීමක් වශයෙන් යෙදිය යුතුය. ගුරුවරයෙකු රජයේ සේවයට එසේත් නැතිනම් ව්‍යාපාරයකට බැඳුනායි සිතමු. ක්‍රමයෙන් ඔහුගේ කීර්ති නාමය ප්‍රවර්ධනය විය. අනෙක් පැත්තෙන් මොනයම් හෝ අපරාධයක් කළ තැනැත්තෙක් ද සිටියි. මේ දෙදෙනාම කුමන හෝ මැරවරකම් කර හිරේ යති. මේ තැනැත්තන් දෙදෙනා ම එක මට්ටමින් මනින එක නුසුදුසුය.

අපරාධකාරයාට කියන නම් අනෙක් පුද්ගලයාට කිවහොත් ඔහුට දැඩි සිත් වේදනාවක් ඇති වෙයි. ඔය අවස්ථාවේ දී හේතුවක් ඇතිව සීමා කිරීමක් ඇතිවේ. හේතුවක් ඇතුව කිවේ නම් එහි කිසියම් හෝ වරදක් නොමැත. එවිට මේ සීමා කිරීම ඇති වන්නේ අනෙක් පුද්ගලයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වන අයුරිනි. මේ මූලික අයිතිවාසිකම් සීමා වෙයි. එනම් මූලික අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිවාසිකම් සීමා කිරීම අනෙක් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වේ. ඩෙෆොමේෂන් නැති නම් අපහාස කියන කරුණ උසාවියේ සිදුවන්නේ තුලනය කිරීමකි. දැන් ඩෙෆොමේෂන් අපහාස කිරීමකදී නිදහසට ඉදිරිපත් කළ හැකි කරුණු තිබේ. පොදු යහපත සඳහා යම් කරුණක් ප්‍රසිද්ධ කළේ නම් එවිට අපහාස කිරීමේ චෝදනාවෙන් නිදහස් කෙරේ. ඒ පොදු යහපත සඳහායි. පොදු යහපත සඳහා සත්භාවයෙන් යම් කිසි ප්‍රකාශනයක් කළොත් එය අපහාසාත්මක වුවත් ඒ සම්බන්ධයෙන් අලාභයක් අය කර ගැනීමට හැකි නොවේ. මේක සාමාන්‍ය පුද්ගල නීතියේ පවතින දෙයකි. සාමාන්‍යයෙන් නිදහසට ඉදිරිපත් කළ හැකි කරුණු කිහිපයකි.

'පුද්ගල සහගතබව'

'සාධාරණ විවරණය'

'වරප්‍රසාදය'

එක් මන්ත්‍රීවරයෙක් තවත් මන්ත්‍රීවරයෙකුට ගොන් අම්බරුවෙක් කියා කියයි. ඒ අනුව අපහාස කිරීමක් සිදු නොවේ. ඒ අවස්ථාව සිදු වන්නේ පුද්ගලයා ඉලක්ක කර ගෙන නොවෙයි. යම් සිද්ධියක් ඉලක්ක කර ගෙනය. මෙහි කුමක් හෝ විශාල අදහස් හුවමාරුවක් තිබේ. යම් කිසි තැනැත්තෙක් කුණුහරුපයක් කීවේය. එය ජෝමන්ට් එකක් විය හැකිය. සාධාරණ විවරණයක් කියන්නට පුළුවන.

පුවත්පත් කාරයෙක් පත්තරේක ගොම්බුරුවෙක් කියලා කීවොත් ඊට වෙනස්. ඔහු සිද්ධියට සහභාගි වෙලා නැත. මන්ත්‍රීවරු දෙන්නා කෙලින්ම සිද්ධියට භාජනය වෙලා ඉන්න අය. පත්තරකාරයා කිව්වෙන් 'ෂා ආර ගොම්බුරුවා කියාපු එක ඇත්ත' කියලා. එතන තමා අපහාස කිරීම සිදු වෙන්නේ. ඔයවගේ තමා සීමා කිරීම් සකස් වෙලා තියෙන්නේ. අපහාස කිරීම සාමාන්‍යයෙන් සිවිල් වන්දියක් ලබා ගැනීමට හැකිවන නීතියක්.

රටේ නීති දෙයාකාරයක්. පුද්ගල අයිතිවාසිකම් තමා සිවිල් අයිතිවාසිකම් කියන්නේ. තවත් අතකින් ඒවා සමාජයට එරෙහිව කරන දේවල්ය. මිනීමරුවන් මැරෙන්න පුළුවන්. ඒක සමාජය කරන එකක් නොවේ. ඒවා අපේ දණ්ඩ නීති සංග්‍රහයේ 479 වගන්තියේ සඳහන් වී තිබේ.

සහාසික අපරාධ සම්බන්ධයෙන් නීතිපතිට පමණයි නඩුව ඉදිරිපත් කරන්නට පුළුවන් වෙන්නේ. මම හිතන්නේ මේ දණ්ඩ නීති සංග්‍රහයේ 479 වැනි, වගන්තියේ නිදහස සම්බන්ධයෙන් කරුණු 10 ක්. අපහාස කිරීමේ චෝදනාවට නිදහස පසා ඉදිරිපත් කර හැකි කරුණු 10 ක් ඇතුළත් වී ඇත. අදහස් ප්‍රකාශනයට පුද්ගලයකුට ඇති අයිතිවාසිකම් හා අපරාධයට ලක්වන තැනැත්තාගේ අයිතිවාසිකම් තුලනය වන්නේ කෙසේද ? ඇත්ත වශයෙන්ම මෙයින් සිදුවන්නේ තුලනය වීමකි. අදහස් ප්‍රකාශනයට මූලික අයිතිවාසිකමක් ඇතැයි කියා පිළිගැනේ. පිළිගත යුතුය. නැත්නම් මේ සමාජය බිඳ වැටේ.


යම් කිසි තැනැත්තෙකු ඉදිරිපත් වෙනවා නම් ඒ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තවත් සීමා තිබේ. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් මේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා වෙන්නට පුළුවන. මුඛවාඩම් දැන් කරන්නේ නැත. මුඛවාඩම්, වාරණයක් යොදවනවා නම් ඒක කෙළින්ම රජයේ ආරක්ෂාවට සම්බන්ධ විය යුතුය. කාලයක් ප්‍රවෘත්ති සම්පූර්ණයෙන් තහනම් කරයි. මේ වාගේ සීමා කිරීමක් තිබිය හැකියි. එහෙත් එය කෙළින්ම රාජ්‍ය ආරක්ෂාවට සම්බන්ධ විය යුතුයි යනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දැන් තීරණය කර තිබේ.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, යම් අසත්‍යත්වයක් බිහිවෙනවා නම් නීතිය මගින් සීමා කරයි. අපි පැහැදිලිවම දන්නවා පුද්ගලයාට අයිතිවාසිකම් සුරක්ෂණය කිරීමට රාජ්‍ය ආරක්ෂාව ආරක්ෂණය කිරීමට මහජන සෞඛ්‍ය හා සභ්‍යත්වය ආරක්ෂා කිරීමට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා වේ.

තුලනය කිරීමක් ජනතාවට හා සමාජයට අත්‍යවශ්‍යයි. රජයෙන්ම නොවෙයි එය සිදුවන්නේ. පවතින මට්ටම්වලින් ආශ්‍රය පවුලෙන් ගමෙන් ආදී වශයෙනි. සමහර විට තරක හැඩගැසීමක් ඇතිවෙන්න පුළුවන. අපේ ගම් මට්ටමින් අන්‍යොන්‍ය සහයෝගීතාව ප්‍රවර්ධන වූ සමාජයක් තිබිණ. බටහිර ශිෂ්ටාචාරයේ එවැන්නක් තිබුණේ නැත. අපේ රට ඉන්දියාවෙන් ආක්‍රමණය කරනවා යයි අපි සිතමු. එවිට කවුරුවත් ඔය මානව අයිතිවාසිකම් ගැන කරන්නේ නැත. අද මෙසේ කතා කරන්නේ නිදහස ඇති නිසායි.

**අගවිනිසුරු සරත් එන්. ද සිල්වා**

**(දේශනයක් ඇසුරෙන්)**



# බුද්ධිමය දේපල පනත හා නිර්මාණකරුවාගේ අයිතිය

අපට දේපල තිබේ. මට මගේ ගෙය ඕනෑ විදියට පරිහරණය කළ හැකිය. අන්තිම කැමති පත්‍රයක් ලියා ගෙය අනාථ නිවාසයකට දිය හැකිය. විකුණන්න, තෑගි දෙන්න, උගස් කරන්න, පවරන්න, බද්දෙන්න පුළුවන. එහෙයින් මේ දේපළ අප හඳුන්වන්නේ භෞතික දේපල ලෙසය. චංචල හෝ භෞතික දේපල, අප ශ්‍රමය මෙහෙයවා, රැකී රක්ෂා කර, හෝ වෙනත් ක්‍රමයකින් උපයා ගන්නා දේපලයි. එයින් අපි ඉඩමක් මිලදී ගෙන ගෙයක් හදා ගන්නෙමු.

කාර්මික විප්ලවයත් සමඟම, වානිජ සමාජය බිහිවීම හේතු කොට ගෙන භෞතික දේපල මුදලට විකුණන අවස්ථාවකට පැමිණ තිබේ. එය යුරෝපයේද භාවිත ක්‍රමයයි.

නිර්මාණ කරන්නා, බුද්ධිය මෙහයවා කරන නිර්මාණ, කාලයක් යන විට පිළිගැනීමට සිදු විය. බුද්ධිමය නිර්මාණ ඇති කරන්න නම් එම පුද්ගලයන්ට අනුග්‍රහයක් තිබිය යුතුය. ඔවුන්ට ආදායම් මාර්ගයක් තිබිය යුතුය. උදා: ලෙස මහාචාර්යවරයකු විශ්වවිද්‍යාලයට සේවය කරන්නේ නැතිව, නව කථා ලියනවා නම් ඒ නවකථාවලට ප්‍රතිලාභ ලැබෙන්නේ නැත්නම්. ඔහුට ජීවත් වෙන්න මාර්ගයක් නොමැත යුරෝපයේ පළමුවෙන් ම මෙම නිර්මාණ හිමිකම් පිළිබඳ ව, අයිතිවාසිකම්, ඇති වූයේ පොත් පත් පිළිබඳවය. මේවා මුද්‍රණය වුවායින් පසුව, ඒ පිටපත් ගෙන ගොස් ඇමරිකාවේ මුද්‍රණය කරන්නට පටන් ගැණින. මෙය කිසි කෙනෙකුගේ ඇසීමකින් තොරව සිදුවූවකි. අමෙරිකාවට පැන ආ බ්‍රිතාන්‍යයෝ මෙම පොත් රැගෙන කිසිම අවසරයක් නොමැතිව, මුද්‍රණය කරන්නට පටන් ගත්හ. මේ හේතුවෙන් එංගලන්තයේ, මුලින්ම පනතක් ඇති විය.

මේ පනත ඇති වීමත් සමඟ ම මේ ක්ෂේත්‍රය ක්‍රමයෙන් පුළුල් විය. යුරෝපයේ නීති පද්ධතිය ඇති වූයේ මේ ක්ෂේත්‍රයට සම්බන්ධ සිද්ධි අනුවයි. පොත් මුද්‍රණ පනතේදී මුලින් ම බලාපොරොත්තු වූයේ ප්‍රකාශකයා ආරක්ෂා කිරීමයි. කතුවරයාට වඩා ප්‍රාග්ධනය පදනම් වූ සමාජයක, කතුවරයාගේ කෘතිය ජනතාව අතට පත් කළේ ප්‍රකාශකයා යි. ප්‍රකාශකයාගේ අයිතිය ආරක්ෂා වුවහොත් කතුවරයාගේ අයිතියද ආරක්ෂා වේ. වෙන රටවල මෙන් එංගලන්තයේ ද පොත් නිෂ්පාදනය කළේ කතුවරයා නොවේ. කතුවරයා පොත ලියා දුන් විට, ප්‍රකාශකයා එය ප්‍රකාශයට පත් කරයි. මෙය මූලික වශයෙන් පැවති නීතියයි. මේ අනුව ප්‍රකාශකයාගේ අයිතිය ආරක්ෂා වුව හොත් කතුවරයා ගේ අයිතියද ආරක්ෂා වන්නේ ය. එසේ ම ගීත රචනය දෙස බැලූ විට, යම් ගීතයක් රචිත රචකයා එම ගීතය ගායනා කිරීමට ගායකයෙකුට ලබා දේ. මෙසේ ගීතය යම් ගායකයෙකු ගායනා කළ හොත්, එයින් පසුව, නැවතත් එම ගීතය නැවීගත කිරීම සිදුවෙයි. බොහෝ දුරට මෙම ක්‍රියාවලිය ජනමාධ්‍යවල බහුවිධකරණය උපයෝගී කරගෙන සිදු කෙරෙන්නකි.

මෙසේ ගීත රචකයා ගීතය ගායකයාට ලබා දුන් විට, ගීත නිර්මාණකරුවාට, රචකයාට, කිසි යම් ආදායමක් ලැබෙන්නේ නැත. අද තත්ත්වය මෙසේ වුව ද රජ කාලේ කලා ශිල්පීන්ට අනුග්‍රහය දැක්වීම, රජුගේ පිරිත විය. කලා ශිල්පීන් සිය මාළිගා ආසන්නයේ පදිංචි කරවාගෙන ඔවුන්ට අවශ්‍ය කෑම බීම සපයා දී, ඔවුන්ට අනුග්‍රහය

දක්වා ඇත. එහෙත් වර්තමානයේ වානිජ්කරණය හේතුවෙන් කලා ශිල්පීන්ට එවැනි අනුග්‍රහයක් නැති විය.

ගීත රචකයෝ රාශියක් එකතු වී දිනක් පැරීසියේ එක් ආපන ශාලාවකට පැමිණියහ. ආපන ශාලාවට ගොස් ඔවුහු කෑම බීම ගෙනෙන්නැයි පවසා කෑම ගෙනා පසු, ඒවා අනුභව කර, මද්‍යසාර පානයකර නැගිට යන්නට පිටත්වූහ. ආපනශාලා පාලකයන් මොවුන් අල්ලා බැඳ තබා ගෙන 'තමුසෙලා කොහෙද යන්නේ. මේක පිනට දෙන තැනක් කියලා හිතුවද ? මේවට සල්ලි ගෙවන්න ඕනෑ' කියා කියනවිට මෙම නිර්මාණකරුවෝ මෙසේ ප්‍රකාශ කරන්නට පටන් ගත්හ. 'අපි දැන් පැය දෙක තුනක් මේ ශාලාවේ රැඳී සිටියා. කෑම බීම ගත්තා. ඒ වෙලාවේ අපේ අය විතරක් නොවෙයි, මේ ආපන ශාලාවේ සිටි හැමෝම ප්‍රමෝදයට පත්වුණා. ඒ ප්‍රමෝදයට පත්වුණේ මේ ගීත ගායනය නිසා. ආපන ශාලාවට මෙතරම් සෙනගක් ආවෙත් මේ ගීත ගායනය නිසා. ඒ ගීතවලින් තමා ඔයාලා හම්බ කරන්නේ. ඒ නිසා අපි සල්ලි දෙන්නේ නෑ'. එවැනි විපර්යාසයන්ගෙන් තමා ගී තනු රචකයාගේ අයිතීන් පිළිබඳව, මුල් සංකල්පය ඇති වුණේ. ඒ නිසා නිර්මාණකරණයේ නීති, යම් යම් සිද්ධි සංසට්ටන නිසා ඇති වූවකි.

වානිජ්කරණයක් තුළ නිර්මාතෘවරයාට ආදායම් මාර්ගයක් තිබිය යුතුය. ආදායම තිබේ නම් එම ආදායම අයිතිවීමේ පදනමක් ද තිබිය යුතු ය. එම ආදායම් මාර්ගය පදනමක් වීමට නම්, එය යම් ආකාරයක් එහි දේපලක් බවට පත් විය යුතු ය. ශ්‍රමය උපයෝගී කරගෙන, උපයන භෞතික දේපල නිර්මාණයන් වර්තමාන ලෝකයේ දී නිර්මාතෘවරයා ද අයත් දේපලක් ලෙස සලකයි. කවර ආකාරයක වූව ද නිර්මාණයක් දේපලකි. උදා: නව කථාවක්, වෙනත් ඕනෑම ආකාරයක නිර්මාණයක්. මේවා බුද්ධිමය දේපලකි.

යම් කිසිවෙකුට දේපලක් අයිති නම්, ඔහුට අවශ්‍ය පරිදි පරිහරණය කළ හැකි ය. තමාට අයිති ඉඩම තමාට ඕනෑ ආකාරයට පරිහරණය කරන්නට පුළුවන. එමෙන්ම තමාට අයිති වාහන කැමැති පරිදි ධාවනය කරන්න පුළුවන. විකුණන්න හැකිය. බදු දෙන්න, කුලියට දෙන්න, පුතාට දෙන්න පුළුවන. බුද්ධිමය නිර්මාණ දේපලත් අද වර්තමාන නීතිය යටතේ තමන්ට, ඕනෑ පරිදි පරිහරණය කිරීමට හැකිය.

කෘතියක් කර්තෘගේ කිසි අවසරයක් නොමැතිව, කිසිකෙනෙකුට පාවිච්චි කළ නොහැකිය. එමෙන්ම පරිහරණය කරන පුද්ගලයාට, එහි මිල තීරණය කරන්න අයිතියක් තිබේ. එහෙත් අවසරයක් නොමැතිව එය පරිහරණය කළ නොහැක. පරිහරණය කරනවා නම්, කුමන මිලකට ද පරිහරණය කරන්නේ ? අවශ්‍ය නම් එය නොමිලේ පාවිච්චි කරන්න යැයි කියන්න හැකි ය. උදා ලෙස: ඔබට ගීතයක් හද දෙන්න පුළුවන්. එය, ගුවන් විදුලි සංස්ථාවේ තේමා ගීතය වශයෙන් දිය හැකිය. එය මගේ අයිතියයි. එහෙත් සල්ලිවලට දෙනවා නම් ඔහුට එහි මිල නියම කරන්නට අයිතියක් තිබේ.

ඊළඟ කරුණ ඔහුගේ අනුප්‍රාප්තියෙන් පස්සේ දේපලක් ඔහුගේ උරුමකරුවන්ට උරුම අයිතියයි. උදා: ඔබගේ ඉඩම ඔබ මියගිය පසු, ඔබගේ දරුවන්ට, භාර්යාවට, හෝ වෙනත් හිමි කෙනෙකුට හෝ කිසිම බාධාවක් නැතිව රටේ ඇති පොදු නීතිය යටතේ උරුම වේ. සුනිල් ශාන්ත මිය ගිය විට සුනිල් ශාන්තගේ ගීත, නිර්මාණ, දරුවන්ටයි, භාර්යාවටයි, උරුම විය.

යම් දේපළක් ඔබගේ ජීවිත කාලය තුළ පරිහරණය කරන ක්‍රමය තීරණය කළ හැකිය. ගීත පිළිබඳ සඳහන් කළ හොත් ගීතයක් රචනා කළ පුද්ගලයා තම ගීතය ගුවන් විදුලියට ඇතුළු කරන්නේ බොහෝම අමාරුවෙනි. ඔහු ගුවන්විදුලිය මගින් ඔහුගේ හැම ගීතයක් ම ප්‍රචාරය වනවාට, ඉතා කැමැත්තෙන් සිටී. යම් කෘතියක් ගත් විට එම කෘතිය බහුවිධකරණයට පරිහරණය කර ඇත. අතීතයේ කෘතියක් භාවිත කළේ ඒකවිධකරණයටයි. අද බහුවිධකරණ පරිහරණයට හේතු වී ඇත්තේ මාධ්‍යයන්හි දියුණුවයි. මෙම දියුණුව හේතුවෙන් කෘතියක් ද බහුවිධකරණය කළ හැකි ය. උදා: නවකථා පොතක් ලියූ විට එය ක්‍රම 3 කින් සකස් කළ හැකිය.

1. හොඳ බැමි සහිත හොඳ මුද්‍රණය.
2. සාමාන්‍ය කඩදාසි මුද්‍රණය.
3. නවකථා පුවත්පත්වල හෝ සාමාන්‍යයෙන් කොටස් වශයෙන් පළකිරීම.

ජපානයේ බොහෝ නවකථා, මුලින් ම පළවන්නේ පත්තරවලිනි. එසේත් නොමැති නම් රූපවාහිනිය, ගුවන්විදුලිය තුළිනි. එසේ පළ වී, අවසාන කොටස් 10 විතර වන විට පොත පිටවෙයි. කොටස් වශයෙන් කියවා තිබෙන අය පොත ගැනීමට යොමුවෙති. එවිට බොහෝ දෙනෙකු පොත ලබා ගන්නා නිසා විශාල අලෙවියක් ලැබේ. එමෙන් ම එම පොත චිත්‍රපටයකට නගන්නත් පුළුවනි. වෙලි නාට්‍යයකට නගන්නත්, මුද්‍රානාට්‍යකට නගන්නත් ආදී වශයෙන් බහුවිධ උපායෝගීකරණයක් සඳහා පරිහරණය කළ හැකි ය. උදා: එච්.ආර්. ජෝතිපාල එක්තරා කැසට් එකකට ගීතයක් ගායනා කර, ඒ කැසට් එක භාවිතයට දුන්නේ නිෂ්පාදකයාට පමණි. ඔහු මියගිය පසු ඒ ගීතය, කැසට් නිෂ්පාදකයාගේ අවසරයකින් තොර ව, ජෝතිපාලගේ හඬින් ම චිත්‍රපට ගීතයක් ලෙසින් නිර්මාණය කෙරිණි.

නිර්මාතෘවරයා මිය ගිය විට, බහුවිධ උපයෝගීකරණය තුළ නිර්මාණ වෙනත් අය ගනිති. උදාහරණයක් ලෙස මහාචාර්යවරයෙක් පොතක් ලියා ප්‍රකාශක වෙත ගෙන ගොස් මෙය මුද්‍රණය කරන්න යැයි කිසිම කොන්දේසියකින් තොරව භාරදෙයි. එහෙත් මෙම බහුවිධ උපයෝගීකරණය නිසා, රුපියල් 150 කට ගන්නා පොතක්, ඊට වඩා වැඩි මිලකට එම සමාගමට විකිණිය හැකි ය. මෙහි දී 'සියලුම කොන්දේසි අයිතිවාසිකම්, එම සමාගමට පවරා දෙමි' යනුවෙන් අත්සන් කර ඇති හෙයින් භාරගත් පුද්ගලයාට තමාට ඕනෑම දෙයක් කිරීමට පුළුවන. නිර්මාණකරුවන් තමාගේ නිර්මාණය කොන්දේසියක් නොමැතිව පැවරීම නොකළ යුතු ය.

අභියාචනාධිකරණයේ දී විභාගවූ නඩුවක් වූ ගුණදාස කපුගේ ගේ නඩුව ගනිමු. එහි දී කපුගේ මහතාගේ ගීත එක්තරා නිර්මාණකරුවෙකුට දී තිබුණි. ඒ නිර්මාණකරුවා ඒ ගීත ඇතුලත් කොට සංයුක්ත තැටියක් නිකුත් කළේ ය. මේ පිළිබඳ කපුගේ මහතා දැනගෙන සිටියේ නැත. සංයුක්ත තැටිය නිකුත් කළ පුද්ගලයා දෝෂාරෝපණයට ලක්ව ඇති අතර, එම පුද්ගලයා ඔහුගේ අයිතිවාසිකම් කියයි. අධිකරණයට ගිය විට අසන්නේ ගිවිසුමක් ඇති ද කියා ය. ගිවිසුම පෙන් වූ විට මෙය මෙපමණක මුදලක එකක් යයි පවසයි. එමෙන් ම මෙහි රිසිට් එකක් මිස ගිවිසුමක් නැති බව ඔවුහු ප්‍රකාශ කරති. රිසිට්පතේ සී.ඩී. තැටියකට ගන්නට එපා කියා ද නැත. මෙසේ විවිධාකාර ප්‍රශ්න පැන නගී. එහෙයින් මෙයට ගිවිසුමක් අත්සන් කළ යුතුයි.

සිංගප්පූරුව, එංගලන්තය, ප්‍රංශය වැනි රටවල සී.ඩී. තැටි මිල දී ගනිති. තැටිවලට විශාල අලෙවියක් පවතී. විශේෂයෙන් විදේශ රටවල කැසට් අලෙවි වන විට, එහි ප්‍රමාණය සිතාගත නොහැකිය. ඒ තරමට ම අලෙවි වේ. එයින් ලැබෙන ප්‍රතිලාභයක් නිර්මාතෘවරයාට ලැබෙන්නේ නැත.

පෙලිත්කෝර් රක්ෂණ සමාගම, දූදරුණෝ නාට්‍යය කළේ ය. එම සමාගම දූ දරුණෝ නාට්‍ය කළේ ඔවුන්ගේ ප්‍රචාරයට ය. නාට්‍ය

නිෂ්පාදකයන්ටයි, නළු නිලියන්ටයි ඔවුනු මුදල් දෙති. එවිට ඔවුනු මුදල් උපයා ගනිති. දූ දරුවෝ නාට්‍යයේ විකාශනය වෙද්දී එක අවස්ථාවක සී.ටී. ප්‍රනාන්දු මහතාගේ 'මාමේ පොඩි මාමේ' යන ගීතය ජවනිකාවක තිබුණි. ඒ වෙලාවේ ම, සී.ටී. ප්‍රනාන්දු ගේ සොහොයුරියකට කථා කර මේ ගැන කුමක් හෝ කරන්න යයි කියයි. එය නාට්‍ය නිෂ්පාදකවරයාට කීවිට, 'අපි මේ ගීතය ගත්තේ ඒක ජනප්‍රිය නිසා' යැයි කීවේය. 'අනෙක අපට ඕන තරම් සංගීතඥයින් සිටින නිසා අලුත් ගීතයක් නිෂ්පාදනය කරගන්න බැරිකමක් නෑ. ඒත් අපි, මේ ගීතය ගත්තේ, චාරිකා යන වෙලාවට කවුරුත් ගායනා කරන ගීතයක් නිසයි.'

බහුවිධ උපයෝගීකරණයට ලක්වන කලා නිර්මාණයේ අයිතිය පිළිබඳ කොන්දේසි තිබේ. කොන්දේසි සහිත ව අයිති කරගත හැකි ය.

මෙය කොටස් 2 කි.

01. සදාචාර අයිතිය

02. ආර්ථික අයිතිය

සදාචාර අයිතිය යනු, නිර්මාතෘවරයා, ඒ කෘතියේ නියම නිර්මාතෘවරයා ලෙස හැඳින්වීමයි. ඒ අයිතිය මොනම කාරණයක් නිසා හෝ කිසි කෙනෙකුට පැවරිය නොහැකි වූත් අයිතියකි. උදාහරණයක් නම්, මෙම පොත ලිව්වේ මහින්ද රූපසිංහ, මේ ගීතය නිර්මාණය කළේ, රෝහණ වීරසිංහ, එවිට මෙය කාටවත් පැහැරගන්න වත්, පවරාගන්න වත් නොහැකි අයිතියකි.

'ගම් පෙරළිය' නවකථාවේ මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ නම නොයොදා, මහින්ද රූපසිංහ යයි යොදා පළකිරීමට නොහැකිය. මෙය පවරන්න බැරි අයිතියකි. නිදː නිර්මාණයක සම්පූර්ණ අයිතිය ගුණසේන සමාගමට දෙයි. එවිට ගුණසේන සමාගමට ඕනෑම දෙයක් කළ හැකි ය. එය ගුණසේන සමාගමට පවරා දෙන්නේ, ලක්ෂයකට පොත මුද්‍රණය කරන්නට පමණි. ඒ අවුරුදු 5 කට වෙන්න පුළුවන්, එසේ නොමැති නම් මුද්‍රණ වාර 10 කට වෙන්න පුළුවන්. මෙවැනි කොන්දේසි දාගන්න පුළුවන. මෙහි දී ඔවුන් මුද්‍රණය කරන්නේ පළමු මුද්‍රණය පමණක් වීමට ද හැකිය.

ආර්ථික අයිතිය පිළිබඳ සළකා බලන විට තවත් සිද්ධාන්තයක් වැදගත් වේ. ජාතික වස්තූන් කලා නිර්මාණ, කලාකරුවන්, රටටම වස්තූන් වේ. ඔවුන් සදාකාලිකවම ජාතියේ, නිර්මාණකරුවන් ය. ඒ නිසා කලාකෘති කාලයක් යන විට ජාතියට අභිමිවීම, වලක්වා ගැනීමට සංරක්ෂණ සිද්ධාන්තයක් ඇත. ඒ නිසාම කලාකරුවනට ඇති අයිතිය සීමාවක් නැත. නමුත් නිර්මාණ වල සීමාවක් ඇත. කලාකරුවා මියගොස් අවුරුදු 100 කට පසු, ඒවා ප්‍රකාශකයාට, වෙන්කර ගැනීමට නොහැකි ය. කර්තෘවරයා ලවා එය වෙනස් කළ යුතුයි. ඒ නිසා නිර්මාණ කෘතියක සංස්කරණය එක් එක් පුද්ගලයාට කළ නොහැකි ය. ජපානයේ නම් සංස්කාරකවරු සිටී. ඒ අය කතුවරු ළඟට ගොස් කතුවරයාට අවශ්‍ය පරිදි වෙනස් කිරීම කරයි. ඒ තරමට ම කතුවරයාට අයිතියක් හැකියාවක් ඇත. නිර්මාතෘවරයා හා ප්‍රතිනිෂ්පාදකයා අතර සම්බන්ධතාවක් තිබිය යුතුය. ඒ සබඳතාව, මෙරට ඉතා අඩු ය. මෙලෙස ඕනෑම, කලාත්මක විද්‍යාත්මක මුල් කෘතියකට ආරක්ෂාව ලැබේ.

කවරෙකුගේ හෝ නව කථාවක් ඉංග්‍රීසියෙන් පළ කරන්නට, පරිවර්තනය කරන්නට හැකි ය. එවිට පරිවර්තනයකට මුල් කෘතියක් වශයෙන් ආරක්ෂණය ලැබේ. ඒ, කෘතිය කළ දා සිට අවුරුදු 50 ක් යනතෙක් ය. මිය ගොස් 50 වසරක් යනතුරු, පරිවර්තනය කළ නොහැකිය. ඒ සඳහා මුල් කෘතියේ අවසරය ගිවිසුමකින් තිබිය යුතු යැයි පනතේ කියැවේ. වාචික අවසරයෙන් මං අවසර දුන්නේ නැහැ යනුවෙන් කිව හැකිය. දෙවැන්න වාචික අවසරය දුන්නත්, ඔප්පු කළ නොහැකිය. අනෙක් එක මුල්කෘතියට අවුරුදු 100 ක් වෙලා සිය වැනි අවුරුද්දේ අවසර ලබා දෙයි. 101 දී ඔහුව මියගියොත් 101 දී පොත මුද්‍රණය කරයි නම් ඔහුගේ දූ දරුවෝ ඔවුනට එවැනි අවසරයක් දුන්නේ නැති බව කියා, අපට ගාස්තුවක් ගෙවන ලෙස කියයි. අන්තිම මොහොතේ කැමැත්ත දුන්නා යැයි කීවද ඔප්පු කළ නොහැකිය. දරුවන් එහෙම එකක් නෑ කියා පැවසිය හැකිය. පටිගත කරල තිබුණොත් එහෙම නොවේ. ඒ නිසා ලිඛිත ගිවිසුමක් තිබීම අත්‍යවශ්‍ය යි.

සංවර්ධනය වන රටවල කෘතීන් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම ගැන පනතේ කියැ වේ. Titanic කියන චිත්‍රපටියට ඩොලර් බිලියන ගාණක් වියදම්ව තිබේ. අද ලෝකයේ වැඩිම ආදායමක් ලබපු චිත්‍රපටිය එයයි. යුරෝපයේ වත් වීඩියෝ ගත කර නොවිකිණෙයි. ඒත් ලංකාවේ එහි පිටපත් තිබේ. ඒ උල්ලංඝනයේ ප්‍රශ්නයකි. නමුත් ඒ පොත පරිවර්තනය කර විකුණයි නම් විශාල කර්තෘ භාගයක් ගෙවිය යුතුය. Titanic කියන පොත ලංකාවේ විකිණෙන්නේ එහි ප්‍රචාරය නිසයි. චිත්‍රපටියේ කතාව නිසයි.

නමුත් බොහෝ දුරට මේ විශේෂ අවසරය තියෙන්නේ මූඛ්‍ය පරමාර්ථ ඥාතය සංවර්ධනය වන රටවලට ලබා දීමේ පදනමිනි. ඒ රටවල එම කෘතිය දේශීය භාෂාවකින් මුල් පොත පළවී අවු 10 ක් ඇතුළත පළවේ. සංවර්ධනය වන රටවලත් පරිවර්තනය කළ හැකිය. නිදර්ශනයක් වශයෙන් Titanic හෝ වෙනත් විද්‍යාත්මක පොතක් මුලින් ලියල අවුː 10 ක් එනම්, 1980 පිටවුණා නම් 90 න් පස්සේ කර්තෘ භාග නොගෙවා පරිවර්තනය කරල විකිණිය හැකිය. එය විශේෂිත අවස්ථාවකි. එය ඉන්දියාවට කළ නොහැකිය. ඉන්දියාවේ පොත් ක්ෂේත්‍රය ගැනෙන්නේ සංවර්ධනය වූ රටක් වශයෙනි. පොත් ක්ෂේත්‍රයේ ප්‍රබල අලෙවියක් තියෙන දියුණුවක් තියෙන රටකි.

විදේශීය කෘතියක් දෙමළට පරිවර්තනය කර ලංකාවේ විකිණිය හැකිය. දෙමළ භාෂාවෙන් කතා කරන ඉන්දියාවේ හෝ මලයාසියාවේ හෝ සිංගප්පූරුවේ හෝ විකිණිය නොහැකි ය. අන්තර්ජාතික කෘතියක් පරිවර්තනයේ දී මුල් කෘතිය පළ වී අවුː 10 ක් ගිය පසු මුල් භාෂාවෙන් පළ කළ නොහැකි ය. ඉංග්‍රීසියෙන් ලියවුණු පොතක් සිංහලයට පරිවර්තනය කළ හැකිය. එහෙත් ඒ පොත මෙහි දී ඉංග්‍රීසියෙන් මුද්‍රණය කර විකිණිය නොහැකි ය. එයට හේතුව දේශීය භාෂාවලට පරිවර්තනය වී නොතිබීම යි. ඉංග්‍රීසියෙන් කියවන්න අවශ්‍ය නම් ඉංග්‍රීසි කෘතිය මිල දී ගත යුතු වේ.

අවසර නොගෙන ප්‍රති නිෂ්පාදනය කළ නොහැකි ය. නීතිමය ප්‍රතිපාදන තියෙන්නේ ඒ සඳහා ය. යමක් හොරකම් කළවිට පුද්ගලයකුට පොලීසිය ගොස් පැමිණිල්ලක් කළ හැකිය. අලාභය ඔප්පු කළ පසු පොලීසිය විත් හොරාව අල්ලා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරයි. විවිධ විධාන උල්ලංඝනය කළහොත් පොලීසියට ගොස් පැමිණිල්ලක් කළ විට පොලීසිය ක්‍රියාත්මක වෙයි. අපේ රටේ පොලිසි මේ බුද්ධිමය මට්ටමට ඇවිත් නැති නිසා බුද්ධිමය හිමි ගැන නොදනිති. සරච්චන්ද්‍ර මහතාගේ 'මනමේ' පොත විභාගයට ඇති බැවින් හුඟක් අලෙවි වන පොතකි. ඔය පොතේ මුලින පිටපත අරගෙන පොත මුද්‍රණය කරල රුපියල් සියයේ පොත රුපියල් පනහට විකුණයි. පොත් සාප්පු කාරයෝ ද එම පොත ගනිති. එහි පොත් සාප්පු කාරයින්ට වැඩි මිලක් තිබේ. වැඩියෙන් අලෙවි වන

ඉංග්‍රීසි පොතක්, සරසවි පොත් හළ ලෝන්මත් සමාගමේ අවසරය ඇතිව මුද්‍රණය කර තිබේ. එම පොත ඡායාපිටපත් කර පිටකොටුවේ ව්‍යාපාරිකයෙක් ඊට වඩා අඩු මුදලට විකුණයි. පොලීසියට ගියාම පොලීසියට මෙහි නීති සොයා ගත නොහැකිය. අපේ ගෙදරින් රේඩියෝ එකක් හොරකම් කළොත්, පොලීසියට පැමිණිල්ලක් කළවිට අහනවා කවුද සැක? කවුද හොරා ? හොරාව අල්ලලා දෙන්න පුළුවන්ද ? අපි හොරාව අල්ලල දුන්නට පස්සේ පොලීසියෙන් නඩු දමයි. මෙහිදී හොරාව අල්ලල දුන් පසුවත්, පොලීසිය කල්පනා කරමින් සිටී.

එහෙත් නීතියෙන් වැරදිකාරයන් හිරගත කළ හැකි යි, මුද්‍රිත යන්ත්‍රාලය අත්අඩංගුවට ගෙන රාජ සන්තක කළ හැකි යි, මුද්‍රිත පිටපත් සියල්ල අත් අඩංගුවට ගෙන කාට හෝ දිය හැකි යි. එවැනි විධි විධාන අපරාධමය පනත යටතේ ඇත.

සිවිල් නීතියෙන් ඒ පුද්ගලයා අධිකරණයට ගෙනැවිත් නඩුව ඔප්පු කර ඒ කෘතිය නැවත පළ කිරීම නැවැත්වීමට හැකිය. කෘතිය නැවත පළ කළාට වන්දි අයකර ගන්න ද පුළුවන. වන්දි අයකර ගන්නා විට කාරණා දෙකකට වන්දි අයකර ගැනීමට පුළුවන.එයට එක් හේතුවකි අවසරය නොමැතිකම. අවසරය නැතුව ක්‍රියා කිරීම අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමකි. දෙක, ඔහු ලැබූ අයථා පෝසත් වීමට, අන් අයගේ බුද්ධිමය දේපළ උපයෝගී කරගෙන තිබේ. අයථා පෝසත්වීම ප්‍රශ්නයකි. අයථා පෝසත් වීමට වන්දියක් ගැනීමට නම් ඔප්පු කළ යුතුය. සාමාන්‍ය අධිකරණ සම්ප්‍රදායට අනුව ලක්ෂ 10 ක් ආදායම් ලැබුවා කියා ඔප්පු කළ හැකිය. එය ඉතා අසීරු කාර්යයකි.

ඡායා පිටපත් කරණය ඉතාම ප්‍රබල ප්‍රශ්නයකි. කෘතියක් ඡායා පිටපත් කරයි නම් එම ප්‍රමාණයට පොතක විකිණීම අඩු වෙයි. කතුවරයෙකුට වගේ ම රෙකෝඩ් බාර් එකකින් එබඳු පටිගත කිරීමක් කර තියෙනව නම් මුල් කැසට්පටවල මිල අඩු වේ. මේ දෙක ම නීති විරෝධියි. විශේෂයෙන් ම යුරෝපීය රටවල තමන්ට ම ඡායා පිටපත් කර ගැනීමට ඡායා පිටපත් යන්ත්‍ර ඇත. ඕස්ට්‍රේලියාවේ එක් කෙටි කතා රචකයෙක් විශ්වවිද්‍යාලයට විරුද්ධව නඩු පැවරීය. එයට හේතුව තම කෘති, පොත් විකිණීමට බාධා වෙන පරිදි ඡායා පිටපත් කිරීමයි. කෙටි කථාවක් පිටපත් කිරීම අයිතිය උල්ලංඝනය කිරීමක් බවට උසාවිය විසින් තීරණය කරන ලදී. පිටපත් කරනවා නම්, යම් කෘතියක කොටස් භාවිත කරන්න ඕනෑම කෙනෙකුට අයිතියක් තිබේ. විශේෂයෙන් ම විචාරකයින්ට, සාධාරණ විවේචනයක් කරන්න නම්, අධ්‍යයනයක් කරන්න නම්, අවසරයක් නැතුව ගැනීමට පුළුවන එසේ ගත හැක්කේ සාධාරණ ප්‍රමාණයකි. මේ සඳහා කොන්දේසි 2 ක් වේ.

1. එය පොදු කාරණයක් විය යුතුය.
2. සාධාරණ ප්‍රමාණයක් විය යුතුය.

හැම විටම ගන්න මූලාශ්‍රය සඳහන් කළ යුතුය.

ලංකාවේ නීතිය අනුව, රජයේ ප්‍රකාශන, ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු වාර්තාවලට ආරක්ෂණයක් නැත. ඕනෑ ම වෙලාවක උපුටා ගත හැකි වේ. පාර්ලිමේන්තු




වාර්තාවල, මන්ත්‍රීවරුන්ගේ කතාවල ප්‍රයෝජනයක් තිබේ නම් ඒවා අවසර නොලබා ම උපුටා ගැනීමට බාධාවක් නැත. පුවත්පත් වර්තාවලට ද ආරක්ෂණයක් නැත. මරදානේ බෝම්බ පිපිරීමක් ගැන වාර්තාවක් ලියා පළ කළ හොත් එහි ආරක්ෂණයක් නොමැත. ඊට හේතුව එය සිද්ධිමය කථනයක් මිස නිර්මාණයක් නොවන බැවිනි. මේ නීතියේ පදනම එය නිර්මාණයක් වීම යි. එහෙත් මරදානේ බෝම්බය ගැන කවි පෙළක් හෝ කෙටි කතාවක් හෝ ලීවොත් ඊට ආරක්ෂණයක් ලැබේ. ඒ එය නිර්මාණයක් නිසා ය.

ඈපා ලිත පිළිබඳ වත් නඩුවක් ඇසෙමින් පවතී. ඈපා ලිතත් එක්තරා ප්‍රමාණයකට නිර්මාණයකි.

විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ රැකියා ප්‍රශ්නය නිසාත්, පරිගණක ඉගෙන ගනිති. පරිගණක නොදැන ජීවත් වීම අපහසු ය. විදේශිය රටවල රැකියා ලැබෙන්නේ පරිගණකයෙනි. ඊ මේල් නිසා වෙබ් අඩවි බලා රැකියා ඉල්ලුම් කළ විට, පැය 1 1/2ක දුරකථන සම්මුඛ පරීක්ෂණයකින් රැකියාවලට යන අය සිටිති.

අද ලෝකයේ ප්‍රධාන පොත් වෙබ් අඩ වල තිබේ. පසුගිය සතියේ පිටවුණු අලුත් සඟරාවක නව වෛද්‍ය සොයා ගැනීම් වෙබ් අඩවියෙන් පිටපත් කෙරෙයි. පොතපත, සංගීතය, චිත්‍රපටි වෙබ් අඩවි වල ඇත. නීතියෙන් වැඩක් නැත. ලියනාඩෝ ඩාවින්චි ගේ ඡායාරූපය බලන්න පරිගණකයෙන් කළ හැකිය. එසේ නැතිනම් යම් කෙනෙකුගේ සංගීතයක් එමගින් පහසුවෙන් ඇසිය හැකිය.

තාක්ෂණය ක්‍රම 2ක් ඇති කර තිබේ. ඒවාට අපේ රටේ නීති බිහි වී නැත.

1. වෙබ් අඩවිවල ඇති (ජල මුද්‍රාව water mark) ලියනාඩෝ ඩාවින්චිගේ රූපයක් පිටපත් කර සඟරාවක මුද්‍රණය කළ හොත් එහි අයිතිකාරයා මේ ඡායාරූපය අරගෙන විශ්ලේෂණය කර බලයි. හරියට රුපියල් සියයේ නෝට්ටුවක ජල මුද්‍රාව සොයනව වගේ. තියෙනව නම් එයට පුළුවන් වෙබ් අඩවියෙන් අරන් තියෙන්නේ මගේ මේ ඡායරූපය යැයි ඔප්පු කර නඩු දැමිය හැකිය.
2. පොතක් වෙබ් අඩවියෙන් ගෙන කියවිය හැකිය. ඒ පුස්තකාලයෙන් පොත් කියනවනවා සේය. යුරෝපයේ හුඟක් දුරට පුස්තකාලවලට යාම අඩුවෙමින් යයි. මැලේසියාවේ සැලැස්මක් තියෙනවා හැම පවුල් 30 කම එක් අයෙකුට ඊ මේල් සහිත පරිගණක පහසුකමක් ලැබෙන විදියට ආර්ථික සැළසුම් කර ඇති බවට. පොත copy කරන්න යනවිට කොපි නොවන ක්‍රම ඇත. කොපි කළ යුතු නම් ඒ අයගෙන් අවසරය ගත යුතුයි. අපිත් ඒ තාක්ෂණයට හුරු විය යුතුය. හේතුව ලෝකය විවෘතව ඇති බහු සන්නිවේදන මාධ්‍යවල වර්ධනයයි.

අධිනීතිඥ මහින්ද රැලපනාව
(දේශනයක් ඇසුරෙන්)

# ජනමාධ්‍ය නිදහස හා වගකීම්

මාධ්‍යවේදියකුගෙන් අයිතිය සාමාන්‍ය මිනිසකුගේ අයිතියට වඩා වෙනස් වූවකි. මගේ පුද්ගලික අයිතිය මගේ අතේ කෙළවරින් අවසන් වේ. අතේ කෙළවර කාගේ හෝ නාසයක වැදුණහොත් එය උසාවි ගෙන යා හැකි වූවකි. එය පැහැදිලි නීතියකි. මට කිසිවකුගේ උරහිසෙන් අල්ලා සෙලවිය නොහැකි ය. මට ඒ සඳහා අයිතියක් නැත. එමෙන්ම මට කිසිවකුට අපහාස කිරීමට ද අයිතියක් නැත. කරුණු සත්‍ය නොවේනම් හෝ සත්‍ය වුවත් එයින් මහජන සෙතට සේවාවක් නොවේනම් යමෙකුට අපහාස කිරීමට මාධ්‍යවේදියකුට හෝ මාධ්‍ය ආයතනයකට අයිතියක් නැත. කර්තෘ කෙනෙකු හෝ මාධ්‍ය වේදියෙකු හෝ අන් කවරෙකු වුවත් කිසිවෙකුට අපහාස කිරීමට කිසිදු අයිතියක් නැත. එය පැහැදිලි ය.

ආර්. කේ. ඩබ්ලිව්. ගුණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් මේ රජය පත්කරනු ලැබූ අපේ රටේ මාධ්‍ය පිළිබඳ සියලු ම නීති සංශෝධනය හා වෙනස් කිරීම් දක්වෙන කාරක සභා වාර්තාවේ කිසි තැනක සාපරාධී අපහාස පනත ඉවත් කළ යුතු යැයි පවසා නැත. එම පනත ඉවත් කරගැනීම යෝග්‍යයි. කෙසේ වෙතත් සාපරාධී අපහාස පවත්වාගෙන යෑම අවශ්‍යයැයි රජය සිතන්නේ නම් අපි එයට විකල්පයක් ඉදිරිපත් කළෙමු.

අප ඉදිරිපත් කර ඇති විකල්පය මෙයයි. සාපරාධී අපහාසය රජයේ උසස් නිලධාරියකු හෝ ඕනෑම කෙනෙකුට විය හැකිය. දැන් පවතින නීතිය අනුව කුල ප්‍රශ්නයට ද සාපරාධී අපහාස නඩුව ගෙන හැකියි. එහෙත් කුල ප්‍රශ්නය මත තමන්ට අපහාස කළැයි යමෙකු පොලිසියට පැවසුව ද එය කිසිවකු ගණන් නොගනියි. පොලිසිය එය නීතිපතිට ද යොමු නොකරයි. මෙහි දී ඇති තත්ත්වය සාපරාධී අපහාස නඩුව පිළිබඳ තීරණයක් ගන්නේ නීතිපතියි. නීතිපති රජයෙන් වැටුපක් ලබන රජයට උපදෙස් දෙයැයි පවසන නමුත් රජයේ උපදෙස් අනුව ක්‍රියාකරන පුද්ගලයෙකි. මෙතන ඇති වරද නම් රජයට දෙන උපදෙස් නොපිළිගත හොත් රජයේ උපදෙස් පිළිගැනීමට සිදු වීමයි. මීට කලින් හිටි නීතිපතිවරු කිහිප-දෙනෙකු දුන් උපදෙස් පිළිනොගත් විට ඔවුන් රැකියාව අහකැර ගියහ. දැන් එසේ නොවේ. උපදෙස් දුන්න ද රජය පිළිනොගනියි. නඩුවක් දමන්න යැයි පවසයි. මේ තත්ත්වයට විකල්පයක් අප ඉදිරිපත් කර ඇත. මෙය බ්‍රිතාන්‍යයේ අවු: 30 ක් තිස්සේ පවතින්නක්. එහෙත් කිසි දිනෙක භාවිත කර නොමැත. මන්ද බ්‍රිතාන්‍යය රජය සාපරාධී අපහාස නීතිය යටතේ නඩු නොපවරයි. එහෙත් නීතිය පවතී. ඒ නීතිය යටතේ නීතිපතිට ස්වාධීන තීරණ ගැනීමට හැකියාවක් නැත. නීතිපතිට මෙවන් චෝදනාවක් ආ විට ඔහු එය මහාධිකරණයට ඉදිරිපත් කළ යුතුයි. එවිට මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු කරුණු විමසා චූදිතයාට එරෙහිව නඩුවක් දැමිය හැකිදැයි සොයා බලා සාධාරණ හේතු ඇත්නම් අධිකරණය විසින් තීරණය කළ පසු අධිකරණය විසින් ඔහුට විරුද්ධව නඩු පවරයි. මෙයයි අප ඉදිරිපත් කරන විකල්පය. අපි එය සම්පූර්ණයෙන් ඉවත් කරන්නයැයි පවසන්නේ නැහැ. මන්ද අප දන්නවා යම් කෙනෙකුට වැරදි චෝදනාවක් කල හොත් එය බොරුවක් නම් එය සමාජයටම බලපාන අපහාසයක්. අද රටේ පවතින තත්ත්වය අනුව යමෙකු පොලීසියට ගොස් පැමිණිල්ලක් කළොත්, අවට මිනිසකුගේ නිවසේ බෝම්බ ඇතැයි කියා, එම ප්‍රදේශයේ මිනිසුන් සැක හිතයි. බිය වෙයි. එය සාමාන්‍ය අපහාසයක් නොවේ. එය සාපරාධී අපහාසයක්. සාපරාධී අපහාසයක් වෙන්නේ එය සමාජයටම බලපාන්නක් බැවිනි. සාමාන්‍ය සිවිල් නඩුවකට එන්නේ තමන්ට පමණක් බලපාන අපහාසයක් සාපරාධී අපහාසය-ක් ලෙස පිළිගන්නේ සමාජයට බලපාන අපහාසයක්. එවැනි අවස්ථාවක යම් පුද්ගලයකුට සාපරාධී අපහාස නඩුවක් දැමීමට අයිතියක් තිබිය යුතුයි.

එහෙත් ඒ ගැන තීරණය කළ යුත්තේ නීතිපති නොවේ. අධිකරණයක් විසින් තීරණයක් ගත යුතුයි. නඩුවක් දැමිය හැකිද යන්න පිළිබඳ බව අනෙක අපට තවත් නීතියක් අවශ්‍ය වී තිබේ. අපට



අයිතියක් නැහැ තොරතුරු ලබාගන්න. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල් රාශියක තොරතුරු ලබා ගැනීමේ නිදහස පැවරෙන පනතක් ව්‍යවස්ථාවේ තිබේ. එහෙත් අද එවැනි පනතක් නැහැ. අනෙක් රටවල තිබෙන ආකාරයට මාධ්‍යවේදීන් සහ පුර-වැසියන්ට රජයේ තොරතුරු ලබාගත හැකි අයිතිය ලබාදෙන පනතක් තිබිය යුතුයි. මාධ්‍යවේදියා පුරවැසියන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙකු ලෙස මාධ්‍යවේදියෙක් හෝ පුරවැසියෙක් හෝ ලෙස ඔහුට කරුණු ඉල්ලිය හැකියි. මෙයින් දෙන්නට බැරි කරුණු තිබිය හැකිය. යුධමය රහස්, ප්‍රවෘත්ති රහස් ආදී විශේෂ කොටසකට වෙන්කර තිබෙන්නට පුළුවන්. තර්ජනයක් එල්ල කරන අවස්ථාවේ දී මේවා යුධමය රහස්‍ය. එබැවින් එවැනි පනතක් අපට අවශ්‍යයි. එය අපි දන්නෙමු. එහෙත් අධිකරණය ඇසුවොත් අපේ රටේ මාධ්‍යවේදියකුට කියන්න බැහැ 'මම මාධ්‍යවේදියෙක් නිසා රටේ සදාචාරය අනුව එය පිළිගන්නට බැහැ' කියා. මෙරටේ පවතින එක වෘත්තියකට එම අයිතිය ඇත. එය නීති වෘත්තියයි. 'මා නීතිවේදියකු නිසා ඔහු හෝ ඇය හෝ මට කීව දේ කියන්න බැහැ' කියා ඒ නීතිවේදියකුට කියන්න පුළුවන. එහෙත් දියුණු රටවල වෛද්‍යවරුන්ටද එම අයිතිය තිබේ. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න සෑම රටක ම මාධ්‍යවේදියකුට තොරතුරු ලැබුණු ආකාරය හෙළි නොකරන්නට ඇති අයිතියක් තිබේ. කතෝලික පූජකවරයකුට

ද එම අයිතිය තිබේ. අපට එම ප්‍රමාණයට අයිතීන් නැත. අප එය ඇති කර ගත යුතුයි.

මාධ්‍යවේදීන් වීම නිසා අපට වගකීමක් ඇත. වගකීමකින් තොර කිසිදු වෘත්තියක් නැත. එහෙත් අප වගකිව යුත්තේ මුලින් ම සමාජයට සහ තමන්ටයි. තමා වැඩ කරන මාධ්‍ය ආයතනයට සීමාවක් ඇතිව වගකිව යුතුයි. එහෙත් ප්‍රමාණ වශයෙන් අපේ වගකීම විය යුත්තේ අප සිටින සමාජයටයි. අප රටේ බොහෙ-ාම හොඳ කතුවැකි ලියන මාධ්‍යවේදීහු සිටිති. සමහරෙක් අවුරුද්දේ මුල් හරියේ දී ඉස්කෝලවලට ළමයින් දැමීම ගැන ලියති. එහෙත් සොයා බැලුවොත් ඒ මාධ්‍යවේදියාගේ පුතා ඉන්නෙත් හැතැප්ම 2ක් පමණ ඈත පාසලකය. ඉරාකෙට, පකිස්ථානෙට ආදී රටවලට විරුද්ධ ව නොලියන සමහර මාධ්‍යවේදීහු ද සිටිති. මන්ද මාසෙකට එකම වතාවක් වත් විස්කි බෝතලයක් එනවා. එහෙත් විස්කි බෝතලයක් ලැබීම හෝ ප්‍රිය සම්භාෂණ-වලට ආරාධනා ලැබීණි තම වගකීම පැහැර හරිනවානම් තමන්ට මාධ්‍ය-වේදියෙකු විය නොහැකියි. රේගුවේ දිනකට වැඩ කරන අයට ගෙවීමට ගාණක් නියමකර තිබෙනවා. (අල්ලස් වශයෙන් ගෙවීමට) ගිණුම්වල පවා තිබෙනවා. එය රජයට නොයන්නක්. මේ කිසිවක් පිළිබඳ ව මාධ්‍යවේදීහු නොලියති.

දේශපාලන පක්ෂ, දේශපාලඥයෝ නිසා අපගේ සමහර ප්‍රශ්න රාශියක් මාධ්‍යවල යට ගිහින්. ඉරණවිල ප්‍රශ්නයක් තිබෙනවා. එප්පාවල ප්‍රශ්නයක් තිබෙනවා. සොයන්නෙ නෑ. සොයාගෙන යන්නෙත් නැහැ. මහරගම පිළිකා රෝහල ගැන කවුද ලියන්නේ? තමන් දන්න කෙනෙක් බලන්නට රෝහලට ගියොත් එම රෝහලේ එක පැත්තකට ඇරෙන්නට අනෙක් තැන්වලට යන්නට හිතෙනවද? මේවා මාධ්‍යවේදීන්ට නොපෙනේද? තමන් සමාජ ප්‍රශ්න අමතක කර හුදෙක් දේශපාලනයැයි සිතා ගන්නා ප්‍රශ්න වාර්තා කරන්නට යෑමෙන් සමාජයට සෙතක් සැලසෙනවා ද? අපි සටන් කළේ මේ මාධ්‍ය නිදහස ලබාගන්නට ද?. මාධ්‍යවේදීන්ට වගකීමෙන් තොරව ක්‍රියා කිරීමට කිසිම අයිතියක් නැහැ. එම වගකීම තිබිය යුත්තේ මුලින් ම තමා සිටින සමාජයටයි. රටේ පවතින නීතියට ඉහළින් සිටීමට අයිතියක් නැති වුව ද තමා සමාජයට කරන සේවය ගැන සලකා බැලීම රජයේ හෝ අනෙක් ආයතනවල හෝ යුතුකමකි.

මාධ්‍යවේදියා රජයට යටහත් නොවිය යුතුය. පුද්ගලික අංශයද එසේම ය. එහෙත් පුළුවන්ද විශාල සමාගමට විරුද්ධව යමක් ලියන්නට. දිවයින වරක් එසේ ලියා බො-හොම අමාරුවෙන් උසාවි නොයා එය බේරා ගත්තා. සමහරවිට රාවය, යුක්තිය, පුවත්පත් ලිවිය හැකි යි. ප්‍රධාන පෙළේ පුවත්පත් වල ලිවිය නොහැකියි. මන්ද එම ලිපිය පළවන්නේ දන්වීම් පළ වීමෙන් එම පුවත්පත ලබන ආදයමෙන් විමයි. එම නිසා එවැනි ආයතන විවේචනය කිරීම මාධ්‍යවේදීන්ට ඉතා අමාරුයි. මාධ්‍ය-වේදීන්ව තලන්නේ පෙලන්නේ රජයක් පමණක් ම නොවේ. පුද්ගලික අංශයක් තිබෙන තුරු එම අංශය පතුරුවා ගැනීමට අවශ්‍යය නැති සමාජයක විවෘත ආරම්භයෙන් ම තර්ජනයක් එල්ල වෙයි. එය වෙනස් කර ගැනීමටත් නීති මාර්ගයෙන් ක්‍රියා කළ යුතුයි.


මාධ්‍යවේදීන්ගේ සදචාරය සහ සාරධර්ම පිළිබඳ ක්‍රියා කිරීමට මාධ්‍යවේදී සංවිධානයක් තිබිය යුතුයි. එහෙත් තවමත් පිහිටුවා ගන්නට බැරිව තිබෙන්නේ, වෘත්තියක් ලෙස පිළිගැනීමට තව ම අවකාශයක් නැති නිසාය.

ජගත් මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයට අනුව පිළිගන්නා දෙය අද ඊයේ ඇතිවූ එකක් නොවෙයි. 1945 යුද්ධෙන් පසු 1948 ප්‍රකාශනය වූ එකක් නොවෙයි. බටහිර ලෝකයේ කර්මාන්ත විප්ලවයක් සමග ප්‍රංශ විප්ලවයෙන් ඇතිවූ නිදහස සමානාත්මතාව, සහෝදරත්වය යන සටන් පාඨ තුළින් මතු වූ දෙයකි, මානව හිමිකම්.

මේ අදහස් බටහිර පමණක් නොව අපේ රටේ විශේෂයෙන් බුද්ධාගමේ ගැබ් වී තිබේ. ඒවා මානව හිමිකම් හැටියට නොවෙයි තියෙන්නේ. එවැනි කරුණක් ගැන අමෙරිකාවේ ජනාධිපතිවරයෙකු ඇසූ ප්‍රශ්නයක් නම් තමන් ජීවත් වන්නට කැමැති ආණ්ඩුවක් තියෙන පුවත්පත් නොතිබෙන සමාජයක යන්නයි. ඊකට ඔහු දුන් පිළිතුර මම කැමති ආණ්ඩුවක් ඇති පුවත්පත් ඇති සමාජයක යන්නයි. පුවත්පත් ඇතුළු ජනමාධ්‍යයන්ට ඇති බලය කුමක්ද යන්න ඉන් අපට පැහැදිලි වේ.

ජගත් මානව හිමිකම් පනතේ 19 කාණ්ඩයට අනුව ප්‍රකාශනයේ අයිතිය ඇතුළු අනෙක් අයිතිවාසිකම් තිබිය යුතුයි. ඒත් අපට තොරතුරු ලබා ගන්න අයිතියක් නැහැ. ඒ කියන්නේ තොරතුරු ලබාගන්නේ කොහොමද කියලානම් සී.අයි.ඩී. එකෙන් කොහොමද කියලා ප්‍රශ්නයක් මතු වෙයි අපේ ව්‍යවස්ථාවේ ප්‍රකාශ කර තියෙනවා අපට සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහසත් තිබිය යුතුයි කියලා. ප්‍රකාශනයේත් භාෂණයේත් නිදහසක් තිබිය යුතුයි කියලා.

විකාශන අධිකාරී පනත අධිකරණ මණ්ඩලයේ කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ආවට පස්සේ නිදහස මාධ්‍ය ව්‍යාපාරය විසින් මෙයට විරුද්ධව පෙත්සමක් අත්සන් කරලා ශ්‍රේෂ්ඨාධි-කරණයට ඉදිරිපත් කළා. එහි දී මූලික තර්කය වූයේ අපේ ව්‍යවස්ථාවේ 10 කාණ්ඩයේ ඇති එහි ආරක්ෂා කරලා තියෙන සිතීමේ හා හෘද සාක්ෂියේ ඇති නිදහසට බාධාවක් තියෙනවා නම් අපට හිතන්නට ඇති අයිතිය උල්ලංඝනය වෙයි.




අපේ ශ්‍රේෂ්ඨාධිකරණයත් සහමුලින් ම ඒක පිළිගනී. ඒක සංශෝධනය කරලා පාර්ලිමේන්තුවේ 2/3 ඡන්දයකින් හා ජන වරමකින් තොර ව සම්මත කළ නොහැකි බවට තීරණය විය. ඒ අනුව පනත අහෝසි විය. මාධ්‍ය නිදහස හෝ ඒ හා සම්බන්ධ සිතීමේ හා ප්‍රකාශනයේ, භාෂණයේ අදහස් ප්‍රකාශකරන්නට රජයේ අවසරයක් අවශ්‍ය වෙන්නෙ නැහැ. එපමණක් නොව පෞද්ගලික අංශයක වුවත් අවසරයක් අවශ්‍ය නැහැ.

ඉක්බාල් අතාස් මාධ්‍යවේදිය ගේ නිවසට රාත්‍රියේ අවිගත් පිරිසක් ඇවිත් ඔහුට තර්ජනය කලා. ඊට පසුවත් අරණායක ප්‍රාදේශීය වාර්තාකරුවෙකුට පොලිසිය මගින් තර්ජනය කර ඇත. ඔහුට පමණක් නොවෙයි. කාගේ හෝ නිවසකට අනවසරයෙන් ඇවිත් මෙහෙම තර්ජන කරන්න කාටවත් අයිතියක් නැහැ. මාධ්‍යවේදයෙකු තමා ලියූ දේවල් නිසා එසේ තර්ජනයට ලක්වෙනවා නම් ප්‍රශ්නයක් මතු වෙයි. ඉක්බාල් අතාස් මහතා Sunday Time පත්‍රයේ ආරක්ෂක විශේෂාංග ලිපි ලියන කෙනෙකි. මේ රටේ යුද්ධයක් බවනී. ඒ යුද්දෙන් පීඩාවට පත් වූවෝ කවරහුද? මුලින්ම මේ රටේ සෙබළුන්. කොටි සංවිධානවල සෙබළු. යුද්ධය පවතින ප්‍රදේශවල ප්‍රදේශවාසීන්. මායිම් ගම්මානවල පුරවැසියන්. ඒ සමඟ යුද්ධය රටේ පැතිරී යෑම නිසා නොයෙක් අයුරින් පීඩා විඳින මේ රටේ වැසියන්, සාමාන්‍ය ජනතාව. මෙවැනි සියල්ලෝම පීඩනයට පත් වන්නෝය. එහෙත් ඉක්බාල් අතාස් තීරු ලිපියේ මේ අය ගැන කිසිම සඳහනක් නැත. ඒ වගේ තියෙන්නේ මාරුවීම් ගැන වංචාවල හෝඩුවාවල් ආදී දේවල් ගැන ය. දන් මේක ඇත්ත වශයෙන්ම යුද්ධයක් පවතින විටක මාධ්‍ය වේදියෙකු විසින් කළ යුතු දෙයක් ද?

මම කණිෂ්ඨ වාර්තාකරුවෙකු ලෙස සිටිය දී වැල්ලවත්තේ පිහිටි මස් කඩයක් ගැන නගර සභාවට දන්වලා වාර්තාවක් ලියනවා ඒ නගර සභාවට අයිති මස් කඩේ හරක් මස් නියම බරට කිරන්නේ නැහැ කියලා.පසුවදට නගර සභාවෙන් ඇවිත් මස් කඩේ වටලලා ඒ කඩය වහනවා. ඒත් අද නොයෙක් පුවත්පත්වල කියනවා අහවල් දේ අහවල් හොරකම කළා කියලා .නමුත් කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ. ඡස නම් මාධ්‍යය නිදහසෙන් කෙරිලා තියෙන්නේ මොකක්ද? අර මස් කඩය වහන කාලයේ මාධ්‍ය තර්ජන තිබුණේ නැත. කවුරුවත්ම මාධ්‍ය නිදහසක් ඉල්ලුවෙත් නැත. එහෙත් එය පළ වූ පසු පුවත්පත්වල පළ වේ ඒවා ඇත්ත ද බොරු ද කියලා වත් කියන්නේ නැත. නමුත් ඒවා පළ වේ.

අප මාධ්‍යවේදය පාලනය කරන්න නීති එපා කියන්නේ ඇයි? මාධ්‍යවේදීන් කියන්නේ සාමාන්‍ය මිනිසුන්ගෙන් ඈත් වූ පිරිසක් නොව, රටේ මිනිසුන්ට බලපාන නීතිම ඔවුන්ටත් බලපානවාය යන්න මගේ විශ්වාසයයි.

අපට තියෙනවා රට රටවල සීමාවලින් තොරවූ මාධ්‍යවේදීන්ගේ සංවිධානය කියලා සංවිධානයක්. මාධ්‍යවේදියෙකු සම්බන්ධ ප්‍රශ්නයක් ආවොත් අපි ඒ සංවිධානයට වාර්තා කරන්නෙමු. ඊට පස්සේ ඒ අය මුළු ලෝකෙටම වාර්තා



කරති. ඉන් පසු ලෝකේ ඉන්න නොයෙක් නොයෙක් මාධ්‍ය සංවිධාන මගින් ඒ ගැන අපේ ජනාධිපතිට, පොලිස්පතිට, ජනමාධ්‍ය ඇමතිට දන්වයි. එවිට මානව හිමිකම් ප්‍රශ්නයක් මතුවෙයි. මේ ප්‍රශ්නය එම රටවලින් ණය ලබා ගැනීමේ දී ප්‍රශ්නයක් වෙයි.

මාධ්‍යවේදියකුට යම් මාධ්‍ය සීමාවක් තිබේ. පළමු වැන්න රාජ්‍ය රහස් පනත. එනම් රජයේ රාජකාරී කරන ඕනෑම කෙනෙක් බැඳිලා ඉන්නවා රාජ්‍ය රහස් පනත යටතේ. තමා නිල වශයෙන් කරුණු දිය යුතු කෙනාට ඇරෙන්නට වෙන කිසිම කෙනකුට එම රාජ්‍ය රහස් කරුණු දන්වන්නේ නැහැ කියලා. ඒක රජයේ සේවකයින්ට දලා තියෙන වාරණයක්. අපිට පුවත් ලබා ගන්නට අයිතියක් නැහැ. ඉතින් අපි කොහොමද පුවත්පත් ගෙනියන්නේ. ඇත්ත වශයෙන් ම මේ පනත ක්‍රියාවේ යෙදවිය හැකි ද?

අනෙක් කරුණ නම් පාර්ලිමේන්තු වරප්‍රසාද පනත. මුලින්ම ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පූදුම සත්තු ලෙස හඳුන්වමින් මෙය බිහිවිය. එය හොඳ පනතක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද තිබිය යුතුයි. වරප්‍රසාද කියලා කියන්නේ පැජරෝ වරප්‍රසාද නොවෙයි. එහෙත් කිසිම හිරිහැරයක් කරදරයක් නැතුව පාර්ලිමේන්තුවට පැමිණීමේ අයිතිය එහි දී තමන්ට ලැබෙන තොරතුරු අනුව අවංකව ඕනෑම ප්‍රකාශනයක් කිරීමට ඇති අයිතිය පිළිගත යුතුයි. එසේ නැතිනම් පාර්ලිමේන්තුවෙන් එළියට ගියාට පස්සේ තමන්ට කවුරුහරි කරදර කළොත් එයට විරුද්ධව ක්‍රියා කළ යුතුයි.

පාර්ලිමේන්තු වරප්‍රසාද පනත මෙසේ තිබිය දී කිසියම් කෙනෙක් වැරැද්දක් කළොත් පැරණි පනත අනුව තව පාර්ලිමේන්තුව විසින් එය ශ්‍රේෂ්ඨාධිකරණයට දනුම් දෙයි. අපට පෙනෙන අසවල් පුද්ගලයා අසවල් වැරැද්ද කරලා මේ ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරනවා. 1978 ත් ඒ අයිතිය තිබුණා. එහෙත් පනත ගෙනල්ලා තිබුණේ නැත. ජනතාවගේ පරමාධිපත්‍ය කියන අදහස ආචාර්ය කොල්වින් ආර්.ද. සිල්වා 1972 ව්‍යාවස්ථාවට ඇතුලත් කළාට පසුවේ ඒ අයිතිය ඇතිවුනා. නමුත් එය පාවිච්චි කළේ නැහැ. ඒ පරමාධිපත්‍ය පාවිච්චි කරමින් ජේ. ආර්. ජයවර්ධන මහතා පනතට සංශෝධනයක් ගෙනාවා. 1978 ව්‍යවස්ථාව අනුව වරප්‍රසාද පනත උල්ලංඝනය කළොත් පාර්ලිමේන්තුවට පූර්ණ ඡන්දයකින් වැරදිකරුවන් තීරණය කරගෙන ඔහුට අවුරුදු 2 ක හිර දඬුවම් දෙන්න. ඒ අනුව චෝදනාව කරන පුද්ගලයාට අයිතිය තිබුණා අත උස්සලා කියන්න අහවලා හිරේ යවන්න කියලා. ඒ පනත සම්මත වෙලා පැය 90 ක් යන්නත් කලින් ඒක ක්‍රියාවේ යෙදෙව්වා. ලෝක

හවුස් එකේ මාධ්‍යවේදීන් දෙදෙනෙකුට විරුද්ධව. වැරුදි ඡායාරූපයක විස්තරයක් සම්බන්ධ ව. එවකට සිටි විදේශ ඇමති හමීඩ් මහතා කාන්තාවක් සමඟ සිටින ඡායාරූපයක් දලා තිබුණා. ඒකට සුප්‍රකට ඇමරිකානු නිළියකගේ නමත් දලා තිබුණා. හමීඩ් අසවල් නිළිය සමඟ..... කියලා. ඇත්තටම නම් අපහාසයට ලක් වුණේ ඒ නිළිය. එයාගේ පින්තූරේ නොවෙයි දලා තිබුණෙත්. මෙය Observer පත්‍රයේ පළ වුණ පළමු වැනි මුද්‍රණයේ දී ම ඔහු ඒ වැරැද්ද නිවැරදි කළා. ඒකෙන් සෑහීමකට පත් වුනේ නැත. එය පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමක් ය කියා වහාම ඒ කර්තෘවයි, ප්‍රවෘත්ති කර්තෘවයි පාර්ලිමේන්තුවට පැමිණෙන ලෙස දැනුම් දුන්නා. පසුව ඔවුන් දෙදෙනා පාර්ලිමේන්තුවට පැමිණියට පසුව ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් විය. ජේ. ආර්. ජයවර්ධන මහතා කිව්වා ඔවුන් වැරැද්දක් කරලා තියෙනවා. ඒක නිසා රු. 2000ක් දඩ ගෙවන්න කියලා. ඒ දෙන්නාට ඒ දඩය ගෙවන්න එපා කියලා එක ලේක්හවුස් ආයතනය මගින් ගෙවන්න කියලා කීවා. හිරේ ඇරියේ නැහැ.

මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති වාගේ සංස්ථාවේ සභාපති මහාචාර්ය සිල්වා මහතා අය වැය විවාදය අවස්ථාවේ එම්. ඩී. එච් ජයවර්ධන මහතා හමුවෙලා පාර්ලිමේන්තු ආලින්දයේදී මාධ්‍ය ප්‍රශ්නයක් ගැන අසා ඇත. එහි දී ඔහු කියලා තියෙනවා ඔරුවලට ඇවිත් මාව හම්බවෙන්න කියලා. පස්සේ ඔහු මෙහෙම කියපු එක තර්ජනයක් කළා කියලා ඔහුට විරුද්ධව චෝදනා එල්ල වුනා. අයවැය විවාදයේ දී ඇමතිවරයාට උපදෙස් දෙන්න ආව නිලධාරියාට විරුද්ධව, ඇමතිවරයාට අපහාස කළාය කියලා පාර්ලිමේන්තු ගර්භය තුළ දී. එහෙම චෝදනා කර ඔහුට රු. 5000 දඩයක් නියම වුනා. ඔහු කියා හිටියා ඔහුට ගෙවන්න සල්ලි නැහැ කියලා. එය පිළිගත්තේ නැහැ. ඒ මනුස්සයා නැ ගෙදදී වහාම පොලිසියෙන් ඇවිත් එළියට ඇදගෙන ගියා. එය මාධ්‍යවේදියාට බලපෑ ප්‍රශ්නයක් නොවෙයි. ඒ සංශෝධනය තුළින් මාධ්‍යවේදීන් ආරක්ෂා කරනවා කියලා. එය කිසිය ප්‍රබල සංශෝධනයක් නෙවෙයි. එයින් මේ මුළු මහත් ජනතාවට ම තර්ජනයක් වෙනවා. මාධ්‍යයට විතරක් නෙවෙයි. එහෙත් දැන් එය ඉවත් කර ඇත. ඒත් තව භයානක සංශෝධන දෙකක් ඉතුරුවෙලා තියෙනවා. ඒවත් ඉවත්කර ගත යුතුයි. මම හිතනවා 1977 ට කලින් තිබුණු තත්ත්වයට ගෙනාවොත් සාධාරණයි කියලා.

අනෙක අපේ මේ නිදහස් සීමාව යටතේ අධිකරණයට අපහාස කිරීම. මෙයත් විශාල ප්‍රශ්නයක් වී ඇත. මේ රටේ ජෝන් ලියන්වාස් කියලා පුද්ගලයෙක් ඉන්නවා. ඔහු ඉන්දියානු ජාතිකයෙකි. මේ රටේ පුරවැසියෙකි. මේ රටේ මහජන ප්‍රවාහනය ගැන අති විශිෂ්ට දැනුමක් ඇති පුද්ගලයෙකි. ඔහු අවුරුදු ගණනාවක් අධ්‍යයනය කර මහජන ප්‍රවාහනය ගැන තොරතුරු රාශියක් දන්නවා. මොහු ලංකාවේ හිටියට අඳින්නේ අත්කොට ෂර්ට් එකකුයි, කලිසමයි. දාන්නේ සෙරෙප්පු දෙකක්. මෙහෙම ඇඳගෙන ඔහු උසාවියට ආවා. මේ විදිහට ඇඳගත උසාවියට පැමිණීම උසාවියට කළ අපහාසයක් කියා අධිකරණය තීරණය කළා.අධිකරණයට මේ වගේ ප්‍රශ්නයක් ගෙනා විට ඒ වෙනුවෙන් පෙනී සිටින්නට කිසිම කෙනෙකුට නොහැකිය. නීතිඥයොත් නීතිඥ සංගමයවත්, ඉල්ලන්නෙත් නැත. මෙතෙක් ඔවුන් කුමක්ද මේ අපහාසය යන්න ප්‍රකාශ කර නොමැත. අසවල් පුද්ගලයා මේ ග්‍රීෂ්ම රටේ ටයි, කෝට්, සපත්තු දගෙන ආවේ නැහැයි කියලා මොකක්ද ඒකෙන් උසාවියට සිදුවුණු අපහාසය කියලා කිසිම කෙනෙක් අසා නැත. කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නට වත් කෙනෙක් මෙතෙක් ඉදිරිපත් වී නොමැත.

ලේක් හවුස් එකේ Daily News පත්‍රයේ හිටියා කර්තෘ කෙනෙක් ෆ්‍රෙඩී සිල්වා කියලා. ඔහුට නඩුවකියක් පිළිබඳ ප්‍රශ්නයක් නිසා උසාවියට අපහාස කළා කියලා තීරණය උනා. අපිත් ඔහුට උපදෙස් දුන්නා ඔහු නිවැරැදිකරුය කියලා කියන්න කියලා. ලේක් හවුස් ආයතනයෙන් ඔහුට කීවා ඔහු වැරදිකරු කියලා කියන්න කියලා. තමන්ගේ හාම්පුතා බේරා ගන්න ඔහු කීවා ඔහුය වැරදිකරු කියලා. පස්සේ හය මාසෙකට හිරේ ගියා. හිරේ ඉන්න කොට හෙපටයිටිස් රෝගය හැදිලා ඔහු මිය ගියා. අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ ව මේ රටේ නීතියක් නැහැ. මිනැම විනිශ්චකාරවරයෙකුට පුළුවන් තමන්ගේ හිතුමතේට තීරණය කර අසවලා අධිකරණයට අපහාස කළා කියලා කියන්න.

කලකට පෙර නීතිපතිතුමා කොළඹ මහාධිකරණයේ සාක්ෂිකරුවෙකුට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා. නඩුවක් යන අවස්ථාවේ දී උසාවියට අපහාස කළා කියලා අහවල් හැසිරීමෙන්. අභියාචනාධිකරණයේ සිටින ජ්‍යෙෂ්ඨතම විනිශ්චකාරවරයා පැහැදිලිව කීවා උසාවියට අපහාස කිරීමේ චේතනාවෙන් යම් කෙනෙක් යම් දෙයක් කළේ නම් එය උසාවියට අපහාස කළා යැයි සලකන්න පුළුවන් කියලා. නමුත් ඔය කවුරුවත් කියපු නිසා අපට ඒක ගණන් ගන්න බෑ. ජ්‍යෙෂ්ඨතම විනිශ්චකාරවරයා අවුරුදු දෙකකට කලින් ඒක පැහැදිළිවම ප්‍රකාශ කළා. නමුත් අපට අවශ්‍යවෙලා තියෙනවා මාධ්‍යවේදියා ගැන ඉන්දියාවේ තියෙන ආකාරයට උසාවියට අපහාස කරනවා කියන්නේ මොකක්ද කියන නිර්වචනයක් කරන පනතක්. උදේට ඇඳේ වැරැදි පැත්තෙන් නැගිටලා ආව විනිශ්චකාරවරයෙක් වගේ වැඩ කරන්න නීතියක් නැහැ.

ව්‍යවස්ථාවේ තියෙනවා, උසාවියට අපහාස කිරීම යටතේ අසවල් අයිතිවාසිකම් සීමා කරන්න පුළුවන්. ඒ කියන්නේ ප්‍රකාශනයේ අයිතිය. භාෂණයේ නිදහස නවත්වන්න පුළුවන්. උසාවියට අපහාස කළාය කියලා. ඒ උනාට උසාවියට අපහාස කරනවා කියන්නේ මොකක්ද කියලා කොහේවත් සඳහන් කරලා නැහැ. ඒ නිසා එවැනි නීතියක් අපට අත්‍යවශ්‍යයි. අපි ඒක පාර්ලිමේන්තු කාරක සභාවට ඉදිරිපත් කර තියෙන කාරණයක්.

අනික හදිසි නීතිය හා මහජන ආරක්ෂක පනත. ඒ යටතේ අපි කවුරු මොනවා කිව්වත් රජයට කැමති වෙලාවක වාරණ දන්න පුළුවන්. ඒක 1948 න් පස්සේ පත් වුණු හැම රජයක් ම කළ දෙයකි. වාර්ගික සම්බන්ධතා මගින් වැඩ වර්ජන කරන අවස්ථාවල, ආගමික කෝලාහල, ජාතිභේද අවස්ථාවල මේ වගේ වාරණ දමා ඇත. සමහර විට හේතු සහිත ව විය හැකිය.

ලූෂන් රාජකරුණානායක

# කාන්තා අයිතිවාසිකම්, සමානාත්මතාව හා ජනමාධ්‍ය

කාන්තා අයිතිවාසිකම් ගැන කතා කිරීමට පෙර අයිතිවාසිකම් පිළිබඳ ව යම් ආකාරයක මූලික හැඳින්වීමක් කිරීම වැදගත් වේ. අයිතිවාසිකම් කියන්නේ ඉතාමත් ම තීරණාත්මක සිද්ධාන්ත කීපයක් මත පදනම් වූ සංකල්පයකි.

අයිතිවාසිකම් කියන සංකල්පය සිද්ධාන්ත වශයෙන් කාරණා දෙකක් මූලික වෙයි.

1. සමානාත්මතාව
2. තීරණ ගැනීමේ සහභාගීත්වය.

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කොන්දේසි දෙකකි. එකක් නම් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ අපි සියලු දෙනාම එක හා සමානයැයි විශ්වාස කිරීමය. අනෙක සියලු දෙනාටම තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වෙන්න අයිතියක් ඇත යන්නයි. මානව අයිතිවාසිකම් වල



සෛද්ධාන්තික පදනමක් වන්නේ එම කාරණා දෙකයි.

බටහිර රටවල හුඟාක් මිලේච්ඡ විදිහට මිනිස්සු හැසිරුණා. අපේ සමාජයේ පෙරදිග මිලේච්ඡත්වයේ එහෙම දකින්නට නෑ කියලා කීවත් කුලවාදය නිසා කොයි තරම් මිලේච්ඡ විදිහට අපේ රටේ මිනිස්සුන්ට අතීතයේ සලකා තිබේද? ඒ වගේ සමාජ විෂමතාවන් ඇත්ත වශයෙන්ම නැහැ කියලා හිතන එක මේ ප්‍රශ්න හඳුනා ගැනීමට සමහර විට බාධකයකි. අපට ප්‍රශ්න නැත මෙය හොඳට හැඩගැසී තිබුණු සමාජයකි යන්න මිථ්‍යාවකි. මිනිස් සමාජයේ පෙර අපරදිග භේදයකින් තොරව සමානාත්මතාව සංකල්පය හඳුනා ගත යුතුය.

මිනිසාට ගල්යුගයක් තිබුණු බව අපි දනිමු. ඊට පසු එඬේර යුගයක් තිබිණි. ඊට පසුව ගොවිතැන් කිරීමට පටන් ගැනුනි. වැඩවසම්, ධනවාදය, යනාදී වශයෙන් අපි මිනිසාගේ පරිණාමය යුග සහ මිනිසාගේ සමාජ සංවිධානයේ පරිණාමය ගැන ඉගෙන ගත්තෙමු. මීට ගනවර්ෂ ගණනාවකට උඩදී එක්තරා මනුෂ්‍ය කොටසකට පුළුවන් කියල තවත් මනුෂ්‍ය කොටසක් අයිති කරගෙන ඉන්නට, විශ්වාසයක් තිබුණි. වහල් කම කියන්නේ ඒකටයි. වැඩවසම් යුගයේ වුණත් රජතුමාට හෝ පාරම්පරික රදළ නායකයින්ට තමන් යටතේ ජීවත් වූ දයකයින්ට බලපෑමක් කිරීමට හැකියාවක් තිබුණි. ඒ කාලේ අයිතිවාසිකම් ගැන කතාවක් තිබුනේ නැත. මිනිසුන් තුළ යම් විශ්වාසයක් අනිකරල තිබුණ උපතින් තමන්ට හිමිකම් උරුමවෙලා ඉපදුනොත් හොඳයි. දසකම් උරුම වෙලා ඉපදුණොත් කරන්න දෙයක් නොමැත. ඒක විඳදරා ගෙන ජීවත් විය යුතුයි කියලා.

රජකමට ප්‍රධාන අභියෝගය එල්ල වූයේ 1789 ප්‍රංශ විප්ලවයෙනි. එය නිදහස, සහෝදරත්වය, සමානාත්මතාව කියන ඉල්ලීම් තුන මත පදනම් වූ අරගලයකි. ඒ සමග රජකම ප්‍රතික්ෂේප කළහ. රටේ සාමාන්‍ය මිනිසුන්ට යම් ආකාරයක පාලන ක්‍රියාවලියකට සහභාගී වෙන්න අයිතියක් ඇත යන්න පදනම් කරගෙන කතා කළහ. සමානාත්මතාව කියන විශ්වාසය මත අද මානව අයිතිවාසිකම් ගැන අපි කතා කරන්නෙමු. අයිතිවාසිකම් ගැන කතා කරන කොට රජකෙනෙකු හා මිනිසෙකු අතර මිය තරම් වෙනසක් තිබිය නොහැකි බව අවබෝධ වී ඇත. කෙනෙක් උපතින්ම රජකෙනෙක් වීමෙන් පසු ඔහුගේ පුතාට රජකම උරුම වෙන ක්‍රමයට වඩා පාලනය පිළිබඳව මිනිසුන්ට තීරණය ගැනීමේ අයිතියක් තිබිය යුතුය.

ලංකාවේ සර්වජන ඡන්දය ගැන කතා කරනවිට පළමුවෙන්ම කතා කළේ දේපළ හිමිකම් තිබෙන පිරිමින්ටය. දේපල අහිමි අයට පිරිමි වුණත් ගැහැණු වුණත් ඡන්ද

අයිතිය දෙන්නට කතා කළේ නැත. ගැහැණුන්ට ඡන්ද අයිතිය දෙන්නට කතා කළේම නැත. පළමුවෙන්ම සුදු පිරිමින්ට සමානාත්මතාවය ලබා දුන්නේය. ඉන්පසු කලු ජාතිකයින්ගේ විශේෂයෙන්ම ඇමරිකාවේ වහල්ලු හැටියට ජීවත්වූ කලු ජාතිකයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කළ විශාල අරගලයෙන් පසු මේ ශතවර්ෂය මුල්කාලයේ කලු සුදු භේදයකින් තොරව සමානාත්මතාවය භුක්ති විඳින්න අයිතිවාසිකම් ඇති බව පිළිගත්තේය. කාන්තාවන්ට සමානාත්මතාව භුක්ති විඳින්න අයිතියක් ඇති බව පිළිගත්තේ 1920 - 1930 ගණන් වලය. අද වනතුරුත් සමහර තලවල සමානාත්මතාව කාන්තාවන්ට ලැබී නැත. ඒ නිසා අපට කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කතා කිරීමට සිද්ධවී ඇත. මෙසේ බලන කල අයිතිවාසිකම් කියන සංකල්පය මේ ශතවර්ෂයට අයිති සංකල්පයකි. මෙයට මූලික වන්නේ සියළු දෙනාම එක හා සමානව උපදිනවා නම් එක හා සමානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය තිබිය යුතුය යන්නයි. මේ රටේ අයිතිවාසිකම් සම්භාරයක් තියෙනවා කියන විශ්වාසය හා තමන් ජීවත් වන්නේ කොහොමද තමන් පාලනය වන්නේ කොහොමද හා විසින්ද කියන එක ගැන තීරණ ගැනීමේ අයිතිය ඇත්තේ පිරිමි පක්ෂයටය. එය මේ දේශපාලන සංකල්පයකි. වරප්‍රසාද අහිමි පිරිස් සංවිධානය කිරීම සඳහා යොදගන්නා සංකල්පයකි. ඒ වගේම අයිතිවාසිකම් කියන ඒවා අද දවස වන විට නීති පද්ධතීන් හැටියට නිශ්චය කර තිබේ.

1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය මගින් ජාත්‍යන්තරව මානව අයිතිවාසිකම් නිශ්චය කර තිබේ. අපි මේ අවුරුද්දේ එහි පණස් දෙවෙනි ජන්ද උත්සවය සමරන්නෙමු. 'මානව හිමිකම්' යන්න තීරණාත්මකය. මුලින්ම සමානාත්මතාව පිළිබඳ අදහස ලෝකයේ නීති පද්ධතියට ඇතුල් වුයේ එයිනි. ජාතිය, ජනවර්ගය, ආගම, භාෂාව, ලිංගිකත්වය තුලින් මිනිසුන් අතර වෙනස්කම් කළ නොහැක සියලු ම අය එකහා සමානයි. යන ඒ සිද්ධාන්තය ජාත්‍යන්තරව පිළිගන්න නීති පද්ධතියට ඇතුල්වුයේ 1948 විශ්ව ප්‍රකාශනයෙනි. එද පටන් අද දක්වා නොයෙකුත් අවස්ථාවල එ. ජා. සංවිධානය ජාත්‍යන්තර මට්ටමේ අයිතිවාසිකම් කෙටුම්පත් කර ඇත. අද වනවිට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ගැන, සමාජ ආර්ථික සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ, ජනවාර්ගිකත්වය හෝ ජාතිකත්වය උඩ වෙනස්කම් කිරීම පිළිබඳ කාන්තාවන්ට වෙනස්කොට සලකනවාට විරුද්ධව හා ළමා අයිතිවාසිකම් ගැන සම්මුති තිබේ. නොයෙකුත් ආකාරයට කාලයෙන් කාලයට ජාත්‍යන්තර ප්‍රජාව එකතු වී ඒ. ජා. සංවිධානය හරහා කෙටුම්පත් කර ජාත්‍යන්තර ව පිළිගත්ත නීති රටාවක් මානව අයිතිවාසිකම සම්බන්ධයෙන් ඇති කර තිබේ. ඒවගේ ම ජාතික මට්ටමෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් අපේ ව්‍යවස්ථාව තුළට ඇතුලත්ය. ඒ වගේම සමානාත්මතාව පිළිබඳ යම් යම් පූර්ව කොන්දේසි හා එම නීති අපේ වෙනත් නීතිවලටත් ඇතුලත් කර තිබේ. නීතිවලින් පමණක් සමාජය හැඩ ගැස්විය නොහැකිය.

ඕනෑම සමාජයක් තුළ විවිධ විෂමතාවන් ඇත. ඒවා පන්ති විෂමතාවන් විය හැකි ය. ග්‍රාමීය ද නාගරික ද ඉගෙන ගත්තා ද නැද්ද, ස්ත්‍රී ද පුරුෂ ද, තමන් සිංහල ද, දෙමළද, ක්‍රිස්තියානි ද, බෞද්ධ ද, අපේ සමාජය දෙස බලන විට මේ සියලු ම විෂමතාවන් සමඟ අපි ජීවත් වෙමු. එක පුද්ගලයෙකු තුළ ඔය විවිධ අනන්‍යතාවන් පවතී. ඒ අපි ඒ ඒ අනන්‍යතාවන්ට අනුව අයිතිවාසිකම් භුක්ති විඳීමට තියෙන ඉඩකඩ නොයෙකුත් ආකාරයට සීමා වේ. බොහෝ ක්ෂේත්‍රවල කාන්තාවන්ට සමානාත්මතාව ඇත කියා දන් අපි පිළිගන්නෙමු. එය පොතේ හැටියට පිළිගැනීමක් භාවිතයේ දී නොයෙකුත් ආකාරයට කාන්තා අයිතිවාසිකම් භුක්ති විඳින්නට තියන ඉඩකඩ සීමා වෙයි.

අපේ සමාජයේ දෙමළ කෙනෙකුයි සිංහල කෙනෙකුයි ගත්තාම ආරක්ෂක මුර පොලක් හරහා යනකොට සිංහල අපි යම් වාසිසහගතව ඉන්නේ මොකද කියා අපි දනිමු. බස් එකෙන් බැහැල පරීක්ෂා කරන විට දෙමළ අය පැත්තකට කරනවා. සිංහල අයට යන්න කියනවා. අපි ව්‍යවස්ථාවේ මේ රටේ ජීවත්වන සියලුම පුරවැසියන්ට එකහා . සමාන අයිතිවාසිකම් භුක්ති විඳින්නට අයිතියක් තියෙන බව සඳහන්ය. එහෙත් භාවිතායේදී නොයෙකුත් විෂම-තාවන්ට මුණ දෙන්ට අපට සිද්ධ වේ. හැම විටම අයිතිවාසිකම් ගැන කතා කරන්ට සිද්ධ වෙන්නේ එවිටයි. නීතිමය රාමුවක් තුළ සාමානත්මතාව හා සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය තහවුරු කර තිබේ. අපි ජීවත් වන සමාජයේ විෂමතාවන් නිසා ම ඒ භුක්ති විඳීමට තියන ඉඩකඩ ද සීමා වෙයි.

අපේ ආර්ථික සමාජ තත්ත්වය අනුව අප ලබාගෙන ඇති උගත්කම අනුව, කොතෙකුත් සාධක පදනම් කරගෙන ඔය විෂමතා සමඟ අපි ජීවත් වන්නෙමු. ඒ නිසා හැම විටම නිතරතුරු ගැටලුවක් හා ගැටුමක් සමඟ අපි ජීවත් වන්නෙමු. අයිතිවාසිකම් ඇත. අඩුම තරමින් අයිතිවාසිකම් කියා දෙයක් තිබෙන බව බොහෝ දෙනා දනී. අයිතිවාසිකම් භුක්ති විඳීමට අපට ඉඩ කඩ නැති වූ විට සාධාරණත්වය ලබා ගැනීම යුක්තිය ලබා ගැනීම කියන ගැටළු දෙකත් සමඟ අනිවාර්යයෙන් ම අපි ජීවත් වන්නෙමු.

කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කතා කරන විට අවධි කීපයක් පසුවේ. එක්දහස් නවසිය පණස් ගණන් හැට ගණන්වල අධ්‍යාපනය ලබා ගැනීම, අයිතිවාසිකම ඉල්ලා සිටීම, රැකියාවක් කිරීමට ඉල්ලා සිටීම, තම ඡන්දය දීමේ අයිතිවාසිකම, ඉඩම්, දේපල අයිතිකර ගැනීම වැනි අයිතිවාසිකම් ඉල්ලා කරන ලද අරගලයක් දක්නට ලැබුණි.

ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය කරන විට මේ වාගේ කරුණු හෙළිවේ. එසේ වුවත් වෛද්‍යවිද්‍යාලයකට කාන්තාවන්ට ප්‍රවේශ-වෙන්ට අවසර ලැබුණේ විසි ගණන්වල ය. ඒත් මේ කාන්තාවන්ට ප්‍රවේශ වෙන්ට ඉඩ නොලැබුණ රැකියා ක්ෂේත්‍ර බොහෝ තිබුණි. කාන්තාවන්ට කළ නොහැකි ය, ඉගෙන ගත නොහැකි ය, යනුවෙන් පිළිගැනුණු නොයෙකුත් ක්ෂේත්‍රත් තිබිණි. ඡන්දය පාවිච්චි කළ නොහැකි ය කියා විශ්වාසයකුත් තිබිණි. දේපල අයිති කරගන්නත් නොහැකි ය. වැඩිහිටියන් කියා පිළිගැනීමක් නොතිබුණි. දේපල අයිතිකර ගන්නට යම් ඔප්පුවක් ලියන්න යම් දේපලක් තමන් වෙත පවරා ගන්න ඒ දේපල නැවත වරක් කෙනෙකුට විකුණා ගන්න එහෙම නීත්‍යානුකූල කොන්ත්‍රා-ත්තුවකට අත්සන් තැබීමට කාන්තාවන්ට නීත්‍යානුකූල තත්ත්වයක් නොතිබිණි. ඒ එක් යුගයක කාන්තාවක් අයිතිවාසිකම් පිළිබඳ ව කරන අරගලය ඉදිරියේ සමානාත්මතාව පිළිබඳව කළ අරගලයකි.

දෙවැනි අදියර 1960 ගණන් 70 ගණන්වලින් ඇරඹේ. බොහෝ දුරට ලංකාව වගේ රටකට යම් ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වී තිබුණි. කාන්තාවන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය විවෘතව පවතී. ඕනෑම කාන්තාවකට ඕනෑම ආකාරය විදිමත්

Scanned with CamScanner


අධ්‍යාපනයක් ලබාගැනීමට ඉඩකඩ විවෘත වී ඇත. ඉංජිනේරු පීඨය, නීති පීඨය, වෛද්‍ය පීඨය හෝ වේවා ඇතුළු වීමට හැකියාව තිබේ. රැකියා ක්ෂේත්‍රය දිහා බැලුවද කාන්තාවන්ට බාධා තිබුණත් ඒ බාධා බොහෝ දුරට අඩුවෙමින් පවතී.

1960 70 දශකයන් තුළ දේශපාලනිකව ඡන්දය දීමේ අයිතිය ලැබී තිබුණි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ මුල්ම අගමැතිනිය වීමේ ගෞරවය ලබා ගෙන ඇත. වෛද්‍යවරු හැටියට විභාග සමත් ව රෝහල්වල වෙදකම් කරන්ට ගියත් විවිධ ක්ෂේත්‍රවල රැකියාවලට ප්‍රවිෂ්ඨ වුණත් ලංකාවේ අගමැතිනිය කාන්තාවක් වුණත්, ඒ ඒ වරප්‍රසාද හා ජයග්‍රහණයන් භුක්ති විඳීමට අයිතිය ලැබුණේ එක් සීමිත සමාජ ආර්ථික, ස්ථරයකට අයිති කාන්තාවන්ට පමණි. ග්‍රාමීය නාගරික දුප්පත් නූගත් සමාජයේ කාන්තාවන්ට එද සිට අද දක්වා ම ඔය සියලු ම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩකඩ සීමා වී තිබේ.

1980 ගණන් වන විට කාන්තාවට නිදහස් අධ්‍යාපනය ලබා ගත හැකිවිය. නිදහසේ රක්ෂාවක් කිරීමට හැකිව ඇත. එහෙමනම් ඇයට ඇති ප්‍රශ්න මොනවාද?

1. සමාජයේ කාන්තාවන්ගේ ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ ව කිසිම පිළිගැනීමක් නොතිබීම. වැඩ කරනවා කියන එක අර්ථකතනය කළේ වැටුපක් ලබමින් වැඩ කරන යනුවෙනි. ඒ නිසාම ලෝකේ සියලුම කාන්තාවන් ගෙදරක තේ වක් කරගෙන, ගේ අතුගාන, ඇඳුමක් හෝදගෙන, මිදුල අතුගාගෙන කරන වැඩ කොටස ගැන කෙරෙන ආර්ථික සංඛ්‍යා ලේඛන නොවිනි. එසේ වුවත් ආර්ථික විශේෂඥයෝ පෙන්වා දුන්න කාරණාව ධනවාදී ආර්ථික ක්‍රමය සම්පූර්ණයෙන් ම රැඳී පවතින්නේ ලෝකේ කාන්තාවන් ගෙවල් තුළ පඩිත් නොලබා නොමිලේ කරන සේවාවන් මත ය, යන්නයි. ඉතින් කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය ගැන කතා කරීමේ දී ඒ අයට භුක්ති විඳීමට ඉඩ තියන අයිතිවාසිකම් හා ඒ අය සමාජයට කරන රැකියාව පිළිබඳ ව කියන මේ පරස්පරය ගැන නොයෙකුත් සංවාද මතු විය.

2. ලිංගික ප්‍රචණ්ඩත්වය. විශේෂයෙන් ම මෙය නැවත වරක් කාන්තාවන් හා පිරිමින් අතර විශාල වශයෙන් වෙනසක් කියාපෑ කථාවකි. බස් එකේ යනකොට කකුල පාගන එකේ පටන් ගෙදර ඉන්න කාන්තාවන්ට ලිංගික අතවරයන් කිරීම, බලහත්කාරකම් කිරීම දක්වා ම ලෝකය පුරාම ප්‍රචණ්ඩත්වයට කාන්තාව ගොදුරුවෙන හැටි පිළිබඳ ව නැවත වරක් කතා කරන්ට පටන් ගැනිණ. කාන්තාවකට කාන්තාවක් වීම නිසාම ප්‍රචණ්ඩතව රැසකට මුහුණ දෙන්න සිදු වී තිබේ.



3. ප්‍රජනනය හා සම්බන්ධ ගැටලු, කාන්තාව යනු ගර්භාෂයක් පිහි-ටපු ජීව විද්‍යාත්මක වස්තුවක් බවට 1980-90 ගණන්වන විට උගත් සමාජයේ මූලික පිළිගැනීමක් ඇති විය. ඒ නිසා ඒ අය දරුවන් බිහි කිරීමට ඇපකැප වී සිටී. එය ජීව විද්‍යාවෙන් ඒ අයට ලබා දී තිබෙන කාර්යභාරයකි. ඒක ඉටු කිරීම කාන්තාවන්ගේ ප්‍රධාන වගකීමකි. ඒ පිළිගැනීම පුරාතන පාලක්‍රම තුළ අපේ කාන්තාවන්ගේ ලිංගික හැසිරීම හා ලිංගික චර්යාවන් පාලනය කිරීම බැලූ විට ද දකින්න ලැබෙන්නැති, දත් ප්‍රජනන කාර්යයේ දී ස්ත්‍රී පුරුෂ සම සහභාගීත්වය අවශ්‍යය බව ජීව විද්‍යාත්මක ව පිළිගැනේ.

ශුක්‍ර මගින් ගර්භාෂය තුළ කලලයන් පිළිසිඳ ගැනීමට පුරුෂයෙකුගේ ක්‍රියාකාරීත්වය අවශ්‍යයි. උපත් පාලනය ක්‍රම වශයෙන් කාන්තාවන්ගේ ශරීරය මත එන්නත් කිරීම හෝ ගිලින පෙත්තක් හෝ ලූප් එකක් කාන්තාවන්ගේ ප්‍රජනන පද්ධතියට යටිබැසගැන්වීමක් හෝ ගත හැකි ය. කොන්ඩම් කොපුව ප්‍රචලිත වූයේ මෑතක සිට ය. එනම් ඒඩ්ස් වසංගතය ගැන හැමෝම කතා කරන විට ය. ඊට කලින් හැම දමත් අද දක්වා ම ප්‍රජනන ක්‍රියාවලිය පාලනය කාන්තාවන්ගේ ශරීරය මත පැටවී තිබිණ. ඒ ඒ ක්‍රියාවලීන් කොයිතරම් කාන්තාවන්ට හිතකර ද අහිතකර ද ?. මේ සියල්ල ද කාන්තා ප්‍රශ්නවේ.

ලෝකයේ ගබ්සාව ගැන සංවාදයක් ඇති වී තිබේ. නීතිය, පල්ලිය, සමාජය කාන්තාවකට 'ඔබ මේ ගැබ දරී යුතුයි' යනුවෙන් කියයි. ඒ ගැබ දරන කාන්තාව 'මම මේ ගැබ දරන්න කැමති නැ' කියනවානම් ගත යුතු පියවර කුමක්ද? අපේ රටේ ද අද දක්වා ම ගබ්සාව නීති විරෝධියි. විශේෂයෙන් ම තරුණ අයට නොයෙකුත් ගැටලු ඇති වේ. ගැටලු ඇති උනාම ගැහැනු ළමයි ගැබ් ගනී. ඒ ගැබ නැතිකර ගැනීමේ තදබල අවශ්‍යතාවකුත් ඇතිවේ. ගබ්සාව නීති විරෝධී කිරීම තුළ තියන උපකල්පනය මොකක්ද? සමාජයට, නීතියට, පොලිසියට, විනිශ්චයකරුවන්ට, සදචාරයට, සංස්කෘතියට මේ කාන්තා-වන්ගේ ඉතාමත් ම පෞද්ගලික වූ කාරණාවකට මැදිහත් වෙන්ට අයිතියක් ඇත.

ආර්ථික ක්ෂේත්‍රයේ ගැහැනුන්ගෙ නොමිලේ සපයන ගෘහස්ත ශ්‍රමය ගැන සමාජයේ වත් ආර්ථිකයේ වත් කිසි ම පිළිබිඹුවක් දකින්න නැත. වැඩි වශයෙන් ම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වෙන්නේ ගැහැනුන් ය. මනුෂ්‍ය වර්ගයා ප්‍රජනනය කරන්නේත් ගැහැනුන් ය. එහෙත් ඔවුනට ප්‍රජනනය කිරීමට ගරුත්වයක් හිමි වනවට වඩා ඔවුනගේ ශරීරය තලා පෙලා පාලනය කිරීමට උත්සාහයක් දරා තිබේ. එම කරුණු මත නැවත වරක් අලුතෙන් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ව සංවාදයක් ඇති විය. ඒ සංවාදය ඉතාමත් පුළුල් ආකාරයකට පැතිරුණ එකකි. අප්‍රිකාවේ ලතින් අමෙරිකාවේ, ආසියාවේ කාන්තාවන් අතර මේ අයිතිවාසිකම් පිළිබඳ ව පැතුරුණු විශාල සංවාදයක ප්‍රතිඵලයක් හැටියට අද දක්වා ම කාන්තා අයිතිවාසි-කම් ගැන කතා කරන්නට ඉඩ ලැබී තිබේ.

Scanned with CamScanner

ලංකාවේ සන්නිවේදන මාධ්‍ය හරහා අපට කාන්තාවන් ගැන මොනවද කියන්නේ? කොහොමද කාන්තා ප්‍රතිරූපය එහෙම නැත්නම් කාන්තා භූමිකාව ගොඩ නගන්නේ? අයිතිවාසිකම් භුක්ති විඳීමේ ඒ ඉඩ කඩ කොයිතරම් නම් මාධ්‍ය සීමා මගින් සීමා කරනවද, කොයිතරම් නම් පවතින මතවාදයක් තහවුරු කිරීමට මාධ්‍ය ක්‍රියාකාරී වෙනවද? කොයිතරම් නම් පවතින සම්ප්‍රදයන්ට අභියෝග කරන ගැනුන්ට මාධ්‍ය දඬුවම් දෙනව ද? සන්නිවේදන මාධ්‍යවලින් කාන්තාවක් පිළිබඳ ව පවතින ආකල්ප තියන ආකාරයට ම ප්‍රතිනිර්මාණය කිරීමක් අපට දකින්න පුළුවන. කාන්තාවට හිමි තැන මවක් වීම, බිරිඳක් වීම, ගෘහණියක් වීම, සැමියාට කීකරුව ඉඳීම වගේ ප්‍රතිරූප රූපවාහිනිය දෙස බැලුවත් ගුවන් විදුලියට සවන් යොමු කළත් ටෙලිනාට්‍ය දිහා බැලුවත් වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් දිහා බැලුවත් අපට දකින්න තියෙන දේ එවැනිම මැවීමකි. කීකරු බිරිඳ, හොඳ ගෘහනිය, තමන් කොච්චර මහන්සි වෙලා හිටියත් ගෙදර ගිහාම හිනාවෙලා තමන්ගේ සැමියාට නෙස්ටෝමෝල්ට් එක හදල දෙන ගෘහණිය, තමන් කොච්චර මහන්සිවෙලා හිටියත් 'නැදයො' නොග පිටින් ගෙදර කඩා වැදුණම වක් ගාල කීල්ස් මීට් බෝල්ස් හදල දෙන ගෘහණිය. නැදයෝ වැනි ටෙලිනාට්‍යක් ගත්තම ළමයින් සියල්ලන්ට ම කන්ට බෙදල කුස්සියට ගිහින් වළඳ දිහා බලාගෙන ඉන්න අම්මා. ඒත් ඇවිල්ල ඇහුවහම අම්මා කෑවද කියල? ඔව්, ඔව් කෑව කියල කියනවා. ඒ උනාට අපි දන්නවා හොඳටම කාල නෑ කියලා. එක පැත්තකින් අපේ සමාජයේ ජීවත්වන ගෑනු අය. ඒක නෑ කියන්න බෑ. ඔය වගේ අම්මල ඔය වගේ ගෘහණියන් අපි කවුරුත් අඳුනන්නෙමු. තමාගේ උවමනා එපාකම් යටපත් කරගෙන තමන්ගේ දරුවන්ගේ සැමියාගේ යහපත සඳහා ඇප කැප වී සිටින කාන්තාවන් අපි හඳුනන්නෙමු. මේ රටේ කාන්තාවන්ට තියන යථාර්ථය එයද? ඔය ප්‍රතිනිර්මාණය කිරීම තුළ නිදහස් වෙළෙඳ කලාපයක, කර්මාන්ත ශාලාවක වැඩ කරන කාන්තාවක්, මැද පෙරදිග ගෘහ සේවිකාවක්, අය ගැන කතා කරන කොට කතා කරන්නේ ඒ අය සුළු කොට පහත් කොට සලකන ආකල්පයකිනි. අපේ රටේ විදේශ විනිමය උපයන වැඩිම වැඩිම විදේශ විනිමය උපයන, අපේ රටේ ආර්ථිකය දරා සිටින ඒ කාන්තාවයි. ඒ අයට ගරහන, පහත් කර සලකන, හැටි සන්නිවේදන මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කරයි.

කාන්තාව ලිංගික භාණ්ඩයක් හැටියට ප්‍රතිනිර්මාණය කිරීම හුඟක් සරලව දකින්න පුළුවන. ලංකාදීප පත්තරේ මැද පිටුවේ තියන, අප හැම ද ම හිනාවෙන 'දෙයියෝ සාක්කි' 'ඔහු ඇයට ගැසූ නිසා ඇය ඔහුගේ කණ සපා කෑවා, 'රූමත් බිරිඳ පසෙකින් සිටිද්දී ඔහු ඇය උසාවියේ දී ප්‍රතික්ෂේප කළා.' ඊටත් වඩා ලස්සන භාෂාවෙන් මේවා ලියවෙයි. දිවයින, ලංකාදීප, පත්තරවල සිරස්තල අපි උදේ හැමදම විනෝදංශය කොට ඇත්තෙමු. ගැනුන්ට ප්‍රචණ්ඩ දෙයක් සිද්ධ වෙලා නම් ඒ ගැනි සමච්චලයට ලක්කරයි. කමල් අද්දර ආරච්චි දූෂණයේ දී උපකල්පනයක් වුණේ ඒ ගැහැනු ළමයා ගෙයින් ගෙට ගියා, 'කවුද කවුද ඉන්නෙ මාව දූෂණය කරගන්නේ' කියන අදහසින්. එයා ගෙයින් ගෙට ගිය මට්ටමට හුඟක් පුවත්පත් වල වාර්තා විය. අපි හැම තිස්සේම මතු කරන ප්‍රශ්නය ඇයි කාන්තාවන්ගේ ලිංගික හැසිරීම, පෙනුම, ඒ අයගේ ඇඳුම, මේ තරම් තීරණාත්මක ලෙස ඉදිරිපත් වෙන්නෙ? මේ වගේ කාරණා පිළිබඳ වත් මාධ්‍යවේදීන් සමඟ සංවාදයකට යන්න අවශ්‍යයි. ලිංගික අතවරයකට නැත්නම් ප්‍රචණ්ඩ ක්‍රියාවකට ලක්වූ කාන්තාවක් දෙස මේ ආකාරයට බලන්නෙ ඇයි කියන එක බරපතල මෙන්ම අප කනස්සල්ලට පත්කරන කාරණාවකි.

මාධ්‍යවේදීන් සම්ප්‍රදයට එරෙහිව යන කාන්තාවන්ට කරන දේ තවත් කණස්සල්ලට පත්වන කරුණකි. මොකක්ද රස්සාවක් කරනවා. රෑ වෙලා ගෙදර එනවා. කසාද බඳින්නෙ නැතුව ළමයෙක් හද ගන්නවා. කසාද බඳින්නෙ නැතුව පුද්ගලයෙක් එක්ක ලිංගිකව හැසිරෙනවා. මේවා ඒ අයට බරපතල වැරදි. 'අයෝමා' කියන චිත්‍රපටියේ කාන්තාවට ගහල මරණවා. දඬුවම ඒකයි. 60 ගණන්වල හදපු චිත්‍රපටිවල කාන්තාව සියදිවි නසා ගන්නවා. මහණ වෙනනවා. හැබැයි ජීවත් වෙන්න නෑ. සම්ප්‍රදයට එරෙහිව යන ගෑනු කෙනෙකුට මේ සමාජයේ සාමාන්‍ය යුක්ති ගරුක පුරවැසියකු ලෙස ජීවත් වෙන්න ඉඩකඩ නෑ. වන්දිය ගෙවන්න ඕන. දඬුවම් ලබන්න ඕන. ප්‍රතිරූපය එයයි. ඔය වගෙ ප්‍රතිරූපයන් ඉදිරිපත් කර කොට, ප්‍රසිද්ධියේ දඬුවම් දෙනකොට කාටද හිතේ හයියක් ඇතිකර ගන්න පුළුවන් සම්ප්‍රදායට අභියෝග කරන්න.

'මේ රටේ කාන්තාවන් සමානාත්මතාව සඳහා තීරණ ගැනීමට, සමාන අයිතිය සඳහා ඉදිරිපත්වී පෙනී සිටී යනුවෙන් මේ අනුව කෙසේ බලාපොරොත්තු තබන්නද? හැමතැනින් ම කියන්නෙ කියන විදියට ඉන්න. නැත්නම් බලාගෙනයි කියලා. සමාජයෙනුත් ඒක කියනවා. මාධ්‍යවේදීනුත් එය ප්‍රතිනිර්මාණය කරනවා. අපට ලැබෙන එක ම පණිවිඩය ඒකයි. මේ රටේ ගෑනුන්ට කිසි ප්‍රශ්නයක් නෑ. ඔය ඔය ඉඳල හිටල ටික දෙනෙකුට තියන ප්‍රශ්නයක් ගැන විතරයි මේ කථා කරන්නෙ කියලා කියනවානම් අපට ඒ ගැනත් සංවාද කරන්න වෙයි. මෙහිදී මා මතුකළේ අප පහුගිය කාලෙ යම් නිරීක්ෂණයන් හා අධ්‍යයනයන් කරල ලබාගත්ත කාරණා ගැනයි.

කාන්තා අයිතිවාසිකම් ගැන පවතින මාධ්‍ය සම්ප්‍රදයන්ට අභියෝග කරන කාන්තා පිරිස් මේ රටේ බිහිවෙමින් සිටී. නිදහස් වෙළෙඳ කලාපයෙන් පුවත්පත් කිපයක් පළකෙරේ. 'කලාපේ අපි', 'ඩා බිඳු', 'විවේකා', හා 'ස්ත්‍රී' නමින් හැඳින්වේ. ඒ අය පහුගිය කාලේ ඉතාමත් ම හොඳ පෝස්ටර් ව්‍යාපාරයක් ගෙනගියා. නිදහස් වෙළෙඳ කලාපේ අපි කියන්නේ බඩු නොවෙයි. අපි කියන්නෙ ජූකී නොවෙයි. යනුවෙන්, එය සාර්ථක පෝස්ටර් ව්‍යාපාරයකි. කටුනායක සීදූව ප්‍රදේශයම ඒ ගොල්ලන් යන එන හැම පාරක ම පෝස්ටර් අලවා ඇත. අද හුඟක් කාන්තා සංවිධාන වීදි නාට්‍ය මගින් ඒ අයගේ හැකියාවන් වර්ධනය හා අතික් ප්‍රශ්න ගැන කථා කරන මාධ්‍යයක් ලෙස භාවිතා කරයි. කාන්තා සංවිධාන ඒ අයගේ දැනුවත් කිරීම් කරන්නේ වීදි නාට්‍ය තුළින් මේ පවතින මාධ්‍ය සම්ප්‍රදයට අභියෝග කරන එකත් අපේ කටයුත්තකි. දිවයින ලේක්හවුස්, රූපවාහිනී සංස්ථාව, අයි.ටී.එන්. සිරස, එම්.වී.වී. ඔක්කොම එක වාගෙ සල්ලි ඉපයීම් පරමාර්ථය සහ පවතින දේ ඒ ආකාරයට රැක ගැනීම් පරමාර්ථය ඒ ගොල්ලන්ගෙ ආචාරධර්ම වී ඇත. ඔය දේට කාන්තාව අභියෝග කරන්නේ කෙසේද? මේ මාධ්‍යයේ ඇති ප්‍රතිරූප ගැන කාන්තා සංවිධාන වල ඇති සංවාද හරහා අද මාධ්‍යය කාන්තාවට ද අභියෝගයකි. ප්‍රධාන ප්‍රවාහයේ තියන මාධ්‍යවලට ප්‍රවේශවීමට තිබෙන ඉඩකඩ කදිනම් සීමා වී තිබේ. කාන්තාවන්ට



වෙනම මාධ්‍යයන් හද ගන්න යන තැනට බොහෝ කාන්තා සංවිධාන පත්ව සිටී.

නීතිවලින් නිදහස සීමා කිරීම සාධාරණ ද? නිදහසට යම් කිසි සීමාවක් හෝ වාරණයක් තිබිය යුතුයි. අපි කරන කටයුත්ත ඉතා උත්තරීතර කටයුත්තකි. අප අනෙක් මිනිසුන්ගේ නිදහස ගැනත් සිතිය යුතුය. අප වගකීමකින් යුතුව කටයුතු කළ යුතුය. මේ විදිහට අනෙක් අයගේ නිදහස ගැන නොසිතා වගකීමෙන් තොරව කටයුතු කරන අය අපේ ක්ෂේත්‍රයට කඩා වැදුණොත් ඒ අය සම්බන්ධයෙනුත් අප ක්‍රියා කරන්නේ නිදහස හා වගකීම අතර කිසි යම් තුලනාත්මක හැඟීමකින් ද? ඔවුන් වගකීමකින් ක්‍රියා නොකළොත් අපට ක්‍රියාත්මක වන්න වෘත්තීමය සංවිධානයක් නොපවතී.

ගෝත්‍ර සමාජවල නම් ගෝත්‍රයක කෙනෙක් වගකීමකින් තොරව කටයුතු කර ඒ ගෝත්‍රයට අවනම්බුවක් වන විදිහට කටයුතු කර තිබේ නම් ඒ තැනැත්තා ඒ ගෝත්‍රයෙන් පන්නා, දමිය හැකිය. අපේ රටේ වෛද්‍යවරුන්ට නීතීඥවරුන්ට නම් ඒ අයට වෘත්තිමය තත්ත්වයක් තිබේ. ඔවුන්ට වෘත්තිමය ආචාරධර්ම තිබේ. ඒවා නොපිළිපැද යම්විදිහකින් කටයුතු කර තිබේ නම් ඒවාට නීතිමය කටයුතු කළ හැකියි. නීතීඥවරුන්ට පවා අපේ ලංකා නීතීඥ සංගමය හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම ඒ අය කර තියෙන වැරැද්දක් ඔප්පු වුව හොත් ඔවුන්ට කොට් ගැලවිය යැකියි. ඔවුන් කිසියම් වංචාවක් කර තිබේ නම්, කෙනෙකු දුන් රහසක් හෙළි කර වෘත්තිමය වැරැද්දක් සිදු වී තිබේ නම්, යම් නඩුවකට නොයෑම නිසා නඩුව හම්බස් වෙලාතිබේ නම්. එවැනි කාරණාවල දී වැරැදිකරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට යැවේ. අපරාධ නඩු විධාන සංග්‍රහව යටතේ, 'සාපරාධී අපහාස සඳහා නීතිපතිවරයාගේ අවසරය නැතිව අධිකරණයට නඩුවක් දමිය නොහැකිය.' යනුවෙන් වගන්තියකි. එවැන්නකට නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍යයයි.

ඇතැම් කාන්තා ප්‍රවෘත්ති සම්බන්ධව සදචාරාත්මක කරුණු ලෙස ගෙන ජනමාධ්‍යවේදීහු කනගාටුව පළ කරති. පුවත්පත් මණ්ඩලය මගින් ද ඒවා සමාදන කරයි. ඒ නිසා නීතියක අවශ්‍යතාව ජනමාධ්‍යයන්ට තිබේ.

යම් යම් නීති දැඩි කරන කොට, එය ජනමාධ්‍යයන්ට බලපාන ආකාරය ඉතා දරුණුයි. නිදසුනක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය ගත හැකිය.

එම නීතිය පොලීසිය මගින් හඳුන්වාදුණි. එයට අනුව පත්තර කන්තෝරු වසා දමිය හැකි ය. මහේස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කර රඳවා තබා ගැනීමේ නියෝග එක වරම ලබා ගත හැකි ය. ඇප දීමට ද ඉඩක් නොමැත. අපහාසය කෙනෙකුගේ ජීවිතයට කළහැකි ලොකු ම බලපෑමකි. චරිත ඝාතනය කරන එක වැරදිය. ඝාතනය කළොත් නැවත ඒක ලබා ගත නොහැකි ය. ඒ නිසා අපි ජනමාධ්‍ය නිදහස, නීතිය හා වගකීම යන කරුණු තුන ම එකට සම්බන්ධ කර බැලිය යුතුය. ව්‍යවස්ථාවෙන් ලැබී ඇති නිදහස අපි පිළිගන්නෙමු. ඒ වගේ ම එය වගකීමෙන් ඉටු කරන ජනමාධ්‍යවේදී පරම්පරාවක් ඇති කරගත යුතුය. අපට වෘත්තීය මට්ටමක් තිබේ නම් මාධ්‍ය පොලිසියක් තිබේ නම් ආණ්ඩුවේ පොලිසි අවශ්‍ය නොවේ. අපට නීති තිබිය යුතු ය. එවිට අපේ වැරැදි අපට ම හඳුනා ගත හැකිය.

ජනමාධ්‍ය සම්බන්ධ ව විවේචන වර්ග දෙකක් තිබේ.

1. සාධාරණ විවේචනය

2. ද්වේශ සහගත විවේචනය. යනුවෙනි ඒ.

ඕනෑම රජයකට විරුද්ධ වීමේ හැකියාව මාධ්‍යයට තිබිය යුතුය. යහපත් පරිසරයක ජනමාධ්‍ය තිබෙනවිට ඒවාට වෘත්තීය මට්ටමින් ගොඩනැඟුණු ජනමාධ්‍යවේදී සංවිධානයක් අවශ්‍යය. එසේ නැතිව නිදහස ගැන පමණක් කතා කර වගකීම අතහරී නම් අපි ඊට එකඟ නොවෙමු. ජනමාධ්‍ය නිදහස් වීමටනම්, නිදහස් මාධ්‍ය පරිසරයක වගකීමෙන් යුතු මාධ්‍ය ඇතිවිය යුතු ය. අපේ මාධ්‍යවේදීන්ගෙන් සිදුවිය හැකි වැරැදිවලට ක්‍රියාත්මක විය හැකි එයින් සිදුවෙන කැළලක් මකන්නට හැකි මාධ්‍ය වෘත්තීය තත්ත්වයක්, සංවිධානයක් ඇති කර ගත යුතු ය.

15 (2) හා 15 (8) අනුව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කොට ඇති ආකාරයට අධිකරණයට අපහාස කිරීමත්, මාධ්‍ය අපහාසයට ඇතුළත් වේ. මෙය නීතියක් හැටියට පමණක් නොව අධිකරණයට අපහාස කිරීම යනු කුමක් ද යන්න පිළිබඳ පැහැදිලි පනතක් අවශ්‍යයි. නැතිනම් අප රටේ නීතිඥවරුන් ක්‍රියාකරන්නේ ඔවුනට අවශ්‍ය පරිදියි.

තෝල්ක මුදලි නමින් අයකු සිටි අතර නඩුවට පැමිණෙන්නා හා විනිශ්චකරුවා අතර විශාල පරතරයක් තිබිය යුතු යැයි මතයක් ද පැවතුණි. එය හරියට කුටුවා තිරෙන් දෙවියන් වෙන් කරනවා වගේය. නමුත් ඒ තත්ත්වය දැන් බොහෝ දුරට අඩු වී තිබේ. මීට ප්‍රධාන හේතුව වූයේ භාෂාවයි. එම යුගයේ දී උසාවියක වැඩි වශයෙන් භාවිතවූයේ ඉංග්‍රීසියි. මෙහි දී නඩුකාරවරයා පවසන දෑ විත්තිකරුවන්ට පැහැදිලි කර දෙන්නේ තෝල්ක මුදලියි. මුල් කාලයේ බොත්තම් හරියට නොදැමීම, අපිළිවෙලට කොණ්ඩය තිබීම වැනි දේ සඳහා අධිරණය දඩ නියම කොට තිබේ. අධිකරණය වෙතට බීමත් ව පැමිණීම අධිකරණයට අපහාස කිරීමක් ලෙස සැලකේ.

එසේ ම උසාවියට බාධා කිරීම ද අපහාසයකි. ශ්‍රී ලංකාවේ මෙයට නීතියක් නැති වුවත් සාම්ප්‍රදායික පිළිගැනීමක් ලෙස 105 (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති පරිදි අභියාචනාධිකරණයක් හෝ වෙනත් අධිකරණයක් මගින් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීමේ හැකියාව ඇත.

කමල් අද්දරආරච්චි අහෝසි වූ නඩු තීන්දුව පිළිබඳ ව රාවය පුවත්පතේ පළ 4ක සටහන් කළේය. චම්පා බුද්ධිපාල මහතා නඩු තීන්දුව දී විදේශ ගත වීමෙන් පසු ව මේ පිළිබඳ ව වැඩි දුර පරීක්ෂණයෙන් අධිකරණයේ අපහාස නීතිය

Scanned with CamScanner

පවතිද්දී ම අධිකරණයට අපහාස කිරීම ගැන රාවය පුවත්පත සිදු කළ කාර්යභාරය නිසා කමල් අද්දරආරච්චිට වසර 10 කට සිර දඬුවම් දුන්නේ ය.

එසේ ම පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනත සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවේ, නිදසුනක් ලෙස නාඩේසන් මහතාගේ ලිපි මාලාවෙන් ඇති වූ සිද්ධියේ දී එනම් 78 අංක 5 පණත පැනවූ අවස්ථාවේ දී ඔහු ලියූ ලිපි නිසා ඔහු ව ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙන ගියේය. එහි දී පැහැදිලි තීන්දුවක් දුන්නේ ය. මෙය නිතරම පාර්ලිමේන්තුව තුළ සිදුවන ක්‍රියා-වන් සම්බන්ධ දේ කථා කිරීමේ නිදහස තිබේ. එම සීමාව තුළ සිට තමා සාමාන්‍ය පුරවැසියකු ලෙස මේ පනත දකින අකාරයේ විග්‍රහකර ඇති බවත් ඔහු එය ඉටු කර ඇත්තේ ඒ සීමාව තුළ සිට යැයි තීරණය කර ඔහු නිදහස් කරන ලදි.

එසේ ම ජනමාධ්‍යවේදීන්ට තොරතුරු සොයා ගත් ආකාරය නොකියාසිටිය හැකි බව අධිකරණය පවා තීන්දු කර ඇත. නිදසුනක් ලෙස Sunday Times පුවත් පතේ නඩුව ගත හැකි ය. එහි දී සිංහ රත්නතුංග මහතා කිසිදු තොරතුරක් පැවසුවේ නැත. අධිකරණ තීන්දුවේ ඇති ආකාරයට ජනමාධ්‍යවේදියකුට තමා තොරතුරු මූලයන් සොයා ගත් ආකාරය නොකියා සිටීමේ නිදහස ඇති බව අධිකරණය පිළිගෙන ඇත. ජාත්‍යන්තර මට්ටමින් මෙය පිළිගෙන ඇත. එසේ ම යම්කිසි පුවතක් විනිශ්චයට භාජනවන පුවතක් අසත්‍යයක් නම් එම ජනමාධ්‍යවේදියාට නොකියා සිටීමේ නිදහස අහිමිවේ. යම් අවස්ථාවක විත්තිය හා පැමිණිල්ල යන පාර්ශ්වයන් දෙක ම නඩුවට අදළ පුවත බොරුවක් බව පිළිගෙන සිටියදීත් තොරතුරු දුන් පුද්ගලයා වසන් කිරීම අධිකරණයට කරුණු වසන් කිරීමකි. ලංකාවේ ද මේ නිදහස අධිකරණවල පිළිගැනේ. නමුත් මේ නිදහස වැඩි වශයෙන් ලැබී ඇතැයි මතයක් ඇත්තේ නීතිඥයන් සඳහා ය. එහෙත් ශ්‍රී ලංකාවේ ඒ සඳහා පණතක් හෝ නීතිගත කිරීමක් නැත. හුදෙක් එය වෘත්තීය අයිතිවාසිකමක් පමණි. කිසි විටක රහස් තොරතුරු නීතිඥයකුට දුන්නේ කවුද කියා නීතිඥයාගෙන් ප්‍රශ්න කිරීමට පොලිසියට කිසිදු අයිතියක් නැත. එය වෘත්තීය වරප්‍රසාදයකි. එසේ ම මේ නිදහස පුවත් පත් කලා වේදියාට ද ඇත. නමුත් උපාලි ගුණවර්ධන විනිශ්චයකාරවරයා නඩු තීන්දුවේ කියන පරිදි ජනමාධ්‍ය වේදියාගෙන් පුනපුනා ප්‍රශ්න කරද්දීත් බොරුවක් ප්‍රකාශ කිරීම නිසා ජනමාධ්‍යවේදියෙකු වශයෙන් තිබෙන අයිතිය අහෝසි වේ. ඔහු අධිකරණයට කරුණු වසන් කිරීම පිළිබඳ ව චෝදනා ලබන්නෙකි. එයට සාපරාධී අපහාස නීතිය 496 හා 497 වන පනතේ ඇති මූලික ව කීර්තිය හානි කිරීම අපහාස වශයෙන් ගැනෙන අතර දණ්ඩනීතිය යටතේ කීර්තිය හානි කිරීම වරදකි. එනම් කෙනෙකු අපහසුතාවට පත් කිරීම අපහාසයයි.

ජනමාධ්‍යවල යෙදීම දන් ව්‍යාපාරයක් වී පවති. පුවත්පත් ප්‍රධාන ආදයම් මාර්ගයක් කරගෙන තිබේ. අතීතයේ දී පුවත්පතකින් හැම දෙනෙකුට ම ලැබුණේ සුළු ලාභයකි. ඒ කාලේ පුවත්පත ජාතික වූ වැදගත් කාර්ය භාරයක නිරත විය. ඒත් ඒ තත්ත්වය අද වෙනස් ය. එබැවින් යම් සීමාවක නීතිය අවශ්‍ය නැත යනුවෙන් අප කියන්නේ ඇයි?

1980 ගණන්වල දිවයින පුවත්පතට විරුද්ධව අගමැති ප්‍රේමදස මහතා රත්මලානේ බෙලෙක් කඩේ හංදියේ කළ කථාවත් අනුර බණ්ඩාරනායක කළ කථාවත් පිළිබඳ නඩුවක් දිස්ත්‍රික් උසාවියේ දී අසනු ලැබී ය චොක්සි මහතා අගමැති ප්‍රේමදස වෙනුවෙනුත් රමේෂ් සිල්වා උපාලි පුවත්පත වෙනුවෙනුත් පෙනී සිටියේය. පුවත් පත මගින් සත්‍යලෙස ම ඔහුට අපහාසයක් වූවාද නැද්ද යන්න සොයා බැලිය යුතු අතර එයින් ඔහුට චෝදනාවට යටතේ දඬුවම් ලැබිය හැකියි.

ලංකාවේ දණ්ඩ නීතිය යටතේ හා සිවිල් නීතිය යටතේ යම් අයෙකුට සිදු වූ අපහාසය සඳහා අලාභය අයකර ගැනීමට අපහාස නඩුවක් පැවරිය හැකියි. මේ දෙක අතර පවතින වෙනස නම් සිවිල් නීතිය යටතේ දඬුවමක් ලෙස මූල්‍යමය වන්දි ගෙවීමක් පැවතිමයි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ දී බරපතල සිර දඬුවම් හා දඩ නියම කෙරෙන්නේ, ඒ අයගේ චරිතය හා අධිකරණය මගින් ඒ අය පිළිගන්නා අකාරයටයි. සිරදඬුවම් ලැබෙනුයේ සාප-රාධී අපහාසයටයි. සිවිල් අපහාසයට වන්දි ගෙවනුයේ මුදලිනි. ඒ සඳහා අනිවාර්යයෙන් දේපල තිබිය යුතුයි. නිදසුනක් ලෙස රාවය පුවත්පතේ කර්තෘ වික්ටර් අයිවන් මහතා සීවලී රත්වත්තේ මහතාට විරුද්ධව ආයුධ ජාවාරමක් පිළිබඳ ලියූ අවස්ථාවේ රත්වත්තේ මහතා එන්තර්වාසියක් එවමින් මෙපමණ මුදලක් ගෙවිය යුතුයි නැතිනම් නඩු දන බව ප්‍රකාශ කලේ ය. එහෙත් වික්ටර් අයිවන් මහතා ඒ සඳහා පිළිතුරු සැපයුවේ තමා කිසි දෙයකට බිය නොවන බවත් තමාට එපමණ මුදලක් ගෙවීමට තරම් වත්කමක් නැති බවත් සඳහන් කරමිනි. මෙහි දී ඔහුගේ වත්කම අනුව දඬුවම ද වෙනස් වීමට ඉඩතිබේ. සලකා බැලිය යුතු ප්‍රධාන කරුණ නම් ජනමාධ්‍යවේදියකු මෙලෙස බය කිරීම නොව ඒ පිළිබඳ හොඳින් සිතා බලා කටයුතු කළ යුතු බවයි.

එසේ ම යම් යම් අවස්ථාවල පුවත්පත්ද යම් යම් අපහාස සිදුවන ආකාරයට ලිපි පළකර ඇති අවස්ථා දක්නට ලැබේ. නිදසුනක් ලෙස රාවය පුවත් පත එක්තරා අවස්ථාවක දී නළුවකු ගැන සඳහන් කරමින් ඔහු මිනීමරුවකු ලෙස හුවා දක්වූයේ ය. එසේ ම ලෙනින් රත්නායක මහේස්ත්‍රාත්වරයකු ගැන ලිපියක 'අසූචි වලින් ගැසුවා', හොර අඹුවක් සමඟ සිටියා' ආදී වශයෙන් පළකර තිබුණේ ය. මේවාට රාවය පුවත්පතට නඩු නැත. එවිට එය සත්‍ය තොරතුරක් ලෙස ජනතාව අතර මතයක ගොඩ නැගේ.

මෙය නොකළ යුතුයි කියා කොතැනක හෝ කිසිදු සටහනක් නැත. මෙවැනි දේ පුවත්පත්වලින් කළ යුතුයි. ගවේෂණාත්මක




ව කළ යුතුයි. එවැනි දේ මහජනයාගේ යහපත උදෙසා කෙරෙනවාද යන්න මෙහි ඇති ප්‍රශ්නයකි. පුවත්පත් මිනිසුන්ට ඇති වැදගත්කම කුමක් ද? ඒවා වගකීම් අවධාරණය කරගෙන වගකීමෙන් ක්‍රියාකරනව ද? එසේ නම් ඒ ජනමාධ්‍ය පිළිබඳ අපට සතුටුවිය හැකි ය.

සුනිලා අබේසේකර
(දේශනයක් ඇසුරෙන්)

# සාපරාධී ක්‍රියා අපහාස නීතිය හා අධිකරණ අත්දැකීම්

සාපරාධී අපහාස නීතිය කියන එක සලකා බැලීමට පෙර එහි පසුබිම ගැන සලකා බැලීම අවශ්‍යයි. සමහර අයට වත්කම් දේපලවලට වඩා වැදගත් වන්නේ කීර්තියයි. ඒ වගේ කෙනෙකුට අපහාස වන කරුණු තව කෙනෙක් ප්‍රසිද්ධියට පත් කළොත් එයින් එවන් පුද්කලයකුට සිදුවිය හැකි හානිය අසීමිතයි. මේ හානි ගැන සලකන විට අපට තලයන් දෙකක් ගැන කල්පනා කරන්න සිදු වෙයි. එකක් තමයි කෙනෙකුට අපහාස වන දෙයක් තවත කෙනෙකුට, යම් කණ්ඩාමකට, තමන් ඉන්න කණ්ඩායම ඇතුළත ප්‍රකාශ කළ හැකිය. එවැනි වටාපිටාවක පරිසරයක අපි අද ජීවත් වෙමු.

අපි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඉතා ම සුළු පිරිසකට අයිතිවාසිකම් සලසා දෙන මාධ්‍යයකටයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මේ රටේ ධනය තියෙන, බලය තියෙන අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොදගන්නා උපක්‍රමයකි. එයින් කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි කියන එක නෙමෙයි. නමුත් ප්‍රජාතන්ත්‍රවාදීය කියලා විවිධාකාර බලවතුන්ට පුළුවන් ජනසන්නිවේදන මාධ්‍යයන්ට තමන් දකින කරුණු නිසියාකාර ව ජනතාව හමුවේ කියන්න පුළුවන් විය යුතුයි. ඒ කාරණා ජනතාවට හෙළිදරව් කරද්දී ජනසන්නිවේදන මාධ්‍යයට එරෙහි ව යමෙක් නීතිය පාවිච්චි කරනවානම්, ඒකත් බරපතල ප්‍රශ්නයක්ය. ජනසන්නි-වේදන මාධ්‍ය තුළින් පාලකයා හෝ වෙනත් අයෙක් හෝ ජනතා යහපත සඳහා යම් යම් කරුණු ප්‍රකාශ කිරීම, ජනතාව දැනුවත් කිරීම, සිය-යට සියයක්ම නිවැරදිව වාර්තා



හැකි යි. ඒ වගේ ම අද ජනසන්නි-වේදන මාධ්‍ය බොහොම දියුණු වී ඉලෙක්ට්‍රෝනික යුගයට අපි පා තබා සිටින්නෙමු. ජනසන්නිවේදන මාධ්‍ය තුළින් විශේෂයෙන් රූපවාහිනිය වැනි ප්‍රබල මාධ්‍යයන් තුළින් හෝ පුවත්පත් තුළින් හෝ කෙනෙකුට අපකීර්තියක් වන දෙයක් ප්‍රකාශ කළොත් සමහර විට මිනිත්තුවක් දෙකක් හෝ මිනිත්තු කීපයක් ඇතුළත මුළු ලෝකයාම ඉදිරියේ ඔහු විනාශකර දමිය අපේ සමාජයට අහිතකර යම් යම් දේ සිදු කරන්න. නීති මගින් පමණක් ම පාලනය කිරීමට නොහැකි ය. එවැනි අවස්ථාවක දී ජනසන්නිවේදන මාධ්‍යයකට ඉතාමත් වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට සිදු වේ. ප්‍රජාතන්ත්‍රීය කියන බලපිරිස මේව්වල් කරන්න පාලනය කරන්න අපට යොදගන්න පුළුවන් එකම මාර්ගයත් ජනසන්නි-වේදන මාධ්‍යයන් ය. මහජන යහපත ගැන සලකා බලද්දී මේ කළයුතුයි කියලා තහංචියක් පැනෙව්වොත් කිසිම කෙනෙකුට පුවත්පතකින් කරුණු දක්වන්නට නොහැකි ය.

පොදු යහපත සඳහා කරුණු ඉදිරිපත් කරන විට ඒ අය සඳහා අපි නීතිය පාවිච්චි කරනවානම් එතන දී පැන පාවිච්චි කරන්නා පැන පාවිච්චි කරන්නේ කෙයෙන් හේතුව, ටිකක් එහා මෙහා වුණොත් හිරේ යන්න වෙයි, අධික වන්දි මුදලක් ගෙවන්න වෙයි කියන බය

නිසා ය. එතැන දී මහජන යහපත සඳහා පැවසිය යුතු දෙයක් නීතිය මඟින් සීමා කිරීමකට ලක් කෙරේ.

පුවත්පත් කලාවේදියා කියන්නේ ජනසන්නිවේදන මාධ්‍යයන්ටමයි. අනෙක් පැත්තට ජනසන්නිවේදන මාධ්‍ය පාලනය කරන අයට තමන්ගේ පෞද්ගලික හේතූන් මත පුද්ගලයෙකු ව විනාශ කර දමන්න පුළුවන්. අයිතිවාසිකම් තුලනාත්මක කරන්නත් පුළුවන්. එක පැත්තකින් පුවත්පත විදියට නිදහස තිබිය යුතුයි. අපි පුද්ගලයින්ව ආරක්ෂා කළ යුතුයි. වැරදි ආකාරයට මාධ්‍යයන් මෙහෙයවීම හේතුකොට ගෙන යම් කෙනෙක් විනාශ වීමෙන් ඔහුව ආරක්ෂා කරන්න පුළුවන් නීති ක්‍රමයකුත් අප සකස් කළ යුතු යි. අපි එකිනෙකා හා ගැටෙන ප්‍රශ්නයකට මුහුණ දෙන්නෙමු. මේ ප්‍රශ්නය තුළ දී තමයි නීතිය කොයි ආකාරයට ක්‍රියාකරනවාද ? කොයි ආකාරයට ක්‍රියාත්මක විය යුතු ද යන්න වැදගත් වන්නේ සමහර අය සාපරාධී අපහාස නීතිය සම්පූර්ණයෙන්ම නීති පොතෙන් ඉවත් කරන්නැයි කියා සිටිති. තවත් සමහරු එය එසේ නොකළ යුතු යැයි කියති. මම සිටින්නේ දෙවෙනියට කී සාපරාධී අපහාස නීතිය නීති පොතෙන් ඉවත් නොකළ යුතුයි කියන පැත්තේ.

මා හමුවීම සඳහා මේ ළඟදී කාන්තාවක් ගාල්ල පැත්තේ සිට පැමිණියා. ඒ කාන්තාව කියා සිටියා දනට මාස හතරකට පමණ පෙර ජාතික කියන පුවත්පතක පුවතක් පළවුණාය කියලා, ඇය ගාල්ලේ ගණිකා මඩමක් පවත්වා ගෙන ගිය බවත්, ඒ මඩමේ ඉඳලා කාන්තාවන් දෙන්නෙක් පොලීසියට අල්ලා ගෙන ගිය බවත්, ඇයත් පොලීසියට අල්ලා ගෙන ගිය බවත්. එහෙත් මේ කාන්තාව ගණිකා මඩමක් පවත්වා ගෙන ගිය කෙනෙක් නොවේ. ඇගේ සැමියා මොකක් හරි අයත් සමග ප්‍රශ්නයක් වෙලා. මම හිතනවා ඒ සැමියා යම් කිසි ක්‍රියාදමයක් තුළින්



පොලීසිය මෙහෙයවලා, ඒ ගෙදර හිටපු තවත් කාන්තාවන් දෙදෙනෙකුත් ඇයත් පොලිස් අත්අඩංගුවට ගත්තා. ඊළඟ දවසේ ඒ කාන්තාව කඳුළු හළමින් මගේ කාර්යාලයට ඇවිත් අඬ අඬා කිව්වා මම එද ඉඳින් එළියට බහින්නේ නෑ. එළවළු ගන්න යන්නේ ත්‍රීවිලරයක් අරන්. එතනින් එහාට මම එළියටවත් යන්නේ නැහැ. මොකද මම බොහෝම හොඳින් ජීවත් වෙච්ච කෙනෙක් ගණිකා මඩමක් පවත්වා ගෙන ගිය කෙනක් කියලා මාව දන් හංවඩු ගහලා තියෙනවා. මට ලෝකයට මුහුණ දෙන්න බෑ. මට දන් හිතෙන්නේ ජීවිතය හානි කර ගන්න එක හොඳයි කියලා.

ඒ මනුස්සයා දුප්පත්. එහෙත් තමන්ගේ චරිතය තමන්ගේ කීර්තිය වෙනත් සියලු දේට වඩා අගය කොට සලකපු කෙනෙක්. කොළඹ පත්තර කන්තෝරුවක ඉන්න මහත්තයෙක් බොහෝම ලොකු පොල්ගෙඩි අකුරුවලින් පුවත්පතක මේ වගේ දෙයක් පළ කළොත් තව කෙනෙකුට සිය දිවි හානි කරගන්න තත්ත්වයකට පත්වෙන්න පුළුවන්. පුවත්පත් කලාවේදියෙක් නිදහස ආරක්ෂා කරන ගමන්, ඒ ප්‍රබල මාධ්‍ය ඉදිරියේ අසරණ වන අයත් ආරක්‍ෂා කරන්නේ කෙසේද?

අද ලංකාවේ ස්වාධීන යැයි කියන්න පුළුවන් එකම පුවත් පතක් වත් නැත. සියළු පුවත්පත් ඒ පුවත්පත් අයිති පුද්ගලයින්ගේ පාලනය යටතේ පවතී. එම පුවත්පත් අයිති අයට අවශ්‍ය වූ විටදී ඒ පුවත්පත් තමන්ට අවශ්‍ය ආකාරයට හසුරුවන්න අයිතිය තිබේ. අපි මේ මාධ්‍ය නිදහස ගැන කතා කළත් ඒ මාධ්‍යවේදියාත් සමහර විට ඒ පුවත්පත් අයිතිකරුගේ අවශ්‍යතාවය අනුව කොටුවේ. දෙවන කාරණය ඔය නිදහස් මාධ්‍යවේදීන් කියන අයත් විවිධාකාර හේතූන් නිසා සමහර විට මුදල් බලයට, සමහර විට වෙනත් හේතූන් මත අනිසි ආකාරයට පැන හසුරුවති.

අනෙක පැත්ත මහජන යහපත සඳහා ඒ නිදහස ආරක්ෂා කර ගැනීමයි. මේ සාපරාධී අපහාස නීතිය ගැන අපි ටිකක් විමසා බලමු. කෙනෙකුගේ කීර්තියට හානිවන ආකාරයට යමෙක් යම් ප්‍රකාශයක් කළොත් ඒ ක්‍රියාදමය හේතුකොට ගෙන ඇතිවිය හැකි දෙවර්ගයක නීති කටයුතු තිබේ. එකක් නම් සිවිල් නීතිය යටතේ ඒ හානිය වූ පුද්ගලයාට පුළුවන් අලාභ ඉල්ලා සිවිල් අධිකරණයට නඩු පවරන්න. අනෙක තමයි අපරාධ නීතිය යටතේ ඒ වරද කළ අයට දඬුවම් කිරීමේ අරමුණින් අපරාධ නඩුවක් මෙහෙයවන්න. දන් ඔය දෙක අතරේ, කෙනෙකුට කියන්න පුළුවන් හොඳයි සිවිල් නීතිය යටතේ තමන්ට හානිදයක යමක් වූවානම් ඒ පුද්ගලයාට පුළුවන් ඒ අලාභ අයකරගන්න. කියන්නනම් ලේසියි, ඒත් අධිකරණයට ගොස් ඒ නඩුව කෙරෙන ආකාරය බැලුවාහම් තමන්ට පැහැදිලි වේවි, සිවිල් නඩුවක් පවරලා අයකර ගන්නවා කියන එක එතරම් ලේසි නැති බව.

**හිටපු අතිරේක සොලිසිටර් ජනරාල්**
**ඒ.එස්.එම්. පෙරේරා**
**(දේශනයක් ඇසුරෙන්)**


# ජනමාධ්‍ය නිදහස පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

ජනමාධ්‍ය නිදහස අපි ඉතාමත් ආදරයෙන් භක්තියෙන් සලකන්නෙමු. සියලු ම දෙනා කැමති, ආශා කරන, ආශා කළ යුතු දෙයක් ගෞරව කළ යුතු දෙයක් තමයි ජනමාධ්‍යට නිදහසක් තිබිය යුතුයි කියන කාරණය. මෙය අද ඊයේ පිළිගැනුණ දෙයක් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම සමග පැමිණි පුද්ගලයාට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ලැබෙන අයිතිය පසු කලක දී ජනමාධ්‍ය කෙරෙහි පැවරුණ වගකීමක් විය. පුද්ගලයන් අතර තිබෙන සාමාජයීය වශයෙන් සහ දේශපාලනමය වශයෙන් වැදගත් වන අදහස් උදහස් පතුරුවන්නට තිබෙන හැකියාව තිබෙන්නේ ජනමාධ්‍යවලටයි. ජනමාධ්‍යයනට මේ නිදහස තිබිය යුතුයි. ජනතාව හා පාලකයින් අතර පාලමක් හැටියට මේ ජනමාධ්‍ය ක්‍රියා කරයි. අදහස් ප්‍රකාශ කිරීමට මුද්‍රිත මාධ්‍යවලට වඩා අද විද්‍යුත් ජනමාධ්‍ය ඇත. මේ නිදහස වඩාත් පුළුල් ලෙස පාවිච්චි කරන්නට පුළුවන් ජනමාධ්‍යවලට ය.

වර්තමානයේ මේ නිදහස අපට ලැබෙන්නේ නීතියෙනි. ස්වභාවික සත්වයෙක් හැටියට අපට නිදහස තිබිය යුතුයි කියල කිව්වට දියුණු යුගයක නම් අපට මේක ලැබෙන්නේ ව්‍යවස්ථාපිත රාමුවක් මතය. මේ ව්‍යවස්ථාපිත තත්ත්වය 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් බිහි විය. ඒ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තිය ලෝකයේ සියලු දෙනා පිළිගන්නා තත්ත්වයට පත්විය.

ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ඇති රටවල්වල සියලු දෙනා මේ නිදහස අගය කරන නිසාත් 1948 මුල් වරට ව්‍යවස්ථාපිත රාමුවක් තුළ පුද්ගලයාට කතා කරන්නට නිදහස ලැබිණි. තම මතය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් සෑම කෙනෙකුට ම තිබේ. ඒ වගේ ම අදහස් ප්‍රකාශ කරන්න, අදහස් ලබා ගන්නට, දැනුම සොයා ගන්නට, ඒ සියලු අයිතිවාසිකම් ඇතුළුව අයිතීන් සියලු දෙනාටම තියෙනව කියලයි 19 වගන්තියෙන් පැහැදිලි වන්නේ. මෙහි අපට මුල්වරට අත් දකින්න ලැබෙන්නේ 1972 න් පසුවයි.

1972 ව්‍යවස්ථාවේ 06 වන පරිච්ඡේදය ගැන අපි දන්නෙමු. ඒ පරිච්ඡේදයේ සෑම පුරවැසියෙකුට ම තම අදහස් පළ කරන්නට, ප්‍රකාශයට පත් කරන්නට නිදහස ඇති බව සඳහන් වේ. ඒ නිදහස 78 ව්‍යවස්ථාවෙත් නොතිබුණි. මේ නිදහස අගය කරන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල, තම තමන්ගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවල, පිළිගන්නා දේ කුමක් ද යන්න ගැබ් කර තිබේ. 72 ව්‍යවස්ථාවෙත්, 78 ව්‍යවස්ථාවෙත් නොතිබුණු පරිදි 94 යෝජිත ව්‍යවස්ථාවේ එය සඳහන්ව තිබේ. යෝජිත ව්‍යවස්ථාවේ 16 වන වගන්තියේ සෑම තැනැත්තෙකුට ම, පුරවැසියෙකුටම පමණක් නොවෙයි ලංකාවේ වෙසෙන ඕනෑම පුද්ගලයෙකුට (පුරවැසිභාවය අවශ්‍ය වෙන්නේ නැහැ.) මේ නිදහස භුක්ති විඳීමට අයිතිය ඇති බව සඳහන් කර තිබේ. නවසිය හැත්තෑ ගණන්වල පමණ ඉතා පුළුල් විදිහට ලංකාවේ නිදහස පතා බිහි වූ ව්‍යාපාර තිබේ. විශේෂයෙන් ජනමාධ්‍ය නිදහස ගැන කතා කරන ව්‍යාපාර බිහි වුණේ නවසිය හැත්තෑ ගණන් වලින් පසුව ය. 94 න් පසු නිදහස දියවී ගියා එක කාලයක් කිව්වෙමු. නිදහස අවශ්‍ය සියලු දෙනා ම ඒ නිදහස



ලබාගත යුතුයි. ඒක සාක්ෂාත් වෙන්නේ නැත්නම් ලබාගතයුතු අයිතිවාසිකමක්ද?

72, 78 ව්‍යවස්ථාවල හා 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ද ව්‍යවස්ථාපිත රාමුවක් තුළ අපට නිදහසක් ඇති බව සඳහන් විය. ඉන් අපි සෑහීමකට පත් ව හෝ නැතිව හෝ සිටින්නෙමු.

මේ ව්‍යවස්ථාපිත රාමුවක් තුළ ලැබුනේ නිදහස ද? නිදහස ලැබුනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාපිත රාමුව තුළ නම් ඒ වූ නිදහස අපි පිළිගනී නම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ දක්වා ඇති නිදහසේ සීමාවක් ද අපි පිළිගෙන කටයුතු කළ යුතුයි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබුණු නිදහස පිළිගනී යන්න නිදහස් මාධ්‍ය ව්‍යාපාරයවත් මාධ්‍ය වෙනුවෙන් පෙනී සිටින කිසිම ව්‍යාපාරයක් වත් පිළිගන්නේ යැයි සිතිය නොහැක. අද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) අ යටතේ ස්ථාපනය කර ඇති යම් නිදහසක් වේ නම් එය කඩවන විට ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම් අධිකරණයට ඉදිරිපත් කිරීමට මාධ්‍යවේදීන් හෝ ඒ කඩවීමට ලක් වූ පුද්ගලයන් කටයුතු කරයි නම් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒ තියෙන සහනයත් අප ලබාගන්නට උත්සාහ කරයි නම් ඒ ව්‍යවස්ථාව යටතේ තියෙන සීමාවන් ද පිළිගත යුතුයි. අපට සීමාවන් පැහැදිලිව දක්වා තිබේ. ජේ.ආර්. ජයවර්ධන යුගයේ බිහි කළ 78 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව භුක්ති විඳිනව නම් ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ අප උත්සාහ කරන්නේ නිදහස ලබා ගන්න. එවිට 15 (2) හා 15 (7) ව්‍යවස්ථාවන් යටතේ අනු ව්‍යවස්ථාවන් ඔබට ලබා දුන් නිදහස මෙන්න මේ සීමාවන්ට යටත් ය යන්න පෙන්වා දී ඇත.

මේ 14 ව්‍යවස්ථාවේ පිළිගත් දේවල් සීමා කරන්න පුළුවන් මොන මොන අවස්ථාවල ද යන්න 15 (2) ව්‍යවස්ථාවේ තිබේ.

ඒ හැරුණු විට හදිසි නීතිය යටතේ අපට සීමාවක් නැද්ද? 155 නීතිය යටතේ ඒ හැරුණාම පුවත් පත් මණ්ඩල පනත යටතේ අපිට සීමාවක් නැද්ද? දණ්ඩ නීති සංග්‍රහයේ 496, 497 වගන්තිවල තියෙන අපහාස සම්බන්ධ වරදට සිර දඬුවම් නියම කළ හැකිය. මේ සීමාවන් පිළිගන්නවාද නැද්ද, කියන එක තීරණය කරන එක අයිති කාටද? ජනමාධ්‍යවේදීන්ට යම් සීමාවන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු ය යනුවෙන් අපි කියන්නෙමු. අපේ ඕනෑම ජනමාධ්‍යවේදියෙකු 15 (2) 15 (7) ව්‍යවස්ථාව යටතේ සීමාවන් තියෙන බව පිළිගනී. සීමාවන් පැනවීම වරදක් ද කියන එක ගැන අප සිතා බැලිය යුතු ය.

රටක ජනමාධ්‍ය කෙතරම් ප්‍රබලද? පුවත්පත් හෝ ගුවන් විදුලිය හෝ රූපවාහිනිය හෝ අපිට ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක කොතරම් වටිනා කාර්යභාරයක් ඉෂ්ඨ කරනවා ද? ඒ වගේ ම කොතරම් ප්‍රබල ලෙස ක්‍රියා කරනවා ද? කොතරම් දෙයක් ජනමාධ්‍යයට කළ හැකි ද? ඒ අයිතිය රැක ගැනීම යනු වගකීමෙන් යුක්තව ජනමාධ්‍ය ක්‍රියා කළ යුතුය යන්නයි.

රාවය පුවත් පතෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ, මූලික අයිතිවාසිකම් සම්බන්ධ නඩුවක් ගොනුකර තිබේ. මෙය අවධානය යොමු කළ යුතු තත්ත්වයකි. ජනමාධ්‍යකරුවකු වූ රාවය කර්තෘ වික්ටර් අයිවන් මහතා තමන්ට නීතියෙන් ලැබී ඇති නිදහස ක්‍රියාත්මක කරන්න උත්සාහ ගනී. එහෙත් ජනමාධ්‍යවේදියෙක් ලෙස නිදහසේ ක්‍රියා කරන්නට යනවිට නොයෙකුත් ආකාරයේ නඩු ඔහුට විරුද්ධව ද්වේශ සහගත අයුරින් ගොනු කෙරේ. භාෂණයේ ප්‍රකාශනය කිරීමේ හා අදහස් පළ කිරීමේ නිදහසට ද්වේශ සහගතව නීතිපතිවරයා කටයුතු කරයි. ජනමාධ්‍යකරුවාට තියෙන නිදහස වලක්වන්න අනිසි ආකාරයෙන් ක්‍රියා කළ නොහැකි ය. රජය වෙනුවෙන් නඩු ගොනු කරන නීතිපති වරයා මේ වගේ පුවත් පතකට විරුද්ධව නිරන්තරයෙන් නඩු පැවරීමෙන් ඒ පුවත්පත් කරුවාගේ නිදහස සීමාවේ. නො එසේ නම් උල්ලංඝනය වෙනවා කියල නඩුවක් ඒවි කියල අපි නම් කවර ද වත් නොසිතුවෙමු. ඒ ගැන නීතිපතිවරයාගෙන් ඇසූ විට මේක පනතට පනතේ වැඩක් යනුවෙන් පැවසීය. දෙපැත්තට ම කරුණු ඇත. වර්තමානයේ පවත්නා ව්‍යවස්ථාව කවුරු ඇති කළත් ශ්‍රේෂ්ඨාධිකරණයට තමන්ගේ නිදහස කඩ වේ යැයි කිව හැකි 126 ව්‍යවස්ථාව යටතේ ඇති අයිතිය, මූලික පියවරකි. එය විස්තරාත්මක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ඇති කළ නීතියකි. එය ආපස්සට ගත නොහැකි ය. ඉදිරියට යයි. ඒ නිසා මෙය ජනමාධ්‍යවේදීන්ගේ නිදහස ගැන කතා කරන විට ඉතා ඥානාන්විත ව අධ්‍යයන කළ යුතු ය.

ජනමාධ්‍යවේදීන්ගේ නිදහස සීමා කරන්න ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් බලය නැද්ද? අපි බලයක් ඇතැයි සිතමු. ජනමාධ්‍යවේදීන් අපේ අයිතීන් උල්ලංඝනය කරන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ඇති බව කියයි. ජනමාධ්‍යවේදීන්ට අසීමිත වූ නිදහසක් මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී නොමැත. යම් යම් සීමාවන් පැනවිය හැකි ලෙස නිදහස දී තිබේ. හැන්ද අතේ තියාගෙන බෙද ඇත. ඒ නිසා ඒ හැන්ද තියෙන පැත්ත දෙස බැලිය යුතු ය.

15 (2), 15 (7) ව්‍යවස්ථාව යටතේ ඇති කළ හැකි යයි කියන සීමාවන්



සාධාරණ ද යන්න විමසිය යුතුය. පාර්ලිමේන්තු හා ආගමික

සහයෝගීතාව තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තු වරප්‍රසාද, අපහාස, අධිකරණයට අපහාස කිරීම මේ සියල්ලම ආරක්ෂා කරන්න නීති පැනවී නැති බව අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තිබේ. ඒ අතර ම සෑම පුරවැසියෙකුටම භාෂණයේ හා ප්‍රකාශනයේ ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ හිමිකම් ඇත්තේය යනුවෙන් ද සඳහන් ය. මේ දෙක අතර තුලනයක් අවශ්‍ය ය. 14 (අ) හි සඳහන් භාෂණයේ, ප්‍රකාශනයේ හා අදහස් පළ කිරීමේ නිදහස ඇත්තේය යන්නෙන් නිදහස කියනවා සේම, 15 (2), 15 (7) අනු ව්‍යවස්ථා මගින් අපේ වගකීම ගැන කියවේ. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා අනු ව්‍යවස්ථාව යන දෙකෙන්, එකකින් නිදහස ගැන කියනවා සේම එකකින් අපේ වගකීම ගැන කියවේ. තුලනයක් ඇති කරගන්න විට, කවරෙකුට හෝ අඩු පාඩුවක් වේද යන්න විමසිය යුතුය.

14 ත් දුන් නිදහස මුළුමනින් ම දෙනවා විනා 15 (2) 15 (7) ත් අයින් කරන්න සීමා කරන්න එපා යැයි තර්කානුකූලව වූ අපට සාධාරණ වූ කරුණු ඉදිරිපත් කරන්න හැකි නම් වැදගත් ය. මෙවා දෙස ප්‍රායෝගිකව බැලිය යුතුය.

94 වර්තමාන රජය බලයට පත් වූ පසු කමිටු කිහිපයක් පත් කරන ලදි. ආර්.කේ.ඩබ්ලිව්. ගුණසේකර වාර්තාවේ අතුරු වාර්තාව, ඊළඟ වාර්තාවන් අනුව සාපරාධී අපහාස නීතිය සම්පූර්ණයෙන් ම අයින් කරන්න කියල ඉල්ලීමක් කර තිබේ. සාපරාධී අපහාස නීතිය, වර්තමාන බලපවත්නා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වේ. අපරාධ නීතියේ ජනමාධ්‍යකරුවා අපරාධ-කරුවෙක් නොවේ. අපරාධ නීතියේ 479 හා 480 කියන වගන්තිවල සාපරාධී අපහාස නීතිය ගැන සඳහන් වේ. මේ සාපරාධී අපහාස නීතියට බොහෝ දෙනා විරුද්ධ වේ. ඒ නිර්දේශයන් සම්පූර්ණයෙන් අයින් කරන්න කියා කියති. යම් කිසි පුද්ගලයෙකුට ජනමාධ්‍යයක් මගින් හෙළි කරන කරුණක් හේතුවෙන් අපහාසයක් සිද්ධ වුවානම් ඔහුට සිවිල් නීතිය යටතේ කටයුතු කර වන්දි අය කරගන්න අයිතියක් තිබේ. ඒ නිසා ලෝකයේ කිසිම රටක නැති මේ ජනමාධ්‍යවේදියා අපරාධකරුවෙක් කරන නීතිය ඉවත් කරන්න කියා හඬක් තිබේ. මේ අතර Sunday Times පත්තරේ කතුවරයාට විරුද්ධව පැවති නඩුවේදී එහි තීන්දුව නිකුත් විය. ඒ කර්තෘවරයාට, යම් කිසි පුවතක් ජනාධිපතිනිය සම්බන්ධයෙන් පළකිරීම ගැන එහි තීන්දුව අනුව සිර දඬුවම් නියම විය. මේ තීන්දුවට ගත් අභියාචනයේ දී මහාධිකරණ විනිශ්චයකාරවරයා කියා සිටියේ රටක සාමාන්‍ය පුද්ගලයෙකුගේ නිදහස අභිබවා යන නිදහසක් මාධ්‍ය-වේදියෙකුට තිබිය නොහැකි බවයි. එක් එක් වෘත්තීන්වල ඉන්න නීතිඥවරයෙකු, වෛද්‍යවරයෙකු, ඉංජිනේරුවෙකු හැටියට, බලාපොරොත්තු විත




වරප්‍රසාද තිබේ. ඒ වෘත්තියකට තියෙන තත්ත්වය ආරක්ෂා කර ගැනීමට යම් වරප්‍රසාද බලාපොරොත්තු වේ. සාමාන්‍යයෙන් ජනමාධ්‍යවේදියෙක් වුණාම විශ්වවිද්‍යාල දොරටුවෙන් ඕනම වෙලාවක ඇතුළු වෙන්න පුළුවන් යැයි සිතයි.

ජනමාධ්‍යවේදීහු අපට වගකීමක් තිබිය යුතු යැයි නොකියති. කිසියම් දෙයක් කිරීමේදී අපි අපිට ලැබෙන වරප්‍රසාද වලින් අයුතු ප්‍රයෝජන නොගනිමු. ජනමාධ්‍යවේදියාගේ කාර්යය ලියන්න පුළුවන්කමයි. පත්තරේට යම් පළ කිරීමක් කරන්න වෘත්තීමය වශයෙන් දයක වෙනවා නම් ඔහුට එය පළ කරගත හැකිය. මුද්‍රණ ද්වාරයෙන් එලියට ගිය දෙයක් ආපසු ගත නොහැකියයි. ඒ නිසා 'X' නැමති පුද්ගලයා මංකොල්ල කාරයෙක්, වංචාකාරයෙක්, අල්ලස් කාරයෙක් කියල අපි චෝදනා නගන කොට ජනමාධ්‍යවේදියෙකුට ඇත්තේ සුදුම වගකීමකි. වගකීම මාධ්‍යවේදීන් සතුයි. අපෙන් එළියට යන යම් දෙයක් තියෙනවා නම් ඒක ඉතා බැරෑරුම් විදියට අපි පළ කළ යුතු ය.

සුපිරිසිදු විදියට තමන්ගේ වෘත්තියේ ගරුත්වය රැකගන්න ආකාරයෙන් කටයුතු කරන ජන-මාධ්‍යවේදීන් හිටියොත් ඒ අයත් ජනමාධ්‍යවේදියෙක් හැටියට බේරගන්න මේ ජනමාධ්‍ය නිදහස පිළිබඳ සටන් පාඨය අපට වැදගත් වේ.

ප්‍රකාශනය ගැන විශ්වාසයල, රටක ජනතාවතු ඇතිවන්නෙ ඒ ප්‍රකාශනය සත්‍ය නම්ය. ප්‍රකාශනය අසත්‍ය හෝ වගකීමෙන් තොර නම් ඒ ප්‍රකාශනය ගැන විශ්වාසය නැති වේ. පසුගිය දවසක මම පත්තර ලැල්ලක් ලඟට ගිය විට ලැල්ල යටින් වෙළඳම් කරන කරුණ පුද්ගලයා 'සර් මේක ඕනෙද' යැයි ඇසීය. මං බැලුවා. බලපුවාම අකුරු තුනක වචනයකි. වැඩිලොයිඩ් පත්තරයකි. අකුරු තුනයි. පත්තරයකි

නීතිඥ ජයන්ත ද සිල්වා

(දේශනයක් ඇසුරින්)

# මානව හිමිකම් රාමුව තුළ ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හා ජනවාර්ගික ගැටළුව

ජනමාධ්‍ය පිළිබඳව විමසන විට මූලික වශයෙන් මානව හිමිකම් අගයන් නැතහොත් ප්‍රමිතීන් මොනවාදයි යන්න සලකා බැලීම වැදගත් ය. ඉන් එකක් නම් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ය. එය අද අප කවුරුත් පාහේ කතා කරන්නාවූ මාතෘකාවකි. අනෙක නම් තොරතුරු ලබාගැනීමේ ඇති නිදහස. මාධ්‍යකරුවාට අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සේම තොරතුරු ලබා ගැනීමේ අයිතියක් ද වේ. තමන් නිර්මාණය කරනු ලබන දෙය, තමන් ලියනු ලබන දෙය. තමන් ප්‍රචාරය කරනු ලබන දෙය පිළිබඳව අදහස් ලබාගැනීමට තොරතුරු දනගැනීමට සැම කෙනකුටම හිමිකමක් ඇත.

මෙම අගයන් දෙක මෙහිදී අපට ඉතා වැදගත් වේ. මාධ්‍ය නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජාවක වැදගත් වන්නේ ඇයි දයි අවධානයට ලක් විය යුතුය. අද දවසේ මාධ්‍ය පිළිබඳව කතාකරන විට පෙනී යන්නේ මාධ්‍ය නිදහස එක අන්තයක් ලෙසිනි. ඉන් ඔබ්බෙහි යම් වැදගත්කමක් තිබේද? නොතිබේද යන්න සොයා බැලීම අනවශ්‍ය යැයි යන ස්ථාවරය අද මාධ්‍ය කතිකාවතේ නිරූපනය වේ.

මා මෙහිදී දකින්නේ මාධ්‍ය වැදගත් ආම්පන්නයක් ලෙසිනි. මෙයට ඇතැමුන් එකඟ නොවිය හැක. ප්‍රජාතාන්ත්‍රවාදී ඉලක්කයක් කරා යාමේදී එම ඉලක්කය දෙස බැලීමේදී ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රමයක් යනු කුමක්ද යන්න හඳුනාගැනීම වැදගත්වේ.

ජනතාවගේ කැමැත්ත මත නිර්මාණය වන පාලන ක්‍රමය ආණ්ඩුක්‍රමය ප්‍රජාතාන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය ලෙස හැඳින්විය හැක. මෙහිදී ජනතා සහභාගීත්වය මූලික වශයෙන් වැදගත්වේ. ජනතාවගේ පිතුම් පැතුම් නියෝජනය වීමට නම් ජනතාව විසින් තෝරා පත් කරගත් රජය ගැන ජනතාව අතර යම් කිසි සමීප සම්බන්ධතාවයක් හා සන්නිවේදනයක් නිරන්තරයෙන්ම තිබීම වැදගත් ය.

රජය හා ජනතාව අතර තිබෙන දම්වැලේ පුරුක ජනමාධ්‍යය වේ. ඒ නිසා මාධ්‍ය යන ආයතනය, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රජාවක ඉතාමත් වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී මෙවලමක් ආම්පන්නයක් වේ. එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්, ප්‍රජාවක් රාජ්‍යයක් සැකසීම සඳහා එහි ඉලක්කයක් තිබේ.




ඇතැම් අයට අනුව සාමාන්‍ය පරිදි මාධ්‍ය යනු තොරතුරු හුවමාරුවක් පමණක් නොවේ එය සංස්කෘතික අංගයක් ද වේ. එය එසේමය. මා සිතන පරිදි මූලික වශයෙන් අද අප මාධ්‍ය නිදහස පිළිබඳව කතා කරනුයේ මෙම සංස්කෘතික අවශ්‍යය නිසා නොවේ. මාධ්‍ය නිදහස් තිබිය යුත්තේ ඇයි? මාධ්‍ය ප්‍රජාතාන්ත්‍රවාදී සමාජයක පුරුකක් වන නිසාය. ඒ නිසා මාධ්‍යයන්ට ඉතා පුළුල් නිදහසක් තිබිය යුතුය. ඒ නිදහස සීමා කිරීමේ හැකියාව ඇත්තේ ඉතා අවම ප්‍රමාණයෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙස බැලුව ද ජාත්‍යන්තර මට්ටමින් පිළිගෙන ඇති මානව හිමිකම් ප්‍රමිතියක් දෙස බැලුවද මෙම නිදහස මාධ්‍ය නිදහස පමණක්ම නොවේ. සාමාන්‍ය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසය. අපට මෙන්ම මාධ්‍යයටත් භාෂාවේ ලේඛනයේ හා අදහස් පළ කිරීමේ නිදහස තිබේ. මෙම පරිහරණය

කිරීම්වලදී ප්‍රමිතියේ ප්‍රමිතියේ සීමාවක් ඇත. එම සීමාවන් දක්වුවද ඒවා අදාල කරගත හැක්කේ එක් කරුණක් මතය. එනම් පුද්ගල අයිතිවාසිකම් හා කීර්තිනාමය ආරක්ෂා කිරීම සඳහාය.

මෙය අද ශ්‍රී ලංකාවේ බරපතල ප්‍රශ්නයක්ව ඇත. මේ මාතෘකාව පිළිබඳ ද්විපාර්ශිකව සාකච්ඡා සිදුවිය යුතුය.

ජනවාර්ගික ප්‍රශ්නය වේවා වෙනත් දේශපාලනික ප්‍රශ්නයක් වේවා. මාධ්‍ය සිය කාර්යභාරය දෙස බැලිය යුත්තේ අන්තයක් ලෙස නොවේ. මාධ්‍ය ආරක්ෂා කළයුතු ආම්පන්නයකි. එසේ කළ යුත්තේ ඇයි? මහජන සහභාගීත්වය අවශ්‍ය නිසාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට වැදගත් නිසාත් ය.

අප මෙහිදී මූලික වශයෙන් සාකච්ඡා කරනුයේ රජයෙන් ඇතිවන සීමාවන් ය. රජය විසින් මාධ්‍ය සීමාවන් සැකසූ විට මාධ්‍ය නිදහස සීමාවේ. එයට මහජනතාවගේ අයිතිවාසිකම් පළුදු වේ. මහ ජනතාවගේ තොරතුරු ලබා-ගැනීමේ අයිතිය රාජ්‍ය ක්‍රියාවලි-යට සහභාගීවීමට ඇති අයිතිය යම් දුරකට සීමාවේ. මාධ්‍ය නිදහස නැතිවූන විට මාධ්‍ය කරුවාට පමණක් නොව අවාසි සිදුවන්නේ සමස්ත ජනතාවටමය.

යුධ තොරතුරු ප්‍රශ්නය දෙස බැලූ විට සමාන්‍යයෙන් සාකච්ඡා වන්නේ මාධ්‍යකරුවාට ඇතිවන ප්‍රශ්න දෙසය. නමුත් මෙහිදී පාර්ශව තුනක් වේ. එනම් රජය, මාධ්‍ය හා මහජනතාවය. රජය හා මාධ්‍ය යන ආයතන දෙකම සම්පාත වී ඇත්තේ මහජන යහපත උදෙසාය.

ජනමාධ්‍ය ජනවාර්ගික ප්‍රශ්නය දෙස මානව හිමිකම් දෘෂ්ටියෙන් බැලීමට කැමැත්තෙමි. එක් අතකින් මාධ්‍ය නිදහස ජනතාවට තොරතුරු ලැබීමට ඇති අයිතිය වේ. නමුත් අනෙක් අතට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට ගොස් වෙනත් ඒවා ඉදිරිපත් කිරීම යම් යම් ජන කො-ටස්වලට හිත්වේදනා ඇතිවෙන අවස්ථා තිබේ. මේ සෑම අවස්ථාවකදීම මානව හිමිකම් ප්‍රමිතීන් බලනුයේ සමාජයේ ඇතිවන ගැටෙන ප්‍රශ්න ගැටෙන බලවේග යම්කිසි ආකාරයක තුලනයකට පත්කරන්නේ කෙසේද යන්න ගැනය. ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳව නොයෙකුත් ප්‍රශ්න මතුවී තිබේ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන වගන්තියේ (1) අ උප වගන්තියේ සෑම පුද්ගලයකුටම සාමාන්‍ය ලේඛනය ඇතුලු අදහස් ප්‍රකාශකිරීමේ ඇති අයිතිය



තහවුරු කර තිබේ. නමුත් මෙය යම් පදනම් වලට යටත්ය. ඉන් එක පදනමක් නම් වාර්ගික හා ආගමික සාමය හා සහෝදරත්වය ආරක්ෂා කිරීමට සීමා පැනවී ඇති හැකියාව ය.

නමුත් ජාත්‍යන්තර ප්‍රමිතින් දෙස බැලූ විට ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ගැන අවධානය යොමු කළ හැක. විශ්ව මානව හිමිකම් පනතින් හා ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යන දෙකෙහිම 19 වන වගන්තිය මගින් අදහස් ප්‍රකාශකිරීමේ අයිතිය සහතික කර ඇත. 20 වන වගන්තියේ ඉතා වැදගත් දෙයක් ගැබ්වේ. එනම් සිවිල් හා දේශසීමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියයි. අදහස් ප්‍රකාශකිරීමේ අයිතිය ඉතා උත්තරීතර අයිතිය ලෙස සැලකුවද වාර්ගික සමගිය වැදගත්වේ. එය වාර්ගික සමගියට පමණක් සීමාවී නැත. එහි යුධ ප්‍රචාරණ තහනම්ය. මේ සම්මුතියට අත්සන් කොට පිළිගත් රජයට යුද්ධයට දිරිදීම් කරන ප්‍රචාරක කටයුතු තහනම් කිරීමේ යුතුකමක් තිබේ. ජනතාව අතර වාර්ගික වෙනස්කම් තවත් උග්‍ර කිරීමට යම්කිසි ප්‍රකෝපකාරී දේ පළ කරන්නේනම් ඒවා තහනම් කළ යුතුය. යමක් පළ කළ පසු එය ප්‍රකෝපකාරී දෙයක් ලෙස හඳුනාගැනීමද වැදගත්වේ. වගන්ති ඒ ආකාරයටම පැනවූව හොත් රජයට පුළුල් ආකාරයෙන් සීමා පැනවිය හැක. එනිසා මේවා අර්ථ නිරූපනය කරනුයේ සීමාසහිත ආකාරයටය. මන්ද, භාෂණයේ නිදහසට ඇති වැදගත්කම නිසාය.

මාධ්‍යවේදියකුට සීමාවන්ට නොවැටෙන ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමට නිදහසක් ඇත. පුවතක් මෙහෙයවන්නේ කෙසේද එළිදරව් කරන්නේ කෙසේද කුමන ප්‍රමුඛත්වයක් දෙන්නේද යන්න

පිළිබඳව ඔහු තුළ අවබෝධයක් තිබිය යුතුය.


කවුරුන් හෝ අත්අඩංගුවට ගත් විට ඒවා ප්‍රකාශකරන පලකරන ආකාරය වැදගත්ය. මේ වනවිට බිහිසුණු අපරාධ, ත්‍රස්තවාදී කටයුතු සිදුවේ. මානව හිමිකම් රාමුව තුළ මෙවැනි විට පුවතක් මෙහෙයවන ආකාරය අපට වැදගත් වේ. ප්‍රථමව අඩුබරක් හෝ වැඩිබරක් දෙන ආකාරයට ඉදිරිපත් කරන ආකාරයයි. මෙහිදී මාධ්‍යකරු සතු සමාජීය වගකීම ඉහළය වාර්ගික අර්බුදයක් තුළ ජනමාධ්‍ය හසුරුවන්නේ කෙසේදැයි මාධ්‍යකරුට අවබෝධයක් තිබිය යුතුය.

විද්‍යුත් මාධ්‍ය වාර්ගික ප්‍රශ්නය පිළිබඳ තොරතුරු ගෙන එන ආකාරය ගැන එසේ අවධානය යොමු කරමි. බොහෝ ඒවා සත්වේදිතාවය සංනිවේදනය ලෙස සකස් වේ. එක් අයකුගේ සංවේදිතාව තවත් අයකුගේ සංවේදිතාවයට වෙනස් බව අප මෙහිදී අවධානයට ගත යුතුය. භාෂණයේ නිදහස ආරක්ෂා කරන ගමන් සමාජ ව්‍යුහයේ ලොකු අර්බුදයක් ඇති නොවන ලෙස ද ඉදිරිපත් කිරීම අභියෝගයකි. හුදෙක් නීතියෙන්ම සෑම දෙයක්ම කළ හැකි නොවේ. මාධ්‍ය කරුවන් නීතිය පිළිබඳවත් එහි ඵල විපාක පිළිබඳවත් දැනසිටීමද වැදගත් ය.

මාධ්‍ය කාර්යභාරය පිළිබඳ මගේ අදහස නම් ශෛතික ප්‍රශ්න ඇතිවන ආකාරය පිළිබඳ ප්‍රශ්නය එතරම් වැදගත් වූවක් නොවේ. වඩා වැදගත් වන්නේ ජනමාධ්‍ය සතු කාර්ය භාරය කුමක්ද සමාජ යහපත කුමක්ද යන්න තේරුම් ගැනීමය.

ආචාර්ය දීපිකා උඩුගම

(දේශනයක් ඇසුරිනි)




# ඇගේ ඡන්දයෙන් අපේ ජීවිත වෙනස් වුනා

# (Her Vote Changed Our Lives)

සත්‍යය හැම අතින්ම කල්පිතයට වඩා අපූර්වයි. ඒ නිසා ඇත්ත කතාවක් හෙවත් සත්‍ය කතාවක් ඇසීමට අප තුළ ඇත්තේ නොතිත් ආශාවක්.

මේ සත්‍ය කතාව ප්‍රතිනිර්මාණය කරන්නේ ග්ලෙන් මන්සන් (Glen Manson) නමැති අමෙරිකානු සන්නිවේදකයා.

වර්ෂ 1872 නොවැම්බර් 5 වෙනිද සූසන් .බී. ඇන්තනි (Susan B. Anthony) මහත්මිය තවත් කාන්තාවන් 14 දෙනකු සමඟ, නිව්යෝක් හි රොචෙස්ටර් නමැති ස්ථානයේ සපත්තු සාදන සාප්පුවකට ගොඩ වැදුනා.

සපත්තු ගන්න වෙන්නැති ?

නැහැ මේ සාප්පුව, එම වසරේ පැවැති අමෙරිකානු ජනාධිපතිවරණයේදී භාවිතයට ගෙන තිබුණේ ඡන්ද මධ්‍යස්ථානයක් වශයෙනුයි. ඒ මධ්‍යස්ථානයේ රාජකාරී කටයුතුවල නියැලී සිටි පිරිමි පක්ෂය මේ සිදුවන්නට යන්නේ කුමක්දැයි නොදන නුණ්නිම්භූතව බලා සිටියා.

ඉතින් මොකද වුණේ?

එක් දවැන්ත පිරිමියෙක්, මහත්මයෙක් තමන්ගේ මුවේ රුවාගෙන තිබූ සුරුට්ටු කොටය අතට ගත්තා. දුම් රොටුවක් ඉහලට යැව්වා. පුංචි ප්‍රශ්නයක් ඇහුවා.

'මොනවද මේ තෝනට ඕනෑ?'

මද වේලාවක් සූසන් මහත්මිය නිශ්ශබ්දව සිටියා. ඊට පසුව පිළිතුරු දුන්නා.

'අපි ආවේ ඡන්දෙ දාන්න'

'මොනවා ඡන්දෙ දාන්න?'

මේ කතාව අවට සිටි සෙසු පිරිමින්ටත් ඇහුණා. ඔවුනගේ අවධානයත් . මේ කතාව කෙරෙහි යොමුවුණා.

'ඒයි - මේ බලාපල්ලකෝ මේන් මේ කාන්තා පක්ෂය ඇවිල්ල තියෙන්නේ ඡන්දෙ දාන්නලු.'

කවුරුත් වාගේ එක දිගටම හිනාවුණා. සූසන් මහත්මිය ඔවුන්ගේ හිනාහඬ නතරවන තුරු බලා සිටියා, ඉවසිල්ලෙන්,

'මගේ නම සූසන් බී ඇන්තනී, මම මේ රටේ පුරවැසි කාන්තාවක් ඔහේලා පිරිමි පුරවැසියෝ- අපි ගැහැණු පුරවැසියෝ වෙනස එච්චරයි. අපේ රටට පොදු ජනනායකයෙක් තෝරාපත් කරගන්නා අවස්ථාවකදී අපටත් ඒ කාර්යයට සහභාගි වන්නට මානව හිමිකමක්, අයිතිවාසිකමක් තියෙන්නට ඕනෑ. අපි ඉල්ලා සිටින්නේ පිරිමින්ට වාගේම ගැහැණුන් වන අපටත් ඡන්ද අයිතිය දෙන්ට කියලයි.

'මොනවා ඡන්ද අයිතිය ?'


ඔව්, ජනාධිපතිවරයෙක් තෝරා ගැනීමට ඡන්දය දමීමේ අයිතිය අපටත් තියෙන්නට ඕනෑ, ඒ අයිතිය අපි ඉල්ලා සිටිනවා.

දවැන්ත මිනිහා මෙච්චල් වුණු බවක් පෙනුනා. සූසන් මහත්මිය මොකක්ද ඊලඟට කෙරුවේ. සූසන් මහත්මිය මේසය මත තිබුණු ඡන්ද පත්‍රිකාවක් අතට ගත්තා, තමන් කැමති ඡන්ද අපේක්ෂකයාගේ නම ඉදිරියේ කොටුවේ ලකුණු කළා. ඊට පස්සෙ ඡන්ද පෙට්ටියට දැම්මා. සූසන් මහත්මිය පසුපසින් පැමිණි කාන්තාවන් ඒ විකම කළා. මේ අපූරු වැඩේ දිහා පිරිමි බලාගෙන හිටියා. වැඩි වෙලාවක් යන්නට මත්තෙන් මුළු රටම දැනගත්තා සූසන් මහත්මිය ඇතුළු කාන්තාවන් පිරිසක් කර ඇති ක්‍රියාව ගැන. පුවත්පත්වල ඒ ගැන ලොකු අකුරින් පළවුනා. පුවත්පත් පවත්වාගෙන ගිය උදවිය සූසන් මහත්මියගේ ක්‍රියාව අනුමත කරන බවක් පෙනුන් නෑ. ඔවුන් එකහෙළා ප්‍රකාශ කලේ ඇයට දඬුවම් කළ යුතු බවයි. එක් පුවත්පතක මෙහෙම ලියැවුණා.

මෙහි පවතින නීති පද්ධතිය පැහැදිලිය. ගැහැනුන්ට ඡන්ද බලයක් නැහැ සූසන් මහත්මිය කර ඇත්තේ නීති විරෝධී ක්‍රියාවක්, එබැවින් ඇය දඬුවම් ලැබිය යුතුයි.

තවත් පුවත්පතක මෙහෙම පළවුණා.

'මෙයින් පෙනෙන්නේ සූසන් මහත්මිය ඇතුළු කාන්තාවන් පිරිසක් තමන්ගේ ප්‍රථම අයිතිවාසිකමක් වශයෙන් ඡන්ද බලය ඉල්ලීම. ඊට පස්සෙ ඔවුන් ඉල්ලාවි තමන්ට උසස් අධ්‍යාපන වරප්‍රසාදත් ලබාදෙන්න කියලා. ඒ උදවිය ඉල්ලා සිටීවි පිරිමින් කරන රස්සාවල් තමන්ටත් කරන්ට පුළුවන් ය කියල. තමන්ගේ පියවරුන් හා සැමියන් මුදල් ඉපයීම වෙනුවට ඔවුන්ටත් උවමනා කරල තියෙන්නේ මුදල් ඉපයීම ඊලඟට ඔවුන් ඉඩම් සහ නිවාස හිමිකර ගැනීමේ අයිතියත් ඉල්ලා සිටීවි.'



කාටූන් ස්වයං-වාරණය 'මට සිරගෙයි යෑමට ඕනෑකමක් නැත.'

තවත් පුවත්පතක මෙහෙම පළවුණා.

අප දක්නා ඉතා පැහැදිලි හා නිරවුල් කාරණයක් වශයෙන් පෙන්වා දිය යුත්තේ නීතිමය සහ ව්‍යාපාරික කටයුතු වලදී කාන්තාවන්ට ඒ විෂයයන් පිළිබඳ කුසලතාවක් නොමැති බව. කොටින්ම ඒ කාර්යයන් පිළිබඳ ඔවුනට දැනුමක් නොමැති බවත් දැනගත යුතුයි. කාන්තාවකගේ තැන එක්කෝ නිවස විය යුතුය. නැතහොත්, පන්ති කාමරය විය යුතුයි. ඊට එහා දෙයක් ඇයට හිමිවන්නේ නෑ'

1820 උපන් සූසන් මහත්මිය මුලදී කල්පනා කලේ තමන්ටත් කවද හෝ ගෘහනියක් වශයෙන් හෝ ගුරුවරියක හෝ භාර්යාවක වශයෙන් කාලය ගත කරන්නට වීම ගැනයි. කෙමෙන් ඇය තම කල්පනා ලෝකය පුළුල් කර ගත්තා. .

වයස අවු: 18 දී සූසන් මහත්මිය තම දෙමාපියන්ගේ මහගෙදරින් පිට වී නිව්යෝර්ක් හි, නිව් රොෂෙල්හි පිහිටි එක්තරා බාලිකා විද්‍යාලක ගුරුවරියක වශයෙන් සේවය කළා. එසේ සේවය කිරීමෙන් ඇය පුදුමාකාර අස්වැසිල්ලක් ලැබුවා.

මේ ආකාරයෙන් ඇය බාලිකා විද්‍යාල් කීපයකම සේවය කළා. ඇය නිතරම තම සිසුවියන්ට එක් වැදගත් කාරණයක් මතක් කර දුන්නා.

'ගුරුවරියනුත්, ගුරුවරුනුත් අතර ගැහැණු පිරිමි කියල භේදයක් තියෙන්ට හොඳ නැහැ. දෙගොල්ලම ඉටුකරන්නේ එකම සේවාවක්, දෙගොල්ලම උගන්වනවා. නැමුයි අපට පේනවා, වේතනය වශයෙන් ගත්තොත් පිරිමි පක්ෂයට වැඩි වේතනයකුත්, ගැහැණු පක්ෂට අඩු වේතනයකුත් ලැබෙන බව. මේක මහා අසාධාරණයක්. ඇයි එහෙම වෙන්නේ? ගැහැණු පක්ෂයේ ඉතාමත්ම දක්ෂ ගුරුවරියන් ඉන්නවා. ඉතින් එහෙමනම් ඇයි සමාන වේතනයක් දෙන්ට බැරි? සමාන වේතනයක් දෙන්ට ඕනෑ නේද?

මේ අතර අමෙරිකානු සමාජයේ තවත් සමාජ සංස්කෘතික ගැටළු රාශියක් පැවතුනා. ඒ අතරින් වඩාත් ම ප්‍රමුඛ ගැටළු ලෙස සැලකුනේ වහල්



මෙහෙවර, නිදහස් ලෙස මද්‍යසාරය විකිණීමෙන් ඇතිවන ගැහැට වැනි දේ. තමන්ට ඉඩ ලැබෙන පරිද්දෙන් සූසන් මේ සමාජ උවදුරු වලට එරෙහිව ක්‍රියාකරන සංගම්වලට බැඳී සම්පව කටයුතු කරන්නට පටන් ගත්තා. ගුරුවෘත්තියට බට ඇය මෙබඳු කටයුතු වලට ප්‍රියමනාප බවක් දක්වූවා. සමාජ ප්‍රතිශෝධනය ඇගේ ජීවිතයේ ප්‍රධාන ජීවන අරමුණක් බව ඇයට ඒත්තු ගැන්වුණා.

1849 වසරේදී සූසන් මහත්මිය පෙරළා තම දෙමාපියන් වාසය කළ නිව්යෝර්ක් හි රෝචෙස්ටර් ප්‍රදේශයට ගියා. එහිදී ඇය තව තවත් ගම් දනව්වලට ගිහින් තොරතුරු දන හැඳින ගත්තා. හැම තැනම ඇවිදිමින් මහජනයාගේ ප්‍රශ්නවල ස්වභාවය වටහා ගන්නට උත්සාහ ගත්තා.

මේ කාලයේ ඒ ප්‍රදේශයේ තිබුණා අමද්‍යප ව්‍යාපාරයක් Sons of temperance යනුවෙන්. සූසන් පටන් ගත්තා අමද්‍යප ව්‍යාපාරයක් Daugthers of Temperance යනුවෙන්

මොනවද මේ නම්වල තේරුම?

Sons of tempernce කියන්නේ මද්‍ය විරෝධී පුත්‍රයෝ කියන එක.

Daugthers of Temperance කියන්නේ මද්‍ය විරෝධී දුවරු කියන එක.

සූසන් මොකක්ද කිව්වේ?

'අපි මේ අමද්‍යප ව්‍යාපාර දෙකම එකට එක්කරමු'

ඉන් යම්කිසි ප්‍රතිඵලයක් ඇතිවුනාද?

ඇති වුනයි කියන්නට පුළුවන්. වතාවක් අමද්‍යප පුත්‍රයෝ සූසන්ව තමන්ගේ රැස්වීමකට සහභාගි කරවා ගත්තා. ඒ රැස්වීම පැවැත්වුනේ සයිරකුස්හි. හැබැයි මේ රැස්වීමට සහභාගී වන්නට ගිය සූසන් මහත්මියට මගදී පූජකවරයෙක් මුණ ගැහුණා. එතුමා කිව්වා

'මේ සූසන් මහත්මිය මෙතන ලොකු වැරදීමක් වෙලා තියෙනවා වගෙයි. මම හිතන්නෙ නෑ ඔබතුමිය මේ රැස්වීමට සහභාගි වෙන එක හොඳයි කියලා'

ඒ වුනාට මට ආරාධනාවක් තියෙනවා

ඒකෙන් ප්‍රශ්නයක් නෑ. මම ඉල්ලා සිටිනවා කරුණාකරලා ඔය රැස්වීමට ඔබතුමිය සහභාගිවීමෙන් වළකින්න.

-මේ පූජකතුමා කියන දේ මම ගනන් ගන්නේ නෑ මම කෙලින්ම ඔය අමද්‍යප රැස්වීමට යනවා.

ඉතින් සූසන් මහත්මිය ඒ අමද්‍යප රැස්වීමට සහභාගි වුනාද?

ඒ ගැන අපි සූසන් මහත්මියගෙන්ම අහල බලමු.

'ඇත්ත මට ලැබුණු ආරාධනාව අනුව මට ඒ රැස්වීමට ගියා. ඒත් මට මහ පුදුම දෙයක් සිද්ධ වුනේ. මම එතෙන්ට ගියා විතරයි මෙන්න පිරිමි හූ කියන්නටත් මට අපහාස කරන්නටත් පටන් ගත්තා. මම දැනගත්තා මොකක් හෝ ලොකු වැරදීමක් වෙලා තිබෙන බවත්. මට ඇතිවුණ කලකිරීම මැඩගෙන මම නැගී සිටින්නට වෑයම් කළා. මම දන්නවා මොකක්ද කරන්න ඕනි දේ මම, මගේ සටන නතර කරන්නෙ නෑ. කාන්තා පක්ෂයට ලැබිය යුතු නියම අයිතිවාසිකම් සමාජයෙන් ලැබෙනතුරුම මම මගේ සටන නතර කරන්නේ නෑ. කාන්තා පක්ෂයට ලැබිය යුතු නියම අයිතිවාසිකම් සමාජයෙන් ලැබෙන තුරුම මම මගේ සටන නතර කරන්නේ නෑ. ඔව් මේ සඳහා කාන්තා සංවිධානයක් පිහිටුවා ගන්න ඕනෑ . ඇය දවසින් දවසට හිත සාධනීය අතට හරවා ගත්තා. 'මා හදන සංවිධානයට යහපත් සාමාජිකත්වයක් අවශ්‍යයි. ඒ සඳහා මම කාන්තාවන් සමඟ මූලික සාකච්ඡා වාර පවත්වන්ට ඕනෑ. සාකච්ඡාවාර පවත්වල ඒ විතරක් මදි. ක්‍රියාත්මක පක්ෂයටත් හරවන්නත් ඕන. ගෙයක් ගානෙ ගිහිල්ලා මගේ අරමුණ සාකච්ඡා කරන්න ඕනි. ලිපි ලේඛන ලියන්න ඕනෑ.

සූසන් මහත්මියගේ ඒ ක්‍රියාදමය සාර්ථක වුනාද?

ඒ ගැනත් සූසන් මහත්මිය මෙහෙම කිව්වා.

සමහර කාන්තාවන් මා සමඟ කතාකලේ දැඩි මිත්‍රත්වයකින්. ඔවුන්ට මා කී දේවල් වටහා ගැනීම අපහසු වුනේ නෑ. ඒත් සමහර කාන්තාවන් මට කතා කළේ අමිත්‍ර ලීලාවෙන්, සමහරු මට කෙලින්ම කිව්වා. පිස්සු වැඩ කරන්ට එපාය කියලා. තවත් සමහරු කිව්වා මාව බලාගන්ට මගේ සැමියා ඉන්නවා ඒ ඇති කියලා. මෙහෙම තමයි සමාජයේ පවතින විෂමතාව එකඟත්වය හා එකඟ නොවීම හෙවත් විරුද්ධත්වය. ඒත් මම මගේ අධිෂ්ඨානය නතර කළේ නෑ.

'ඊලඟට මොකද වුනේ'

1853-54 කාලයේදි අපේ කාන්තා සටන් තව තවත් මුවහත් වුණා. අපි ඉල්ලා සිටියා කාන්තා අයිතිවාසිකම් ප්‍රඥප්තියක් කෙටුම්පත් කරන්ට. මේ සඳහා අපට සිද්ධවුනා හුඟ දෙනෙක් මුන ගැහීමට, මුනගැහුණා පමණක් නොවේ. කතාබහ කරලා න්‍යායයි ව්‍යවහාරයයි එක්කරන්නටත් සිද්ධ වුණා. මට මතකයි මගේ දෙපා පණ නැතිවෙන තත්ත්වයට පත්වුණා. ඇඟපත කකියන්ට පටන්ගත්තා. ඒත් මට මගේ දිරිය අත්හැරියේ නෑ හැබැයි මට නිතරම තර්ජන ගර්ජන ආවා.

කාන්තා අයිතිවාසිකම් සඳහා කෙරෙන සටනේ හඬට සමහර පිරිමි පමණක් නොව, ගැහැණුත් කන්දුන්නේ නෑ. ඒ වුනත් ඉතා සමීපව සුසන් බී ද අනුමත කළ කාන්තා පිරිසක් ඇයට සහයෝගය දක්වීමට ඇය හා සමඟ එකතු වුනා.

අපට මේ සටන අවුරුදු හතක් පමණ එක දිගටම කරගෙන යාමට සිද්ධ වුනා. සමහරක් දවස්වල අපට බඩගින්න ඉවසා දරාගෙන සිටීමට සිද්ධවුනා. මේ සියල්ලේම ප්‍රතිඵල වශයෙන් අන්තිමට 1860 දී රාජ්‍ය තන්ත්‍රයටම වැටහුනා පිරිමි පක්ෂට දී ඇති ඇතැම් වරප්‍රසාද එක හා සමානව කාන්තා පක්ෂයටත් දිය යුතුයි කියා.

ඊළඟට මොකද වුනේ?

ඒක තමයි කාන්තාවන්ට ලැබුණ ලොකුම ජයග්‍රහණය. ඒ මගින් නීති ඉතිහාසයේත් නව පිටුවක් පෙරලීමට සමත් වුනා. ඒත් ඇත්තම කියනවා නම් ඒ තමයි දිගු ගමනක ආරම්භය. ඒ දිගු ගමන යාමට අපට සිදුවුනේ දුෂ්කර මාවතක. දුරබැහැර තැන්වලට දුම්රියෙන් දුක්බර ගමන් යන්නට සිද්ධ වුනා. අපට නිදගන්නට සිද්ධවුනේ සමහර අවස්ථාවලදි පිටිගෝනි උඩ, බඩු මුට්ටු උඩ, දව කොටන් උඩ, කන්න ලැබුණේ පාන් පෙත්තක් දෙකක්. සමහරදාට පරණ පාන්.

ඒ විතරක්ද?

නිදගන්ට ලැබෙන තැන්වල මකුණෝ. උන්ගෙන් සිද්ධවෙන විපත්තියට වන්දි ගෙවන්න වෙන්නෙ බොහෝම දුක් වේදනා විඳලා. සමහරක් රෑ කාලවල හරිහැටි නින්දක් ලැබෙන්නේ නෑ. ඒකත් ඉවසන්න පුළුවන්

මොකක්ද ඉවසන්න බැරි?

ඉවසන්න බැරිම දේ තමයි, බේබද්දු මිනිසුන්ගෙන් ලැබෙන කරදර, ඇනුම් බැණුම්. උන් මට විරුද්ධවාදී කම් පෙන්වන්නේ මගේ හැඩයට පඹයන් හදලා, පුච්චලා ඒත් නමක් නෑ. දවසක් මම අලු තවයෙන් බේරුනේ. ඇසිඩ් ගැහිල්ලකින්. මගේ ඇඳුම් සිච්චිලා තියත් මම යන්තම් බේරුනා.

මෙන්න මේ විදිහට තමයි, සුසන් ඇන්තනීගේ ජීවිතය ගෙවිලා ගියෙ. ඇය ලිවීමෙන් කතා පැවැත්වීමෙන් තම ජීවිතය ජය ගත්තා. තමන්ගේ විරුධවාදී කල්ලිය හෙමින් හෙමින් තමන්ගේ පැත්තට ගත්තා. මෙහෙම ගිහිල්ලා 1872 වසරේදී සුසන් තවත් ගැහැනුන් 14 දෙනෙක් සමග ඡන්ද පොළකට ගිහිල්ලා තමන්ගේ ඡන්ද බලය පෙන්නුම් කෙරුවා. එමගින් ඇය ප්‍රකාශ කර සිටියේ ඡන්ද බලය නැති කාන්තා පක්ෂයට ඡන්දය ලබාගැනීම.මේ හේතුවෙන් ඉතා දිගු කතාවක් කෙටියෙන් කියනවා නම් සුසන් මහත්මිය අත් අඩංගුවට ගනු ලැබුවා.

ඊට පස්සේ මොකද වුනේ?

මහෙස්ත්‍රාත්වරයා තීන්දුවක් දුන්නා.

'රටේ සම්මත නීතිය කඩකරමින් බලයෙන් ඡන්දය දැම්ම නිසා සුසන් මහත්මිය වරදකාරියක් ලෙස දඩුවම් විඳිය යුතු බව මා ප්‍රකාශ කර සිටිනවා. ඒ සඳහා දඩුවම ඩොලර් 100 යි.'

'නෑ මම ඒ දඩය ගෙවන්නේ නෑ. පුළුවන් නම් මාව හිර අඩස්සියට දන්න.

මහේස්ත්‍රාත්වරයාට පුළුවන්කමක් ලැබුණේ නෑ. සුසන් මහත්මිය හිර අඩස්සියට යවන්න. එසේ හිර දඩුවමක් දුන්නොත් ඇය කෙරෙහි අනුකම්පාවක් ඇතිවෙලා රටේ නුවමනා උද්ඝෝෂණයක් ඇතිවෙන්න පුළුවන්.

ඕනෑම රටක මැදිහත් මතධාරීන්ද සිටින බව අමුතුවෙන් කිවයුතු නොවේ. එබඳු පිරිසක් නිසා සුසන් මහත්මිය කෙරෙහි සැබවින්ම විශේෂ අවධානයක් යොමු වුනා. ඇය පුවත්පත් වලට සහ සඟරාවලට ලිපි ලියන්නට පටන් ගත්තා.

වයස අවු 52 ක් වන විට ඇය පවසන දේ වඩාත් හොඳින් වටහා ගැනීමේ සැදී පැහැදී සිටි පිරිසක් බිහිවුණා.

එහෙත් ඇය තම උත්සාහය අඹමල් රේණුවකින් හෝ අඩුකර ගත්තේ නැහැ.

1905 දී වයස අවුරුදු 82ක් වූ විටදී ඇය බලවත් කායික දුබලතාවකට පත් වුනා. ආඝාතයක් හට ගත්තා.

'සුසන් මහත්මිය දත් ඉතින් විවේක ගන්ට ඕනෑ' වෛද්‍යවරු ඇයට පැවසුවා.

1906 දී ඇය, වොෂින්ටන් හි ඇය වෙනුවෙන් පැවැත්වුණු කාන්තා අයිතිවාසිකම් දිනාගැනීමේ රැස්වීමකට සහභාගී වුනා.

'අසාර්ථකත්වය යනු නොවිය හැකි දෙයක්

එහිදී ඈ ප්‍රකාශ කළා . ඒ ඇගේ අන්තිම වචන ටික දවස් කීපයකට පසුව ඇය රෝගාතුර වී මියපරලොව ගියා.

1920 දී, එනම් ඇය මියගොස් දහන් අවුරුද්දකට පසුව ඇමරිකන් ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ඉදිරිපත් කෙරුණා. ඒ අනුව ලිංග භේදයකින් තොරව ඡන්දබලය හැම පුරවැසියකුටම තිබිය යුතු බව අනුමත වුනා.

සුසන් බී ඇන්තනී මහත්මිය ජීවිත කාලයක් මුළුල්ලේ කළ සටන ඇගේ අභාවයෙන් පසුව පලගැන්වුනා.

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර



# සක්‍රීය සිවිල් සමාජයක් සඳහා ජනමාධ්‍යයේ කාර්යභාරය

මිනිස් ඉතිහාසය දෙස බලන විට පෙනී යන්නේ මිනිසා කණ්ඩායම් වශයෙන් ජීවත් වූ බවයි. එපමණක් නොව සතුන් පවා ජීවත්වන්නේ සාමූහික කණ්ඩායම් වශයෙනි. මිනිස් හා සතුන් යන දෙවර්ගයේම ජීවීන්ගේ කණ්ඩායම් තුළ අදහස් හුවමාරුව දකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි.

සහරා කාන්තාරය අවට ජීවත්වන වනචාරී ගෝත්‍රිකයින් පවා දහවල් කාලයේ සේවය කොට සන්ධ්‍යා කාලයේ වාඩි වී විවිධ කරුණු සාකච්ඡා කර තිබේ. අදහස් හුවමාරු කරගැනීමක් පැවැති බව මෙයින්ද සහතික වේ. මේ අදහස් හුවමාරුව කාලය පිළිබඳව අනාගතය පිළිබඳව හෝ වෙනත් කරුණක් පිළිබඳව විය හැකිය. මිනිසා ස්වභාවයෙන්ම අදහස් හුවමාරු කරගැනීමට , තොරතුරු දැන ගැනීමට කැමැත්තක් දක්වයි. එය යමක් පිළිබඳව සාකච්ඡා කොට කුතුහලය නැති කර ගැනීම සඳහා වූ මිනිස් ස්වාභාවයකි.

සිවිල් සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී රෝම හා ග්‍රීක ශිෂ්ටාචාර වැදගත් වේ. එකී ශිෂ්ටාචාර වල ජීවත් වූ මිනිස් සමාජයන් හා එහි වර්ධනය පිළිබඳව විමසීමේදී දකිය හැකි මූලික ලක්ෂණයක් වන්නේ සංවාදය සමාජයේ පියත්නය සඳහා ඉවහල් වූ බවයි. සංවාදය හා සාකච්ඡාව සැම දියුණු ශිෂ්ටාචාරයකම දකිය හැකිය. සොක්‍රටීස්ගේ දේශන, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි පුද්ගලයින් ග්‍රීක සමාජයේ ප්‍රගතියට හේතු විය. එකී සංවාද පුද්ගලයාගේ සංවර්ධනයටද හේතු වූ බව පැහැදිලි වේ. අදහස් හුවමාරු කර ගැනීම වැදගත් ලක්ෂණයක් ලෙස සිවිල් සමාජයේ දී දකිය හැකිවේ. සොක්‍රටීස්ගේ දේශනවලින් තරුණයින් නොමග යවන්නේය යන චෝදනාවෙන් ඔහුට මරණදඩුවම නියම වූ බව සඳහන් වේ. ක්‍රිස්තුස් වහන්සේට පවා



එල්ලවූ චෝදනාව වූයේ පැවැති ආගම් වලට එරෙහිව මත ප්‍රකාශ කිරීමයි. මේවාට දඬුවම් නියම වූයේ වැඩි ඡන්දයෙන් බවද දැක්වේ. මෙය කටවචනයේ 'හුවමාරුව' යන්න සමාජයට බලපෑ ආකාරයක්, අදහස් හුවමාරුවක් ඒවා තුළ තිබේ.


ජනමාධ්‍ය සමාජයට බලපෑ ආකාරය ඉතිහාසය පුරාම දකිය හැකියි. ගුවන්විදුලිය, චන්ද්‍රිකා හරහා කෙරෙන ප්‍රචාරය හා සන්නිවේදනය නූතනයේ බලපායි. අතීත සමාජයට සන්නිවේදන මාධ්‍ය ලෙස බලපාතිබෙන්නේ ග්‍රන්ථ සන්නි-වේදනයයි.

සිවිල් සමාජය සුරක්ෂිත කිරීමට නම් ජනමාධ්‍යයට අවශ්‍ය පසුබිම සකස් විය යුතුය. එය නිදහස මත පදනම් වේ. පුවත්පත් ප්‍රමුඛ මාධ්‍යයේ පවතින නිදහස සමාජයක අත්‍යාවශ්‍ය අංගයකි. සමාජයේ 'නිදහස' නැමැති සංකල්පයට වර්ධනය වීම කෙරෙහි විවිධ දර්ශනිකයින් හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන් හේතු වී තිබේ.

magna carta, bill of Rights, Rignts, of man මූලික සංවාදයන්, පත්‍රිකා, නිදහස් සංකල්පයේ වර්ධනයට මුල් වූ ඒවා ලෙස සඳහන් වේ. පුවත්පත්වලට අදාලව වන අදහස් ප්‍රකාශ කිරීමේ කරුණු ගොනු කර ප්‍රකාශවූයේ ක්‍රි.ව.1664 දීය. නිදහස් අදහස් ප්‍රකාශකිරීමේ අයිතියක්, ලිවීමේ අයිතියක් ගොනු කොට ප්‍රකාශ කළ එකී ප්‍රකාශනය එංගලන්තයේ සැළකෙන්නේ පුවත්පතට විශේෂිත ප්‍රකාශකයක් ලෙසයි.

මෙම නිදහස සංකල්පයේ වර්ධනීය සන්ධිස්ථානයක් ලෙස එක්සත් ජාතීන්ගේ විශ්වප්‍රකාශනය පදනම් කළ හැකියි. එහිදී ඊට අදල මූලික නීතිමය ප්‍රකාශන දෙකක් දක්වයි. එනම්,

01. සිවිල් හා දේශපාලන අයිතිවාසි-කම් පිළිබඳව ප්‍රඥප්තිය හා (International convent of civil political rights)



02. ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යාන්තර සංමුතිය. (international lonvent of cultural Economic Rights).

මෙම ප්‍රකාශනයන් දෙකෙන් ලෝකයේ රටවල් 'නීතිමය' වශයෙන් අත්සන් කොට පිළිගනු ලැබීය. ඒ අනුව ලංකාවද ඊට අත්සන් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කතා කිරීමේ හා අදහස් ප්‍රකාශකිරීමේ නිදහස් ලබා දී තිබේ. පොදු ජනතාවට බලපාන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිවල සඳහන් වේ.

ඕනෑම අවස්ථාවක පුවත්පත් කලාවේදියා සියල්ලන්ට ම වඩා ඉදිරියෙන් සිටී. සමාජය මෙහෙය වීමේ බලපෑම් කාර්ය පැවැරෙන්නේ ජනමාධ්‍යයට බව පැහැදිලියි. කොසෝවෝ අර්බුදය පිළිබඳව මාධ්‍යවේදීන් ප්‍රශ්නය තේරුම් ගෙන නැතිබවත්, තමාගේ විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට ඉඩ නොදෙන බවත් ටෝනි බ්ලෙයාර් වරක් ප්‍රකාශ කළේය. කොසෝව යුධමය අවශ්‍යතාවය පිළිබඳ බටහිරින් නැගීමක් ලබා දී සිබිණි. සරණාගතයින්ට බටහිර ජනමාධ්‍ය ප්‍රකාශකලේය. අමෙරිකාවේ හා බ්‍රිතාන්‍යයේ රූපවාහිනී මාධ්‍ය මගින් සරණාගතයින්ගේ පැමිණීම ප්‍රදර්ශනය කෙරිණි. මේ අර්බුදය පිළිබඳ මාධ්‍ය මගින් දැනුවත් වූ නිසා ටෝනි බ්ලෙයාර් අවබෝධ කරගත්තේ මේ පිළිබඳව තිබෙන ලෝක මතය වෙනස් වේවි යනුවෙන්ය.

C.N.N. ප්‍රවෘත්ති සේවයේ ගවේෂක මාධ්‍යවේදීන් දෙදෙනෙක් වියට්නාම් යුද්ධය අවස්ථාවේ ක්‍රියා කළ ආකාරය තවත් නිදසුනකි.

වියට්නාම් යුද්ධය ආරම්භවීමට ආසන්න කාලයේ දී 'ඒජන්ට් කොරේජ්' නැමැති ද්‍රව්‍ය විසුරුවා හැරීම නිසා වූ විනාශය පිළිබඳ C.N.N. ගවේෂිත මාධ්‍යවේදීන් පරීක්ෂණයක් කොට ප්‍රචාරය කරනු ලැබීය. අවසානයේ මොවුන් දෙදෙනා C.N.N. ආයතනයෙන් ඉවත්කරනු ලැබීය. එහිදී C.N.N. ආයතනය දක්වූයේ හිමිකරු වන්නේ අවශ්‍යතාවන්ට විවෙක මාධ්‍ය ආයතන යටවන බවයි.

ඉතාලියේ බෙල්රූස් කෝනි නැමැති පුද්ගලයා ඉතාලි ජනතාව දනගෙන සිටියේ රූපවාහිනියේ හිමිකරුවෙකු වශයෙනි. ඔහු දේශපාලනයට ප්‍රවේශවී වසරකින් එරට අගමැතිවූවා. එය සිදු වූයේ

Scanned with CamScanner

මාධ්‍යයේ තිබෙන ප්‍රබලතාවය නිසයි. ජනමාධ්‍යයට රටක සමස්ත ජනමතයම වෙනස් කිරීමේ හැකියාව තිබේ. මාධ්‍යකරුවකු වශයෙන් පෞද්ගලික අදහස් නොදැමිය යුතුයි. නිදහස යැයි එය අයුතු ලෙසට පරිහරණය නොවිය යුතුයි.

ලෝකයේ කිසිම රටක නිදහස් මාධ්‍යයක් දක්නට නැත. මෙහි අංග දෙකක් තිබේ. එනම්

01. නිදහස් මාධ්‍ය යනු ස්වාධීන හා කාලීන වැදගත් කමක් දක්වෙන තොරතුරුයි.

02. මාධ්‍යයක් වශයෙන් පැවැතීමට ඇති නිදහස. එනම් මාධ්‍යයක් වශයෙන් ක්‍රියාත්මක වීමට ඇති නිදහසයි.

කවරාකාරයක හෝ බලපෑමෙන් පවතින මාධ්‍යයක් පැවැතීම ගැටළුවකි. එහෙමත් ලෝකේ කවර තැනක හෝ ස්වාධීන සම්පූර්ණ නිදහසක් ඇති මාධ්‍ය නොමැත. එය මාධ්‍ය ආයතනයේ දේශපාලන මතය අනුව ක්‍රියාත්මක වේ. නොඑසේනම් මාධ්‍ය අයිතිකරුවන්ගේද අවශ්‍යතාවන්ට අනුව, ඔවුන්ගේ ආකල්ප අනුව හා පාක්ෂිකත්වය අනුව ක්‍රියාත්මක වේ. මේ සඳහා නිදසුන් කිහිපයක් දැක්විය හැකිය.

ඕස්ට්‍රේලියානු ජාතික රූබට් මර්ඩොක් නැමැති පුද්ගලයා මාධ්‍යවේදියෙකුගේ පුතෙකු ලෙස ජීවිතය අරඹා අද ලෝකයේ සිටිනා මාධ්‍ය හිමිකරුවන් අතර දවැන්තයෙකි. ඔක්ස්පර්ඩ් විශ්ව-විද්‍යාලයේ ඉගෙන ගෙන විවිධ පුවත්පත් හා මාධ්‍ය පවත්වාගෙන යනු ලබයි. පුවත්පත්, රූපවාහිනී ආයතන පවත්වාගෙන යනු ලබන මේ පුද්ගලයා එම රටේ New world, ආරම්භ කළේය. පසුව "SUN TIMES" පස් මිලදී ගනු ලැබීය. වර්තමානයේ "Sky News" පත්‍රය මිලදී ගනු ලබන අතර මාධ්‍ය පිළිබඳව බලපෑමක් කළ හැකි බලගතුම පුද්ගලයා බවට පත්වී තිබේ. ටෝනි බ්ලෙයර් පවා මොහු පෞද්ගලිකව හමු වී තිබේ. ජනමතය හැසිරවීමේදී මාධ්‍යට සම්බන්ධ පුද්ගලයින් සතු බලගතු බව ඉන් පැහැදිලි වේ.

මෙබඳු සමාජ තත්වයන් දෙස බලන විට පෙනී යන කරුණ වන්නේ බලපූර්ණය පිළිබඳ ප්‍රශ්නයක් මේ තුළද අන්තර්ගත වන බවකි. මාධ්‍ය නිදහස් යන්න බටහිර රටවලින් ඇත් වී යන ස්වාභාවයක් පවතී. ඒවායේ පැවැත්ම පුද්ගලික නිදහසට බාධාවක් බව සාකච්ඡා වෙනු පෙනේ.



නූතනයේ දක්නට ඇති ප්‍රවනතාවක් වන්නේ මාධ්‍ය කරුවන් ලෙස බොහෝ පිරිස් පෙනී සිටීමයි. මරණ දන්වීම් දෙක තුනක් ලියූ පමණින් මාධ්‍යකරුවකු ලෙස සැලකීම සම්ප්‍රදයක් වි තිබේ. මාධ්‍යකරුවාගේ වගකීම, ගරුත්වය හා ස්වභාවය පිළිබඳව මතුවන සංකීර්ණ ගැටළුවකි.

මාධ්‍ය වේදියාට සමාජය කෙරෙහි වූ විශේෂ වගකීමක තිබිය යුතුයි. ආචාරධර්ම වලට අනුව ක්‍රියාත්මක විය යුතුයි කාලයට අනුව වෙනස් විය යුතු අතර කාලානුරූප, ශිෂ්ටසම්පන්න ලෙස මාධ්‍ය හැසිරවිය යුතුය. ආයතනයක් පවත්වාගෙන යාමේදී දන්වීම් අවශ්‍යයි. මූල්‍යමය පසුබිම ගැන සිතීම වරදක් නොවේ, ඒවායේ සීමාවක් තිබීම අනිවාර්ය අංගයකි. මේ පිළිබඳව කදිම නිදසුන කොකාකෝලා දන්වීම සළකා බලමු. එය ලෝකයේ පිළිගින්නා ආකාරයට දියවැඩියාවට ඉතා ප්‍රබල ලෙස බලපාන බව සොයා ගෙන ඇත. ඊට හේතුව කුඩා කල සිට පානය කිරීමයි.

මේ බව පුවත්පතක පළකළ හොත් වෙළඳ දන්වීම් නැති වෙන බව සත්‍යයකි. එහෙත් නිර්මාණයේදී මාධ්‍ය කරුවන්ට එය වසංතයන් පැවතිය හැකි අතර දන්වීම් පහත වැටීම අවමකර ගත හැකියි. මාධ්‍යකරුවාගේ දක්ෂතාවය මත බුද්ධිමත්ව කියත්මක වීමෙන් ශිෂ්ඨසම්පන්න මාධ්‍ය කලාවක් අනුව ක්‍රියාත්මක වන්නේ නම් සිවිල් සමාජයේ සක්‍රිය භාවය වෙනුවෙන් මාධ්‍ය කරුවාට ක්‍රියාත්මක විය හැකිය.

අධිනීතිඥ සුරන්ජිත් හේවාමාන්න

(දේශනයක් ඇසුරිනි)

මානව හිමිකම් පිළිබඳව වූ ජාත්‍යන්තර විශ්ව ප්‍රකාශනය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රඥප්තිය, ආර්ථික හා සමාජ අයිතිවාසිකම් ප්‍රඥප්තිය, ආදී වශයෙන් හැඳින්වෙන සම්මුතීන් වඩාත් ප්‍රායෝගික වූ සම්මුතීන් ලෙස සඳහන් කළ හැකියි. මානව හිමිකම් වල මූලික අදහස් මෙකී සම්මුතීන් වල අන්තර්ගත වේ.

මිනිසෙකු ලෙස උපත ලද සියළුම දෙනාට හිමි වූ, වෙනත් කෙනෙකුට පැවැරිය නොහැකි මෙන්ම පවරාගත නොහැකිඅයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙස හැඳින්වේ. රටවැසියා විසින් රජයට පවරා දෙනු ලබන හා පවරා දෙනු නොලබන වශයෙන් අයිතිවාසිකම් ප්‍රභේද දෙක සලකා බැලිය හැකිය. මෙයින් රජයට පවරා නොදෙන ලද අයිතිවාසිකම් අවනත වේ. රජයට පවරා නොදුන් ක්ෂේත්‍රයේ අයිතිවාසිකම් වලට රජය මැදිහත් වන විට විරුද්ධ වේ, ඒ අනුව මිනිසකු වශයෙන් උපත ලද නිසා ලබන්නා වූ පවරා දිය නොහැකි පැවැරිය නොහැකි පවත්වාගෙන යාමට රජයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙත බලය පවරා දී තිබේ. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අප විසින් පවරා නොදෙන ලද පරිච්ඡේදයක් ද අන්තර්ගත වේ.



1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය යටතේද මානව හිමිකම් මාලාව පිළිබඳව දක්වේ. මෙහි සඳහන් වන ආකාරයට මානව හිමිකම් තවකෙනෙකුට පවරා දිය නොහැකියි. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ පූර්විකාවේ සඳහන් වන්නේ රාජ්‍ය නම් ආයතනයට එරෙහිව විප්ලවීය ලෙස නැගී සිටීම වැලැක්වීම සඳහා දිය යුතු අවම අයිතිවාසිකම් කොටස මානව මානව අයිතිවාසිකම් ලෙසිනි.

# මානව හිමිකම් හා එහි නෛතික ව්‍යුහය


මානව අයිතිවාසිකම් ලෙස විග්‍රහ කෙරේ.

සිතීමේ අයිතිය අප වෙනුවෙන් වෙනත් කෙනෙකුට පැවැරිය නොහැකිය. මිනිසකු ලෙස සැලකිලි ලැබීමට අපට අයිතියක් ඇත. සැලකිලිද තව කෙනෙකුට පැවැරිය නොහැකිය. ඒ නිසා එය අපටම උරුම වූ දෙයකි. රජයට කිසියම් ක්ෂේත්‍රයක බලතල පවරා දී තිබෙන අතර එකී ක්ෂේත්‍ර තුළ රජය ක්‍රියාත්මක වේ එකී ක්ෂේත්‍රය තුළ රජය ක්‍රියාත්මක වන විට එයට අප අන්‍ය සම්පත අයිතිවාසිකම් කොටසයි.

ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට ආයතන තුනකට පවරා දී තිබේ. එනම් ජනතාව වෙනුවෙන් නීති සම්පාදනය, විධායක කටයුතු කිරීම හා අධිකරණ කටයුතු කිරීම එකී පවරා ඇති කරුණු තුනයි. දේශීය වශයෙන් සළකන විට උප්පැන්න, මරණ සහතික ලිවීම ඊ.කියාවක් ගැනීමට, සැළසුමක් අනුමත කරවා ගැනීමට ආදී වශයෙන් රජය හා පුද්ගලයා සම්බන්ධතා රාශියක් පවත්වාගෙන යයි. එකී සම්බන්ධතා

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10වැනි වගන්තියට අනුව පුරවැසියාට ඕනෑම විශ්වාසයක් දැරීමේ නිදහස පවරා දී තිබේ. 11 වන වගන්තියට අනුව කිසිදු පුද්ගලයෙකුට වධ හිංසාවට හෝ කෲරතර අමානුෂික, අවමන් සහගත සැළකිල්ලකට ලක්නොකළ යුතුයි. ඒ අනුව කෙනෙකුට පහරදීමට හෝ අමානුෂික හිංසනට ඉඩක් නොමැත. රජයට පවරා නොදුන් හිමිකම් පිළිබඳ පරිච්ඡේදයේ සඳහන් වන්නේ නීතිය උත්තරීතර වන බවයි. ඒ අනුව කුලය, ආගම, ජාතිය, වර්ගය හෝ වෙනත් භේද උපත සම්භවය, හෙවත් නිලය, නොසළකා


Scanned with CamScanner



නීතිය ඉදිරියේ සියළුම දෙනා සමානයෝය.

මානව අයිතිවාසිකම් බලාත්මක කළ හැක්කේ රාජ්‍ය නම් ආයතනයට විරුද්ධව පමණි. නිදසුනක් ලෙස යම් පුද්ගලයෙකුගේ කථාවක් රාජ්‍ය මාධ්‍යයකින් විකාශය නොකළ හොත් මානව හිමිකම් නඩුවක් පැවැරිය හැකිය. එහෙත් පෞද්ගලික මාධ්‍යකින් එය විකාශය නොකළ ද මානව හිමිකම් නඩුවක් දැමීය නොහැකිය. ඊට හේතුව මානව හිමිකම් ප්‍රායෝගික කරණය කරගත් විට එය රාජ්‍ය හා පුද්ගලයා අතර සම්බන්ධය තීරණය කරන නීතියක් වීමයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි පුද්ගලයෙකු කිසිම හේතුවක් නොදක්වා අත් අඩංගුවට ගත නොහැක. එසේ ගතහොත් එය මානව අයිතිවාසිකම් කඩවීමකි. එසේම සෑම පුද්ගලයෙකුම අධිකරණය විසින් වැරදි කරුවෙකු කරන තෙක් ඔහු නිර්දෝෂී පුද්ගලයෙකු ලෙස සැලකේ. එය මානව හිමිකමකි. එසේම සෑම පුද්ගලයෙකුම අත්අඩංගුවට ගතහොත් පැය 24 ක් ඇතුලත ආසන්නම මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කොට රැඳවුම් නියෝග ලබාගත යුතුයි. එසේ



නොකලහොත් එය මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි.

යම් ක්‍රියාවක් වරදක් ලෙස නීතිය විසින් දක්වා නොතිබෙන විට ඊට දඬුවම් දිය නොහැකිය. මේ සඳහා ලංකාවේ වැදගත් සිදුවීමක් උදහරණයක් ලෙස දැක්විය දක්විය හැකියි. සේපාල ඒකනායක ගුවන්යානයක් පැහැරගැනීමේ සිද්ධිය සලකා බලන විට එය වරදක් ලෙස ලංකා නීතියේ සඳහන්ව නොතිබිණි. එහෙත් ඔහු විසින් ගුවන් මංකොල්ලය කොට පෙරලා දිවයිනට පැමිණිය පසු ගෞරවාන්විතව පිලිගත්තද පසුව ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු අත්අඩංගුවට ගන්නා විට වරදක් කොට නොතිබිණි. එහෙත් ඔහුට විරුද්ධව නඩු විභාගයක් පැවැත්විණි. එහිදී සේපාල ඒකනායක කියා සිටියේ තමා එකී ක්‍රියාව කරන අවස්ථාවේ එය වරදක් ලෙස සඳහන් නොවිණි. මූලික අයිතිවාසිකම් පිලිබඳව සඳහන් වන ආ.ක්‍රි. ව්‍යවස්ථාවේ 13 වගන්තියට අනුව යම් කෙනෙකු ජාත්‍යන්තර ප්‍රජාව පිලිගත් නීතියක් උල්ලංඝනය කරහොත් එය රටේ නීතියක් නොවූවද වරද කල පුද්ගලයාට දඬුවම් දීම මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවේ. ජාත්‍යන්තර ගුවන් කොල්ල කෑම පිළිබඳව නීතියක් මේ වන විටත් ජාත්‍යන්තර තලයේ තිබිණි. ඒ අනුව යම් රටක් ගුවන් කොල්ලකරුට ආරක්ෂාව දුනහොත් එකී රට සමඟ තිබෙන ගුවන් සබඳතා නවත්වනු ලබයි.

14 වන වගන්තියේ තවත් සුවිශේෂ මානව අයිතිවාසිකමක් සඳහන් වේ. එය ජනමාධ්‍යයට අදල අයිතිවාසිකමකි. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සමාගමේ එක්රුස් වීමේ නිදහස වෘත්තීය සංගම් දේශපාලන පක්ෂ පිහිටුවීමට හෝ බැඳීමට හෝ ඇති නිදහස තමන් කැමති ඊකියාවක් කිරීමේ නිදහස, ආගම හෝ ලබ්ධිය ප්‍රකාශ කිරීමේ නිදහස, ලංකාවේ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහස, ලංකාව තුල යාම් ඊම් නිදහස ආදී නිදහස් හා කිසිවෙකුට පවරා දිය නොහැකි අනන්‍ය සන්තක අයිතිවාසිකම් ලෙස පිලිගැණේ. ජාත්‍යන්තර ලේඛනවල මානව හිමිකම් ඉතා පුළුල් ලෙස අර්ථ දක්වා තිබේ ලංකා නෛතික ව්‍යුහය තුළ අයිතිවාසිකම් නඩුවක් ඉදිරිපත් කල හැක්කේ ඉහතින් සඳහන් කල අයිතිවාසිකම් සම්බන්ධයෙන් පමණි. ඒවා ජාත්‍යන්තර ලේඛනවල තිබෙන මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් නඩු ඉදිරිපත් කිරීම අපහසු කරුණකි.

ජාත්‍යන්තර යුරෝපා මානව හිමිකම් අධිකරණය හෝ වෙනත් ජාත්‍යන්තර අධිකරණවල නඩු තීන්දු යොද ගෙන ලංකාවේ නීතිය ව්‍යාප්ත කල හැකියි. නමුත් ආ.ක්‍රම ව්‍යවස්ථාව ව්‍යාප්ත කිරීමට ලැබෙන්නේ ඉහත පරිච්ඡේදයේ අයිතිවාසිකම් සම්බන්ධව පෙත්සම් ඉදිරිපත් කලහොත් පමණි. එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ අතුරු වෛකල්පිත සම්මුතිය අත්පත් කළ ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන ප්‍රඥප්තියේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජාත්‍යන්තර වශයෙන් බැඳී සිටී යටත් වැසියෙකු ලෙස පුද්ගලයෙකුගේ ඉහත අයිතියක් උල්ලංඝනය කලහොත් අදල රාජ්‍යය එකී ජාත්‍යන්තර වගකීම පැහැර හැරියා සේ සැලකේ. එවිට අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයාට ජාත්‍යන්තර පර්ශදයක් ලෙස පෙත්සම් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබේ. එයින් අදහස් වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිකර්මයක් නොලැබුනොත් සිවිල් අයිතිවාසකම් ප්‍රඥප්තියේ ඇති අයිතයක් නොසලකා හැරිය පුද්ගලයෙකුට තමාගේ සහනය පතා රජයට විරුද්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය යන්නයි.

එහෙත් අධිකරණ විනිශ්චයකාවරයෙකුගේ ක්‍රියාවකට එරෙහිව හැර පරිපාලන විධායකයින්ගේ ක්‍රියාවට එරෙහිව මූලික අයිතිවාසිකම්

Scanned with CamScanner

නඩුවක් දැමිය හැකිය. පරිපාලන හා දේශපාලන වශයෙන් දෙආකාර විධායකයක් ක්‍රියාත්මක වේ. පරිපාලන ක්ෂෙත්‍රයේ ඉහළම නිළධාරියට හා දේශපාලන විධායකයේ නිළධාරීන්ට එරෙහිව තම මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ක්‍රියාත්මක විය හැකිය.

භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිවාසිකම් විවිධාකාර ස්වරූපයක් ගනු ලබයි. සවන්දීමද ඊට අදල වන අයිතිවාසිකමකි. ලංකා ඉතිහාසයේ මෑත භාගයේ ගුවන්විදුලි ශ්‍රාවකයෙකු විසින් තම අයිතිවාසිකම් සම්බන්ධව අධිකරණයේ පිහිට පැතූ අවස්ථාවක් තිබේ. අදාල පෙත්සම්කරු පවසා සිටියේ ගුවන්විදුලියෙන් ප්‍රචාරය වූ වැඩසටහන අසමින් සිටින අවස්ථාවක නොදන්වාම අත්හිටුවීමෙන් තමාගේ භාෂණයේ, ප්‍රකාශනයේ අයිතිවාසිකම උල්ලංගනය වූ බවකි.

තොරතුරු ලබා ගැනීම, ප්‍රචාරය පමණක් නොව කවි ගීත ලිවීමද භාෂණ නිදහසේ පවතින්නකි. එක් අවස්ථාවක නගරාධිපතිනියක විසින් තම පාක්ෂිකයින් සමග නගරයේ සැරිසරන විට 'යුක්තිය' පුවත්පත අලෙවි කරනු දක එකී අලෙවිකළ පුදගලයාට පහර දී පුවත්පත් ලැල්ල කඩා බිඳ දැමීය. මෙම ක්‍රියාවට එරෙහිව තම ප්‍රකාශන අයිතිය උල්ලංඝනය වූවේ යැයි පවසා යුක්තිය කර්තෘ අයිතිවාසිකම් නඩුවක් දැමීය. එහිදී අධිකරණයේ තීරණය වූයේ පුවත්පත් අලෙවිය භාෂණ නිදහසේම අංගයක් බවත්, අදල නගරාධිපතිනිය විසින් එය උල්ලංඝනය කර ඇති බවත්ය.

ලංකාවේ වැඩි වශයෙන් මානව හිමිකම් උල්ලංඝනය වන්නේත්, දුක් විඳින්නේත් වෘත්තිය නොසැළකිල්ල හේතුවෙනි. එයින්ද සමාන ලෙස නීතියේ රැකවරණ ලැබීමට ඇති අයිතිය උල්ලංඝනය වේ. මෙරට ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය වන මෙබදු සිද්ධීන් කෙරේ අවධානය යොමුවීම අල්පය. මේ ජනතාවගේ සමානාත්මකතාවය පිළිබඳව ඇති තත්වයන් මතද අයිතිවාසිකම් කාණ්ඩනය වේ. මානව හිමිකම් සියල්ලම සමාන වේ. ඒවා වර්ග කළ නොහැකි වේ.

පොලිසියේ පහරදීම්, හා පහළම ශ්‍රේණිගත නිළධරායාගේ සිට ඉහළ නිළධාරියා දක්වා පිරිස්වලින් කෙරෙන දේශපාලන බලපෑම නිසාත් මානව අයිතිවාසිකම් සූක්ෂම ලෙස උල්ලංඝනය වනු දකිය හැකියි.මෙරට ග්‍රාමීය ජනතාවට මානව හිමිකම් පිළිබඳව අවබෝධයක් නොමැති වීම නිසා ඔහුන් සෑම අවස්ථාවකම පාහේ සිය අයිතිවාසිකම් කඩකර ගනු ලබයි. තම නොදැනුවත්කම නිසාම අයිතිවාසිකම් උල්ලංඝනය වූවද එයට එරෙහිව ක්‍රියාත්මක නොවේ. එනිසා මානව හිමිකම් සංස්කෘතිය තුළ ඒවා අහිමි වීම ජනතාවගේ උරුමයක් ලෙස සැළකිය යුතු නොවේ. දේශපාලනීකරණය වීම තුළ ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වේ. අයිතිවාසිකම් ආරක්ෂා වීම පිළිබඳව මෙරට විශාල අඩුපාඩු පවතී. වෘත්තීය ක්ෂේත්‍රය මගින්, නිළධාරි වාදය ආදිය මගින් ජනතාව පීඩාවට පත්කර තිබේ.

රාජ්‍ය පරිපාලන ආයතනයක් විසින් පුවත්පත් දන්වීම් මගින් 'පෞරුෂත්වය' ආදිය සදහන් කොට අයදුම් පත් කැදවන විට මෙය වැරදි කියාවකි. එවිට එය තක්සේරු කළ නොහැකියි. එනිසා සුදුසුකම් තිබෙන පුද්ගලයෙකුට ඊට එරෙහිව නඩු කියන්නට හැකියාව තිබේ. එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් ලෙස සැළකිය හැකියි. උසස්වීමක් දෙන විට එහි ලකුණු දෙන ක්‍රමය ප්‍රසිද්ධ කළ යුතුයි එය සාධාරණ විය යුතුයි. සම්මුඛ පරීක්ෂණයකදී පෞරුෂත්වය කරුණ යෙදිය නොහැකියි. එසේ සම්මුඛ පරීක්ෂණයකදී 'පෞරුෂය' යන කරුණ වැදගත් කොට සැළකීම මානව අයිතිය පැහැදිලි උල්ලංඝනය වීමක් ලෙස සැළකේ. එසේ වර්ග කරන්නේ නම් එය අභියෝගයට ලක් කළ හැකිය.

නීතියේ දක්වා ඇති කාර්ය පටිපාටියට පිටස්තර ලෙස පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම, ගෙවල් තුළට ඇතුල් වීම පොලිසියට හෝ හමුදාවට අයිතියක් නැත. එය මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීමකි. මෙබදු සිද්ධියක් පසුගිය කාලයේදී සිදුවිය. එනම් සුසන්ත පුංචිනිලමේගේ සිද්ධියේදී ඔහු අනුර බණ්ඩාරනායක මහතාගේ නිවසේ සිටින්නේ යැයි දක්වා පොලීසිය ගෙතුලට ඇතුල් විය. එය නීතිවිරෝධී මෙන්ම සාධාරණ හේතුවක් මත සිදුවූවක් නොවුන බව අධිකරණය ප්‍රකාශ කරනු ලැබීය. මහානාම තිලකරත්න මහතා අත්අඩංගුවට ගැනීමේ සිද්ධියද මානව අයිතියක් කාණ්ඩනය කිරීමකි.

පුද්ගලයෙකු අත්අඩංගුවට ගතහොත් ඔහුට ඇප දිය යුතුය. ඇප දියහැකි වැරදි හා ඇප නොදිය හැකි වැරදි වශයෙන් ඒවා කොටස් දෙකකි.

පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්විට පැය විසිහතරක් තුළ උසාවියට ඉදිරිපත් කළ යුතුවේ. පොලීසියේ සිටිය නොහැකි බවත්, පසුදු උසාවියට එන බවත් පවසා, පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයා විසින් ලිඛිතව ඉල්ලා සිටියහොත්, ඔහු ඇප පිට නිදහස් කළ යුතුයි. ලංකාවේ පොලිසියට ගැමියා අසීමිත බියක් දක්වයි. ඒ නිසා ලංකාවේ පොලීසිය අතින් දේශීය ජනයාගේ මානව අයිතිවාසිකම් අසීමිත ලෙස උල්ලංඝනය වෙනු පෙනේ. මේ මේ අනුව විමසන විට අපට නොපෙනෙන ආකාරයට මිනිසුන්ගේ අයිතිවාසිකම් ඉතා සූක්ෂම ලෙස උල්ලංඝනය වෙන බව පැවැසිය හැකියි. නමුත් ඒවා කෙරෙහි යොමුකරනු ලබන්නේ ඉතා අඩු අවධානයකි. සමහර මානව හිමිකම් කඩවීම හෙළිදරව් වූවද බොහෝ ඒවා හෙළිදරව් නොවේ. ඒ නිසාම, විවිධ මට්ටම් වලින් ලංකාවේ මානව හිමිකම් කඩවීම දකින්නට හැකිය. ඒ නිසා ලංකාවේ මානව හිමිකම් කඩවීම වැලැක්වීමට නිසිපියවර ගත යුතුය යන්න, පැවැසීම මෙහිදී ඉතා වැදගත් වේ.

නීතිඥ ජේ.ඇම්. විජේසේකර


CPJ U
NUMBER 39 COMMITTEE TO PROTECT
Threats, Fear Follow S
*A Senior Police Officer is Implicated*

තිල හා නොතිල ආයතන ඇසුරු කරගෙන කරන රාජ්‍ය ත්‍රස්තවාදය විවිධ අන්තවාදීන්ගේ ත්‍රස්තවාදයන් ගැන කිසි ම පුද්ගලයෙක්, ආයතනයක් කතා කරන්නට ප්‍රශ්න කරන්නට අකමැතිය. නැතිනම් එඩිතර වී නැත.

පසුගිය වසර කීපය විමසීමේ දී සත්‍ය වෙනුවෙන් පෙනී සිටින්නට, කතා කතාකරන්නට ඉදිරිපත් වන මාධ්‍යවේදීන්ට එක්කෝ නිහඬව රස්සාව රැකගැනීමට සිදු විය. නැතිනම් ඒ පිළිබඳ කතා කරමින් ජීවිතය අහිමි කරගන්නට සිදු විය. සිදු වෙමින් පවතී. තවත් අය ජීවිතය රැක ගැනීම වෙනුවෙන් රැකියාව පවා අතැර පළා ගියෝය. තවත් පිරිසක් මෙරට ජීවත් වීමේ තර්ජනය දැක විදේශ වලට පලා ගියහ.

'රටේ සාමාන්‍ය ජන ජීවිතය ගිනිගත් ගිනිජාලා දෙකක් ලෙස හැඳින්විය හැකි ය. එක් දවෙන ගිනි කඳක් ආණ්ඩුව විසින්.. එහි තිල හා නොතිල අවිගත් පිරිස් විසින් මිනිසුන් පැහැරගෙන යෑම, කපා කොටා පහර දීම, මරා දැමීම හා අළු අමුවේ ගිනි ලෑම සිදු කරමින් සිටී. අනෙක් ගිනිකන්ද නිර්මාණය කර ඇත්තේ අන්තවාදීන් විසිනි. තර්ජනය කිරීම, බියවැද්දීම, පහර දීම, හා ඝාතනයයන් ද ඊට ඇතුළත්ය. තැපෑල, දුරකථනය, ලියුම් කැබලි භීෂණය හා නැති ගැන්වීම සඳහා යොදා ගැනෙමින් තිබෙනවා. මේ තත්වය තුළ ස්වාධීන නිදහස් මාධ්‍යවේදීන්ට තෝරා ගැනීමක් නැති තරම්. මේ අන්තවාද දෙක හමුවේ අපේ ප්‍රකාශන නවතා දමන්න සිදු වී තියෙනවා' එක් කුඩා විකල්ප ප්‍රකාශනයක කතුවරයෙකු ප්‍රකාශ කළේ ය.

# අවදානම සුළු නැත! ජීවිතයට වඩා?

මෙම ලිපිය මුල්වරට වර්ෂ 1991 ජනවාරි මස රුසියාවේදී සමස්ත රුසියානු පුවත්පත් කලාවේදීගේ සංගමයේ තිල ප්‍රකාශණය වන "Journalist" ට රුසියානු බසින් ලියූවකි. භීෂණය හා ශ්‍රී ලාංකික දේශපාලන තත්ත්වය අලලා 'පුරනිමල' යන ආරූඪ නාමයෙන් මෙම ලිපිය ලියවීමම එවක අප වසා පැතිර තිබූ හිංසාවේ උණුසුම දේශසීමාවෙන් ඔබ්බටද විහිද ගිය බව පසක් කරයි.

"ඇත්ත කියන්නත් බිම ඇඳගන්නත් බය වෙන්න එපා නෑ'. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව අතර මේ කියමන ප්‍රචලිත එකකි. එහෙත් මේ කියමන භාවිත කිරීම වර්තමානය වන විට සිනා උපදවන සුළු එකක් බවට පත් වෙමින් පවතී. එසේත් නැත්නම් ඒ කියමන අද භාවිතා-කරන්නෙක් එය යොදවන්නේ තමන්ගේ ආත්මාර්ථකාමී පරමාර්ථයෙන්. එය මේ ලෙස යොදවනවා යැයි සිතන්නට පෙළඹී තිබේ. ගෙවී ගිය වසර තුනක පමණ කාලයක සිට රටේ සිදුවුනු, සිදු වෙමින් පවතින දේ කම්පාවන තරම් ය.

නැඟිගන්නා සුළු අන්දකිම් ගෙන එන ජනවර්ග ගැටුම්, තරුණයන්ගේ අන්තවාදී ව්‍යාපාරයන් හා රාජ්‍ය ප්‍රචණ්ඩත්වයන් හමුවේ සිදුවන්නේ කුමක් ද? මේවාට වගකිව යුත්තෝ කවරහු ද? යන්න සොයා බලමින් කියන්නට පුළුවන් පුවත්පත් කලාවේදීන් නැති තරම් ය. රජය විවිධ

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ව්‍යූහය පිළිබඳ විශේෂයෙන් පසු ගිය දශකය අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන ප්‍රවාහයේ ව්‍යාපාරික මට්ටමේ ප්‍රකාශනවලට බාහිර ප්‍රකාශන ජාලයක් ආරම්භ වීම කැපී පෙනෙයි. කුඩා කණ්ඩායම් හා පුද්ගලයන් ගේ මැදිහත් වීම මත ඇරඹී ඇති මෙම ප්‍රකාශන පෙසු ප්‍රධාන ප්‍රකාශන වඩා විශේෂ වූ අන්තර්ගතයකින් යුක්ත ය. එම ප්‍රකාශන මගින් රටේ බහු ජාතික සමාගම්වල ආර්ථික සූරා කෑම් හා රටේ පවත්නා වූ අයුක්තීන්, අසාධාරණයන් හා විවිධ සමාජ පීඩනයන් පිටු දැකීම සඳහා උද්ඝෝෂකයන් සේ ක්‍රියා කිරීම දැකිය හැකි ය. සමකාලීන වට පිටාව ගැන විමසීමේ දී මෙම මාධ්‍යකරුවන්ගේ කාර්යය එක්තරා අවදානම් සහිත වූවක් බවට පත් වූවකි.

එක් අතකින් ආණ්ඩුවේ ත්‍රස්තවාදය වගේ ම, ශ්‍රී ලංකවේ උතුරේ ඊලාම් කොටි ව්‍යාපරය හා දකුණේ සිංහල අන්තවාදීන් ද මාධ්‍යවේදීන් නැති ගැන්වීමකට ලක් කොට තිබේ. එහි බලපෑම් පුවත්පත් කලාවේදීන්ට පමණක් නොව පුවත්පත් විදි වල අලෙවි කරන්නන්ට ද එල්ල වීම දැකිය හැකිය.

'නොලියනු. පළ නොකරනු. නොවිකුණනු, නොකියවනු, මිලදී ගන්න එපා. නැත්නම් දඬුවම මරණයයි.'

මෙවැනි තර්ජනාත්මක ඉල්ලීම් නිරන්තර ව අන්තවාදී ව්‍යාපාරයන්ගෙන් ඉදිරිපත් වෙයි.

ප්‍රකාශන පළ කරන මුද්‍රණාල වලට පහරදීම, පුවත් පත් කාර්යාල වලට ගිනි තැබීම, පුවත් පත් ගෙන යන වාහන වලට පහර දීම, ගිනි තැබීම, අලෙවි කරන ස්ථාන වලට බෝම්බ ගැසීම වැනි සිද්ධි පැතිර යමින් තිබේ. ප්‍රධාන ප්‍රවාහයේ පුවත් පත් කාර්යාලවලට පමණක් නොව එම පුවත් පත් ප්‍රවාහනය කරන වාහන වලට ද ආරක්ෂක හමුදා යොදවන්නට මේ නිසා සිදු වී තිබේ.

1990 මාර්තු මාසයේ 6 දා සාදුකාන මිනිසුන් හය (6) දෙනකු පුවත් පත්

කලාවේදී, රිචඩ් ද සොයිසාගේ නිවසට බලහත්කාරයෙන් කඩා වැදුණි. අවි දරා සිටි ඔවුන් අතරින් එක් අයෙක් පොලිස් නිලධාරී ඇඳුමින් යුක්ත විය.

ප්‍රකට පුවත්පත් කලාවේදියෙක් මෙන් ම ජාතික රූපවාහිනී සේවයේ ජනප්‍රිය නිවේදකයෙක් වූ රිචඩ් ජාත්‍යන්තර ඉන්ටර්ප්‍රෙස් ආයතනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පෙනී සිටි මාධ්‍යකරුවෙක් ද වූයේ ය. අවධියේ ඔහුගේ ප්‍රසිද්ධියට හේතු වූයේ රටේ සිදු වෙමින් පැවැති මානව අයිතීන් උල්ලංඝනය වීමේ තොරතුරු, දඩි සීමාවන් හමුවේ ජාත්‍යන්තර තලයට ගෙනගොස් එමගින් ලෝක ප්‍රජාව හරහා ජනතාවට කීමට දරණ ලද වෑයම නිසා ය.

අවි දරා ගෙන, බලහත්කාරයෙන් නිවසට කඩා වැදුණු පිරිස රිචඩ් ද සොයිසා බලහත්කාරයෙන් රැගෙන ගියේ ය. එයින් දිනකට පසු ඔහුගේ මළ සිරුර අගනුවරට නුදුරු මුහුදු වෙරළේ තිබී සොයා ගනු ලැබුවේ සාමාන්‍ය වැසියන් විසිනි. සිද්ධිය බරපතල වූයේ රිචඩ් ද සොයිසාගේ බව හඳුනාගැනීමෙන් ටික වේලාවකට පසුව ය. රජයේ නිල ප්‍රකාශන මාධ්‍ය එය මුලින් ම කටකතාවක් ලෙස ප්‍රචාරය කළේ ය.' රිචඩ් ද සොයිසා ට සිදු වූ දේ පැහැදිලියි. ආණ්ඩුව වාචික හෝ මුද්‍රිත මාධ්‍යයෙන් හෝ උත්සාහ කළේ එය දිවි නසා ගැනීමක් බවට පත් කිරීමට... 'මෙයින් පෙනෙනවා මේ රටේ මාධ්‍ය නිදහසේ ස්වභාවය කොයිතරම් ද කියලා.' පුවත්පත් කතුවරයෙක් සිද්ධිය සම්බන්ධයෙන් මා සමඟ ප්‍රකාශ කළේ ය.

'අවසාන වසරක දෙකක තුනක පමණ කාලය තුළ වාර්තා වන අන්දමට පුවත්පත් කලාවේදීන් 20 අධික ප්‍රමාණයක් අතුරුදහන් කොට නැතිනම් මරා දමා තිබෙනවා. මේ තත්වය තුළ සමහර මාධ්‍යකරුවන් විදේශ ගත වුණා ඉක්මනින් තත්ත්වය වෙනස් වී ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිෂ්ඨිත නොවුණහොත් ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩත්වයේ අනිටු විපාක ලෙස අතුරුදහන් වීමට ගොදුරු වීම, මරා දැමීම, අළු අමුවේ පරණ ටයර් දමා ගිනි තැබීම, බිය වැද්දීම, සාමාන්‍ය තත්ත්වයට පත් විය හැකි ය.' එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට විපක්ෂය යැවූ සංදේශයකට සඳහන් වී තිබුණි.

රිචඩ් ද සොයිසා රෝමය මූලස්ථානය කොට පිහිටි ඉන්ටර් ප්‍රෙස් ඒජන්සියේ කටයුතු කරමින් ආණ්ඩුවේ නිල හා නොනිල ආරක්ෂක අංශ විසින් ලංකාවේ දකුණු දිග කළ මහා ඝාතනයන් රැසක් ප්‍රකාශයට පත් කළේ ය. එමගින් ආණ්ඩුව බලහත්කාරයෙන් ජන බලය පාලනය කිරීමට දරණ වෑයම් ලෝකයට එළිදරව් කිරීමට උත්සාහ කරන ලදී. මාධ්‍යකරුවෙකුට අමතර ව කවියෙක් වූ රිචඩ් වඩාත් සමකාලීන සමාජයේ සිදු වෙමින් පැවති දේ උපහාසයෙන් පද්‍යයට නැඟුවේ ය.

මේ කවුද මොකද කරන්නේ ? 1989 ජනාධිපති ප්‍රේමදාසගේ ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපෘතිය ඇරඹුනේ මේ පාඨය සහිත පෝස්ටරයෙනි. ඔහුගේ ප්‍රතිරූපය ගොඩ නැඟීමට උපයෝගී කරගනු ලැබුවේ එමගින් ය. රිචඩ් ද සොයිසා ලියූ 'මේ කවුද මොකද කරන්නේ ?' නාට්‍ය නිෂ්පාදනයට සම්බන්ධ වූ ආණ්ඩු පක්ෂයේ ම හිතවතෙකු වූ ලක්ෂ්මන් පෙරේරා අතුරුදහන් විය. ඔහු තවම හමු වී නැත.

ප්‍රකට මාධ්‍යකරුවකු, නළුවකු, කවියකු, ප්‍රවෘත්ති නිවේදකයකු වූ සොයිසාගේ මරණය දැඩි කම්පනයක් ඇති කළේ ය. ඇමරිකාවේ මාධ්‍යකරුවන්ගේ අයිතීන් වෙනුවෙන් වූ ආරක්ෂක කමිටුවේ ප්‍රකාශනයක සඳහන් විය.

'රිචඩ් ද සොයිසාගේ මරණයට රජයේ ආරක්ෂක සේවා සම්බන්ධ වීමත් සමඟ ඔවුනු දන් නැති ගැන්වී සිටිති. විශේෂයෙන් රටේ දත් ඇති වෙමින් තිබෙන ජනමතය නිසා කෙසේ වෙතත් ඔහු ව මරා දැමීමේ ඔවුන් බව ඔවුන්ගේ ලේඛන, ප්‍රකාශ හා හැසිරීම් වලින් ම පෙනෙන්නට පටන් අරන්

මනෝරාණි සරවනමුත්තු මහත්මිය - රිචඩ් ද සොයිසාගේ අම්මා ප්‍රකාශ කළා ය. 'අපේ ගෙදරට ආපු උසස් පොලිස් හය දෙනාගෙන් එක් අයෙක් රොනී ගුණසිංහ. මම ඔහු හඳුනා ගත්තා. නමුත් ආණ්ඩුව මෙම සිද්ධියට ඇති සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කරනවා.' රිචඩ් ද සොයිසාගේ මව මේ බව අධිකරණය ඉදිරියට පැමිණ ප්‍රකාශ කළ මෙම නම් කළ පුද්ගලයන් වත් උසාවිය ඉදිරියට පත් කළේ නැත. ඔවුන්ට කිසිදු චෝදනාවක් ඉදිරිපත් නොවුණා පමණක් නොව, ඔවුනු නිදහසේ ඔවුන්ගේ කටයුතු ඉදිරියට ම කරගෙන ගියෝ ය.

මේ අතරතුර රිචඩ් සොයිසාගේ මවට ත් ඔහුගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන්ටත් නිර්නාමික ලිපි මගින් මෙම මරණය ගැන සෙවීම නවත්වන ලෙසත් එසේ නොවුනොත් මරා දමන බවටත් තර්ජනය එල්ල වෙමින් පැවතුණි. එසේ ලැබුණු එක් තර්ජනාත්මක ලිපියක මෙසේ සඳහන් වී තිබුණි.

'උඹ අඩපත්, උඹේ දරුවා ගැන අම්මා කෙනෙක් එසේ කළ යුතුයි. ඒත් කිනම් මොහොතක හෝ ඊට එහා ගියොත් ඔබත් ඔබේ මරණය වැළැද ගන්නවා ඇති ...'

ඇට නිරන්තර ව එල්ල වන තර්ජනයන් හමුවේ රිචඩ් ද සොයිසාගේ මවට පොලිස් ආරක්ෂාව සපයන්න ට ඉදිරිපත් වුවද ඇය එය ප්‍රතික්ෂේප කළා ය.

ආණ්ඩුව කවද හෝ මේ සිද්ධිය ගැන සොයා බලන බව කියනු ලැබුවත් සැකකරුවන් නම් කළත්, ඔවුන් අත් අඩංගුවට ගන්නේ නැත. 'එය මහා බොරුවක් මෙන් ම කුමන්ත්‍රණය කි.' පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂාව සඳහා වූ කමිටුවේ ප්‍රකාශනයක සඳහන් විය.

මෙම වාතාවරණය තුළ රටේ මාධ්‍යවේදීහු බියපත් වී සිටිති. සාමූහිකව ම සිද්ධියට අදාල රිචඩ් ද සොයිසාගේ සහයින් කිහිප දෙනෙකුට ම රටින් පලා යාමට සිදු වී තිබේ. මේ අතර සෙසු අය, මාධ්‍යවේදීන්, ජනතාව නම් නමින් ම වාරණයට හුරුවුණු අතර, එවැනි වාචික වාචක ජීවත් වීමට පුරුදු විය. ඔවුන් දන සිටියා ජනාධිපති ප්‍රේමදාසගේ සිත කෝපයට හෝ කම්පාවට හෝ පත් වන දේ ලිවීම නොකළ යුතු බව. ඔවුනු ඒ අනුව කටයුතු කළෝය. ඒ පිළිබඳ පොදුවේ ආකල්පයක් ද ඇති වෙමින් තිබුණි.

මේ අතර රිචඩ් ද සොයිසා වෙනුවෙන් වූ සටන, උද්ඝෝෂණ නැවතුනේ නැත. මානව අයිතීන් දිගින් දිගට ම උල්ලංඝනය වෙමින් පැවැති මේ කාලයේ එරෙහි වූ ඒ වෙනුවෙන් ජීවිතය පිදූ ඔහුගේ සේවාව අගයමින් ඔහුගේ නාමයට රෝමයේ ඉන්ටර් ප්‍රෙස් ආයතනය සම්මානයක් පුද කරනු ලැබී ය. මෙම සම්මානය එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා විසින් මහතාගේ මව වෙත ප්‍රදානය කරනු ලැබීණි.

ආචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස




මාධ්‍ය හා මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය - කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

ප්‍රකාශන අනුග්‍රහය - ජාතික ඒකාබද්ධතා වැඩසටහන් ඒකකය. (NIPU)